
# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2561 පොසොන් මස 08 වන ගුරු දින ■ 2017 ජුනි මස 08 වැනි බ්‍රහස්පතින්දා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ



# පොසොන් පොහොය අපට වැදගත් වන්නේ ඇයි?

බුදුරජාණන් වහන්සේ ලංකාවට වැඩම කරන ලද්දේ මහියංගනය, නාගදීපය, කැලණිය යන ස්ථානවලටයි. එවකට සිටි මිනිසුන් තුළ ගෝත්‍රික සිරිත් විරිත් තිබූ බැවිනුත්, නොදියුණු ජනතාවක් වූ බැවිනුත් ඔවුන් තුළ හටගත් යම් යම් ගැටුම් නිරාකරණය කර ඔවුන්ට සැනසුම ලබාදීමේ පරම, පවිත්‍ර චේතනාවෙන් බුදු හිමි එම ස්ථානවලට වැඩම කරන ලදී. එසේ වුවද එය ඒ මොහොතට පමණක් විසඳුමක් වූවා මිස අපේ රටේ ධර්මය ස්ථාපිත වීමට තරම් එය බලවත් සාධකයක් නොවීය. එය බුදු හිමිගේවත්, ධර්මයෙහිවත් වරදක් නොව එවකට සිටි ලක්වැසියන්ගේ නොදියුණු කම බව ඓතිහාසික කරුණු තුළින් සනාථ වේ.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර දෙසිය තිස්හයකට පසුව මහින්දාගමනය සිදුවන්නේ තුන්වෙනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙනි. ධර්මාශෝක රජතුමා සිද්ධ කළ ධර්ම ප්‍රචාරක වැඩ පිළිවෙළෙහි ප්‍රතිඵලයක් හැටියට ලංකාවටද ධර්මය ලැබුණු බව අවිවාදයෙන් පිළිගත යුතුව ඇත. එම ධර්මය ගෙන එන ලද්දේ පොසොන් පෝ දිනකය. දූන් දූන් එළඹෙන වර්ෂ තුළ අපි පොසොන් පෝය සමරන්නේ වෙනදාට වඩා ආඩම්බරයෙන් යුක්තවය. එයට හේතුව තිස් වසරක් පැවැති කුරිරු යුද්ධය අවසන් වී රටේ අස්සක්, මුල්ලක් නැර එම පොසොන් උත්සවය සමරන්නට හැකිවී තිබීමයි.

කෙසේ වුවද ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපට පොසොන් පොහොය වැදගත් වන්නේ ප්‍රධාන වශයෙන් ශ්‍රී සද්ධර්මය ලැබීම හේතුවෙනි. මහින්දා ගමනයට පෙර යුගය ප්‍රාග් මහින්ද යුගයයි. එම යුගය තුළ දක්නට ලැබෙන්නේ අන්ධ විශ්වාසයෙන් ස්වභාවික වස්තූන් සරණ යෑමකුයි. විශාල ගසක්, ගලක්, පර්වතයක් දුටු කල එයින් අන්ධ වී අන්ධ භක්තියෙන් වැඳුම් පිදුම් කරන ලදී. එක් පැත්තකින් බලන කල එම යුගය තුළ බියක්, සැකක් තිබූ බවටද කරුණු පැහැදිලි වේ. ඉර හඳ පවා වන්දනා කර ඇති බවක් දක්නට ලැබේ. එයට හේතුව ඒ තුළ අදෘශ්‍යමාන බලවේගයක් නැත්නම් දෙවි කෙනකු අරක් ගෙන ඇති බවත්, ඔවුනට පුද පූජා නොකිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවත් සිතීමය.

මේ බව දුටු මිහිඳු මහ රහතන් වහන්සේ එය වෙනස් නොකර බෞද්ධාගමානුකූලව අර්ථාන්විත වැඳුම් පිදුම් ක්‍රමයක් හඳුන්වා දුන්හ. ගිනි පූජාව වෙනුවට පහන් පූජාවද, වෘක්ෂ වන්දනාව වෙනුවට බෝධි වන්දනාවද, ගස්, වැල්, පර්වත වන්දනා වෙනුවට බුදුධ ප්‍රතිමා, වෙහෙර විහාර නැමදීම හා වැඳීම ආදී වශයෙන් පූජා ක්‍රමද හඳුන්වා දීමෙන් ලක්වැසි ජනතාව තුණුරුවන්ට ගරු කරන ශ්‍රද්ධා ගෞරවය ඇති බුද්ධිමත් පිරිසක් බවට පත්වූහ. මෙම විපර්යාසය ලක්දිව සිද්ධ වූ වටිනාම ක්‍රියාදාමය ලෙස හැඳින්වීමට පුළුවන. පොසොන් පෝය අපට වැදගත් වන්නේ ලක්වැසියා තුළ ඇතිවූ මෙම චිත්ත විපර්යාසයත්, චර්යාමය වෙනසත් නිසා බව අවිවාදයෙන් පිළිගත යුතුය. නමුදු ප්‍රධාන කරුණට වඩා තව බොහෝ අතුරු ප්‍රතිඵල අපේ ලක්දිව සිදුවූ බව හැඳින්විය හැකිය.

රටේ රජතුමා වූ දෙවන පෑතිස් රජතුමා ධර්මය වැළඳ ගැනීමත් සමගම මුළු ලක්වැසියාම ක්‍රම ක්‍රමයෙන් තුණුරුවන් සරණ ගිය පිරිසක් බවට පත්වූහ. මිහිඳු මහ රහතන් වහන්සේ උපක්‍රමශීලීව රටේ නායකයා පළමුව තුණුරුවන් සරණ ගිය බෞද්ධයකු කිරීම රටේ සාමාන්‍ය ජනතාවගේ නැඹුරුවට රුකුලක් වූවාට කිසිදු සැකයක් නැත. රජතුමාද ඉතාමත් බුද්ධිමත් කෙනකු විය. ඒ බව අඹ ප්‍රශ්නයෙන් හා නෑ ප්‍රශ්නයෙන් ස්ඵුට විය. ධර්මය වැළඳ ගත් රටේ නායකයා ප්‍රමුඛ රටවැසියා මිහිඳු මහ රහතන් වහන්සේගේ මග පෙන්වීම යටතේ ආගම ධර්මයට අනුව වැඩ කරන්නට පටන් ගත්හ.

මිහිඳු මහ රහතන් වහන්සේ පැමිණීම හේතුවෙන් තවත් වැදගත්ම ප්‍රතිඵලයක් ලෙස සංඝමිත්තා රහත් භික්ෂුණීන් වහන්සේ හා දහඅට කුලයක ශිල්පීන් පැමිණීමද පොසොන් පෝ දිනය තුළ මතක් කළ යුතු හා අගය කළ යුතු තවත් වැදගත් කරුණකි. සංඝමිත්තා ලංකා ගමනයේදී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව රැගෙන ඒම වැදගත්ම කරුණ ලෙස සැලකිය හැකිය. මේ කරුණු සමුදායම අගය කරමින් පොසොන් පෝ දිනය අපට සැමරීමට නැත්නම් අනුස්මරණය කිරීමට පුළුවන.

ලක්දිවට බුද්ධාගම ලැබීමත් සමගම සියලු අංශයන්හි දියුණුවක් ඇතිවිය. සංස්කෘතික, දේශපාලනික, ආර්ථික ආදී සෑම අංශයකම දියුණුවක්, අභිවෘද්ධියක් ඇතිවීම තුළ මුළු ලෝකයටම හොඳම බෞද්ධ මධ්‍යස්ථානයක් වීමට ලක්දිවට හැකිවිය.

මහ කලු ගල්වලට ජීවය දීමට තරම් කලාකරුවා උත්සුක වූයේ මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් බව කීම අතිශෝක්තියක් නොවේ. අනුරාධපුරය නම්වූ ඒ පූජනීය නගරය තුළ ඉදිවූ පූජා නිර්මාණ මිහිඳු හිමිගේ මග පෙන්වීමෙන් පසු දුටුගැමුණු රජතුමා ප්‍රමුඛ රාජ රාජ මහා මාත්‍යාදීන් ඉදිකළ ඒවායි. ඊට පසු නොයෙක් රජවරුන් බෞද්ධාගමට අනුව රට පාලනය කරමින් අනාගතය තුළ බිහිවන අයට ඒවා දූක බලා ගැනීමට හා වන්දනාමාන කිරීමට අවශ්‍ය පූජනීය වස්තූන් නිර්මාණය කළහ. රුවන්වැලි මහා සෑය, මිරිසවැටිය, අභයගිරිය, ලෝවාමහාපාය, සමාධි පිළිමය ආදී ලොව මවිත කරවන නිර්මාණ කිරීම තුළින් ලෝකයාගේම වන්දනාමානයට අපේ රට පත්විය. අවුකන පිළිමය, පොළොන්නරු, ගල් විහාර පිළිම ආදිය තුළින්ද කරුණා ගුණය ඉස්මතු වන්නේය.


මේ ආදී වශයෙන් තුණුරුවන් සරණ ගිය පිරිසක් බිහිවී තුණුරුවන් ගුණ ඉස්මතු වන නොයෙක් නිර්මාණ ලක්දිව ඉදි කළහ. අද පවා ඒ බෞද්ධ කලා නිර්මාණ දූක බලා ගැනීමට ඉතිරිව ඇත. ඒ ප්‍රෞඪත්වය වෙන කිසිදු රටක නොමැති තරම් අද්විතීය එකකි.

**පූජ්‍ය ගලගෙදර රතනවංශ හිමි**

''මේ ලෝකයේ කවරදුවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්.''

# බුදු දහම

## ජීවිතය කලකිරවන දහමක් නොවේ





බෞද්ධයන් අතර සිල් සමාදන් වන, භාවනා කරන, දානමය පින්කම්වල නිරත වන මෙන්ම එවැනි පුණ්‍යකර්ම සඳහා කැපවී කටයුතු කරන අය, උදව් කරන අය සිටිති. ඇතැම් අය මෙවැනි පුද්ගලයන්ගෙන් ''දැන් ඔය වගේ දේවල් කරන්නේ සසර කලකිරිලද? ජීවිතය එපා වෙලාද?'' ආදී වශයෙන් විමසන අවස්ථා තිබේ.

එසේ විමසන්නේද බෞද්ධ අයමය. එයින් පැහැදිලි වන්නේ අන් කිසිවක් නොවේ. එවැනි අය බුදු දහම යනු ලෝකය කලකිරවන, ජීවිතය එපා කරවන දහමක් ලෙස දකින බවයි. බොහෝ දෙනකු බුදු දහමින් දුරස් වීමට හේතුවද ඔවුන් තුළ ඇති මෙම වැරදි ආකල්පය බව පැවැසීම සාවද්‍ය නොවේ.

සතුට, සැනසුම, ජයග්‍රහණය, දියුණුව ආදී දේ සොයාගෙන විවිධ මාවත් ඔස්සේ ගමන් කරන අය අප සමාජයේ බහුලය. ඒවාද නිවැරදි මාවත් නොවන අතර ඒ හරහා සිදුවන්නේද තවත් කරදර රැසක පැටලීමකි. තම අපේක්ෂාවන් ඉටු වුවද එය ඉතා තාවකාලික වේ.

ඇත්තෙන්ම බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ ඉතාම සුන්දර දහමක් බව බෞද්ධයන් මනා සේ අවබෝධ කරගත යුතුය.

තම ජීවිතයට ආශා කිරීම, ආදරය කිරීම මෙලොව සිටින කාටත් පොදු ගුණාංගයකි.

ඒ බව බුද්ධ දේශනාවේද සඳහන් වේ.

**''සබ්බේ සං ජීවිතං පියං''**

ඉහත සඳහන් කළ පරිදි විවිධ අපේක්ෂාවන් ඉටුකර ගැනීමට උත්සාහ කරන්නේද තම ජීවිතයට ඇති ආශාව, ආදරය නිසාමය.

බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ ජීවිතය රැක ගැනීම පිළිබඳව විනා කලකිරීම පිළිබඳව නොවන බව බෞද්ධයන් විසින් අවධාරණය කරගැනීම ඉතාම වැදගත්ය.

දුක හා සතුට පිළිබඳව මදකට සිතා බලමු.

ඕනෑම අයකු සතුටු වන්නේ බලාපොරොත්තු ඉටුවන විටය. නැතහොත් තමන්ට අවශ්‍ය කැමැති ලෙස කටයුතු සිදුවන විටය. දුක් වන්නේ එසේ නොවන විටය.

බුදුරජාණන් වහන්සේ දේශනා කළේ නොසිතූ දෙය සිදුවීම/සිතන දේ සිදු නොවීම ලෝක ස්වභාවය බවයි.

**''අචින්ති කම්පි භවතී - චින්ති කම්පි විනස්සතී''**

සත්‍යය වන්නේ මනුෂ්‍යයන්ට වැඩි වශයෙන්ම සතුටට වඩා දුක් අත් විඳීමට සිදුවන බව පැවැසීමය.



''යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ.''



ඊට හේතුව ඉහත සඳහන් කළ ආකාරයට, ලෝක ස්වභාවයට අනුව සිතීමට අකමැති වීමයි.

ඇත්තෙන්ම කළ යුතු වන්නේ ඒ දුක සතුටක් බවට පත්කර ගැනීමට කටයුතු කිරීමයි.

සිදුහත් ගෞතම බෝධිසත්වයන් වහන්සේ සතර පෙර නිමිත් දැකීමෙන් ජීවිතයේ ඇති දුක් සහිත බව අවබෝධ කරගත් බව අපි දනිමු. අනතුරුව උන්වහන්සේ වෙහෙස වූයේ එම ජීවිතය සැපවත් කිරීමේ මාර්ගය සෙවීමටය. උන්වහන්සේගේ උත්සාහය සාර්ථක විය.

- **දුක්ඛ ආර්ය සත්‍යය**
  (ලෝකයේ දුකක් කියලා දෙයක් තියෙනවා කියන එක.)
- **දුක්ඛ සමුදය ආර්ය සත්‍යය**
  (ඒ දුක හටගන්නා ආකාරය පිළිබඳ ඇත්ත.)
- **දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය**
  (ඒ දුක නැති කිරීමට හැකිය කියන ඇත්ත.)
- **දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය**
  (ඒ දුක නැති කිරීමේ නිවැරදි ක්‍රමවේදය නම් වූ ඇත්ත.)

මේ චතුරාර්ය සත්‍යය නමැති උතුම් දර්ශනය වටහාගෙන ලෝකයාට පහදා දුන්නේ කලකිරීමෙන්, හඬා වැළපීමෙන් පිරුණු ජීවිතවලට සැනසීම, සහනය ලබා ගැනීමට මිස තව තවත් කලකිරවීමට නොවේ.

පහත උදාහරණ පිළිබඳව මදකට අවධානය යොමු කරන්න.

රාත්‍රී 7 සිට පසුදින අළුයම 4 දක්වා විදුලිය විසන්ධි වන බව දැනුම් දුන්නේ යයි සිතන්න. එය ඇසුණු විට එම අවස්ථාවට මුහුණ දීම සඳහා ඉටිපන්දම්, පහන්, තෙල්, ගිනිපෙට්ටි ආදිය සූදානම් කරගනිමින් මෙන්ම විදුලිය උපයෝගී කරගෙන කරන වැඩ කටයුතු රාත්‍රී 7 ට පෙර අවසාන කරගැනීමට එක් පිරිසක් සැලසුම් කරමින් සිටියහ.

තවත් පිරිසක් කළේ අදාළ ආයතනයට හා පාලකයන්ට දොස් පවරමින් තම වැඩ කටයුතු සියල්ල අතපසු වන බව පවසමින් කාලය ගත කිරීමය.

විදුලිය විසන්ධි වීමෙන් පසු මෙම දෙපිරිසම පත්වන තත්ත්වයන් අතර වෙනස කෙබඳු විය හැකිද?

ඒ ආකාරයටම ''**ජීවිතං අනියතං - මරණං නියතං**'' යනුවෙන් බුදු දහම අපට පහදා දෙන්නේ මේ ජීවිතයේ යථාර්ථයයි. එය අවබෝධ කරගත් පුද්ගලයා ඉහත උපමාවේ විදුලිය අත්හිටුවන බව දැනගෙන කල්වේලා ඇතිව ඊට සූදානම් වන අය මෙන් මෙම ජීවිතය අනතුරට පත්වීමට, දුකට, වේදනාවට ගොදුරු වීමට නොදී සුරක්ෂිත කරගැනීම පිණිස කටයුතු කරන අතර බුදු දහම හරහා ඒ සඳහා නිවැරදි මාවත ඔස්සේ ගමන් කිරීමද සිදුකරනු ඇත.

ලෝකයේ සැබෑ තත්ත්වය මැනවින් පහදා දෙන බුදු දහම අනුබල දෙන්නේ ජීවිතය පිළිබඳව කලකිරීමට නොවේ. කලකිරුණු මනස යනු රෝගී, ව්‍යාකූල, කැළඹුණු මනසකි. එවැනි මනසකට සසර කෙටි කරගැනීම ඉතා අපහසුය.

එමනිසා බුදු දහමට සමීප වී බුදු දහමේ ඇති වටිනා කරුණු ජීවිතයට එකතු කරගැනීමට උත්සාහ කරන්න.

පරාභව සූත්‍රයේ ඉගැන්වෙන ජීවිතය පිරිහීමට කරුණු, මංගල සූත්‍රයෙන් ඉගැන්වෙන ජීවිතයට එකතු කර ගත යුතු උතුම් ගුණාංග, සිඟාලෝවාද සූත්‍රයේ ඉගැන්වෙන සමාජ සම්බන්ධතා වඩාත් හොඳින් ගොඩනගා ගැනීමට කළ යුතු දේ ආදිය කෙරෙහි අවධානය යොමු කරන්න.


ප්‍රශ්න, ගැටලු, පීඩා නිසා හෙම්බත් වී කලකිරීමෙන් ගත කරන ඔබගේ ජීවිතවලට සැනසිල්ල, සතුට ළඟා කර ගැනීමට අපහසු වන්නේ නැත. මෙතෙක් දවසක් ඔබ සෙවූ සතුට ඔබගේ ජීවිතවලට ලැබෙනු නිසැකය.

**ජලදිනී සේනානායක**

''පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.''

# ඔබ දොහොත් මුදුන් දී වඳින මිහින්තලා පුදබිමේ

## ඓතිහාසික තොරතුරුයි මේ



'බුදු දහම ලක්දිවට බෙදා හල ස්ථානය මිහින්තලාවයි.'

මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු ධර්මදූත පිරිස ක්‍රි.පූ. 3 වන සියවසේදී පොසොන් පොහෝ දිනක ලංකාවට වැඩම කොට ඇත. මේ ධර්මදූත පිරිසට එවකට ලංකාවේ රජතුමා වූ දේවානම් පියතිස්ස රජතුමා හමුවී ඇත්තේ මිහින්තලේ (මිස්සක පව්ව) දීය. අනුරාධපුරයට නැගෙනහිර පැත්තේ සැතපුම් අටක් පමණ දුරින් පිහිටි මිහින්තලය කඳු ගැටයක් සහිත කඳු වැටියක පිහිටි කඳු ගැටයකි. මෙයට මිස්සක පව්ව, චේතිය ගිරිය, සෑගිරිය කියාද කියනු ලැබේ. වඩාත් ප්‍රසිද්ධ නාමය මිහින්තලයය. පුරාණ කාලයේ සිටම පඩි පෙළවල් එයටම නැගීමට සාදා ඇත. දේවානම් පියතිස්ස රජතුමා මෙහි විහාරයක් හා ලෙන් 68 ක් කරවූ බවද සඳහන් වේ.

මිහින්තලේ පර්වතයකි. එහි මුදුන ගලින් යුක්තය. මිහින්තලේදී රජු හා මිහිඳු හිමි හමුවී දෙදෙනා අතර ප්‍රශ්නෝත්තර මාලාවක් ස්වරූපයෙන් සංවාදයක් ඇති විය. එම සංවාදය බෞද්ධයන් අතර ප්‍රකටය.

රජතුමා ඇතුළු පිරිසට මිහින්තලා මුදුනේදී පළමුවැනි ධර්ම දේශනාව වන චුල්ල හත්ථි පදෝපම සූත්‍රය දේශනා කරන ලදී. මෙම ධර්ම දේශනයෙන් කියවෙන්නේ කෙනෙකු බුදු සමය පිළිගෙන භික්ෂුවක වී සිල්වත් දිවියක් ගතකොට පියවරෙන් පියවර තම අධ්‍යාත්මය දියුණු කර ගනිමින් බුද්ධ ධර්මයෙහි එන අග්‍ර ඵලය වන නිවන සාක්ෂාත් කරගන්නා ආකාරයය.

මිහිඳු හිමි මෙදිනම සවස පිරිස බලා සිටියදීම භණ්ඩුක උපාසකතුමා මිහින්තලයේදීම මහණ උපසම්පදාව කරන ලදී. එසේම මසකින් පමණ පසු මිහිඳු හිමි ඇතුළු පිරිස වස් වැසීමටද මිහින්තලයම තෝරාගන්නා ලදී. මිහින්තලේ ගල් ගුහා ඒ සඳහා භාවිත කොට ඇත.

මිහිඳු මහ රහතන් වහන්සේ අපවත් වන තෙක්ම මිහින්තලේ වාසය කරන්නට ඇත. උන්වහන්සේ ක්‍රි.පූ. 200 දී උත්තිය රජු දවස චේතියගිරිය හෙවත් මිහින්තලේදී වස් වසමින් සිටියදී අපවත් වූහ.

බුදු සසුන ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් මිහින්තලය කාගේත් ගෞරවාදරයට පාත්‍ර විය. මෙම සිදුවීම සිහිකිරීම් වස් වසරක් පාසා පොසොන් උත්සවය පවත්වනු ලැබේ. මෙවරද ප්‍රධාන පොසොන් උත්සවය මිහින්තලේ පවත්වනු ලැබේ.

මිහින්තලේ කණ්ඨක චේතිය හෙවත් චෛත්‍යයක්ද ඇත. මෙහි නටඹුන් අදද දැකිය හැකිය. එහි වාහල්කඩ දර්ශනීයය. මෙහි හතර දිසාවේම වාහල්කඩ 4 ක් ඇත. අද ඉතිරි වී ඇති හොඳම වාහල්කඩ මෙයය. මිහින්තලේ අද විශාල චෛත්‍යයක්ද ගොඩනගා ඇත.

සිරිලක් බොදු ඉතිහාසයේ උසස්ම තැනක් හෙබවූයේ මිහින්තලා පව්වය. ලක්දිව බුදු සසුන පිහිටුවීමේ මධ්‍යස්ථානය වූයේ මිහින්තලාවය. මුල්ම අද්විතීය පරම පූජනීය ස්ථානය වූයේද මිහින්තලාවය. මිහින්තලය අඩි එක්දහස් අසූ නවයක් පමණ උස කුඩා කඳු ගැටයකි.

පාහියන් හිමි ලංකාවට වැඩි කාලයේ මිහින්තලේ භික්ෂූන් දෙදහසක් පමණ සිටි බව සඳහන් කර ඇත. එහි ගල්ලෙන් හැට අටක් දෙවන පෑතිස් රජතුමා විසින් මිහිඳු හිමි ඇතුළු පිරිසට පූජා කර ඇත.

මිහින්තලේ චෛත්‍ය ගණනාවක්ම ඇති නිසා එයට චේතිය ගිර කියාද කියනු ලැබේ. මෙහි අම්බස්තල දාගැබ, කණ්ඨක චෛත්‍යය, ආරෝග්‍ය ශාලාව, දාන ශාලාව, මිහිඳු ගුහාව, මහාථූපය, ආරාධනා ගල, නාග පොකුණ, කළුදිය පොකුණද ඇත.

මිහින්තලා කන්ද නැගීමට පෙර තැනිතලාවේ මෙම ආරෝග්‍ය ශාලාව පිහිටා තිබී ඇත. කලු ගලින් සාදන ලද බෙහෙත් ඔරුවක්, ගල් සන්නසක්, පැරණි මැටි බඳුන්ද එහි තිබී හමුවී ඇත.

ආරෝග්‍ය ශාලාවත්, පඩි පෙළත් අතර පැරණි ආරාමයක් තිබී ඇත. එහි දිග අඩි 125 කි.

කඳු මුදුනට නැගීමට පඩි පෙළ ඇත්තේ නැගෙනහිර බෑවුම ඔස්සේය. ඉතා පුළුල්ව ඉඩකඩ සහිතව ඉදිකර ඇති මෙහි ගල් පඩි 1840 ක් ඇත. පඩි පෙළ කොටස් 4 කින් යුක්තය.

මෙහි ඇති කණ්ඨක චෛත්‍යය සූරතිස්ස රජතුමා විසින් සාදන ලද්දකි. මෙහි පේසාවළලු සහ වාහල්කඩ පැරණි තත්ත්වයෙන්ම තවමත් ආරක්ෂා වී ඇත. වාමන රූප, ඇත් රූප ආදියෙන් වාහල්කඩ හා මල් ආසන, චෛත්‍යය හතර පැත්තේම තිබේ.

තුන්වන පියගැට පෙළ අවසානයේ පිහිටි මලුවෙහි වම් පැත්තේ එකල පැවැති දාන ශාලාව වෙයි. මිහින්තලා සෙල් ලිපි දෙකද ඒ අසල ඇත. හතරවන මිහිඳු රජු විසින් එම සෙල් ලිපි පිහිටුවා ඇත. ඒ අසලම සන්නිපාත ශාලාව වේ. එය භික්ෂූන් රැස්වී ධර්ම විනය පිළිබඳ සාකච්ඡා පැවැත්වූ ස්ථානයකි.

අම්බස්තල දාගැබ අසලින් පහළට ගමන් කළ විට මිහිඳු ගුහාව හමුවේ. මිහිඳු හිමි වාසය කළා යැයි විශ්වාස කරන ගල් ගුහාව එය වේ. එහි යටිගල ආසනයක් මෙන් ඔප මට්ටම් කර සකසා ඇත.

මිහින්තලේ මහාථූපය යනුවෙන් හඳුන්වන විශාල දාගැබ සිතේ බුදු බැතිය උපදවයි. කඳු මුදුනක පිහිටි මෙය මහාදාඨික මහානාග රජු විසින් කරවන ලද්දකි. ගරා වැටී තිබී අළුතින් සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කර ඇත. පතුලේ විෂ්කම්භය අඩි 136 කි. අනුරාධපුර අටමස්ථානය වඳින්නට එන සැදැහැවතුන් මිහින්තලය පුද බිමට ඒමටද අමතක නොකරති.

මහසෑයට ඉදිරියෙන් ඇති කඳු මුදුනක ආරාධනා ගල ඇත. එයට නැගීමට යකඩ වැටක් සාදා ඇත. තද සුළං පැවතුණත් මෙය නැගීමට බොහෝ දෙනා ප්‍රිය කරති.

මිහින්තලේ නාග පොකුණක් ඇත. පොකුණ පසුබිමේ පෙණය විහිදුවා ගත් නාග රූප නෙළා ඇති නිසා එම පොකුණට නාග පොකුණ කියා කියනු ලැබේ.

කළුදිය පොකුණද මිහින්තලේ ඇත. එහි දිය කළු නිසා ඒ නම යෙදී ඇතැයි සිතිය හැක.

ඔබත් මිහින්තලේ පුද බිමේ අසිරිය දකින්නට මෙම පින්බිම වෙත පැමිණිය යුතුමය.



**එස්.කේ. ජයවර්ධන**

'අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය.''



# නිවනට යනවා නම් මේ කියන කෙලෙස් 7 නවතාලිය යුතුමයි

මජ්ඣිම නිකායේ සබ්බාසව සංවර පරියාය කියලා සූත්‍රයක් තියෙනවා. මේ සූත්‍රය බුදුරජාණන් වහන්සේ දේශනා කළේ සැවැත්නුවර ජේතවනාරාමයේදීයි.

මෙහිදී පෘථග්ජනයා තුළ පවතිනා ආශ්‍රව හෙවත් කෙලෙස් ඉවත් කරන ක්‍රම හතක් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා. මොනවද ඒ?

1. දස්සනා පහාතබ්බා - දැක්මෙන් හෙවත් දැකීමෙන් ඉවත් කළ යුතු කෙලෙස්.
2. සංවරා පහාතබ්බා - සංවර වීමෙන් ඉවත් කළ යුතු කෙලෙස්.
3. පටිසේවනා පහාතබ්බා - භාවිත කරන වේලාවට නුවණින් සලකා ඉවත් කළ යුතු කෙලෙස්.
4. අධිවාසනා පහාතබ්බා - වීර්යයෙන්, ඉවසීමෙන් නැති කළ යුතු කෙලෙස්.
5. පරිවජ්ජනා පහාතබ්බා - නුවණින් යුතුව මගහැර යාමෙන් නැති කළ යුතු කෙලෙස්.
6. විනෝදනා පහාතබ්බා - නුවණ භාවිත කරමින් දුරු කළ යුතු කෙලෙස්.
7. භාවනා පහාතබ්බා - සමථ විදර්ශනා භාවනාවෙන් ඉවත් කළ යුතු කෙලෙස්.

මෙහි පළමුවෙනි කාරණය තමයි 'දස්සනා පහාතබ්බා' හෙවත් දැකීමෙන් ප්‍රහානය කළ යුතු කෙලෙස්.

දැන් අපි මේ කාරණය එකින් එක විනිවිද යන්නට ඕනේ. ගැඹුරින් ගැඹුරට ගමන් කරන්නට ඕනේ. එහෙම කරන අයට නිවනට යන මාර්ගය හමුවෙනවා. වචන කීපයකට සීමාවෙලා මෙය කරන්නට බෑ.

යම් කෙනෙක් ආර්ය මාර්ගයට පත්වීමට නම්, ආර්ය මාර්ගය සම්පූර්ණ වෙන්න නම්, 'අරියානා දස්සාවී' ආර්යයන් වහන්සේ නමක් හමුවිය යුතුයි යනුවෙන් බුද්ධ දේශනයේ සඳහන් වෙනවා. එහෙනම් මේක ඉබේම කරන්නට හැකි දෙයක් නෙවෙයි. ආර්යයන් වහන්සේ කියන්නේ කවුද? එතැනදී 'අරිය' සහ 'රිය' කියන දෙපැත්තම අපි බලන්නට ඕනේ.

රිය කියන්නේ අස්‍රුතවත් පෘථග්ජනයාටයි. අරිය කියන්නේ කෙලෙස් ප්‍රහීන කළ මාර්ග ඵල ලාභියාටයි.

පෘථග්ජනයා වැඩ කරන්නේ රාග, ද්වේෂ, මෝහ යන 'සං' වලින් විකෘති වූ විඤ්ඤාණයෙන්. ඔහු ආර්ය නෑ හෙවත් අනාර්යයි.

සං' වර කරපු 'සං' මා කරපු 'සං' සුන් කරපු කෙනා ප්‍රකෘති ඥානයේ, ප්‍රඥාවේ සිටින කෙනෙක්... එයා ඉන්නේ යෝනිසෝ මනසිකාරයෙන්.

පෘථග්ජනයා ඉන්නේ අයෝනිසෝ මනසිකාරයෙන්. යෝනිසෝ මනසිකාරයෙන් කටයුතු කරන ආර්යයන් වහන්සේ නමක් හමුවී උන්වහන්සේ දේශනා කරන ධර්මය අහලා අවබෝධ කරගන්නට දක්ෂයෙක් වෙන්නට ඕනේ...

'අරිය ධම්මේ කෝවිදෝ' කියන්නේ මේකයි. එහෙම කරන්නට කුසල් උපදවාගෙන රාග, ද්වේෂ, මෝහ ප්‍රහීණ කරන අවස්ථාවේ සිටිය යුතුයි.

දැන් යෝනිසෝ මනසිකාරය කියන්නේ කුමක්ද? එනම් සම්මා දිට්ඨිය, අවදි වූ මනස, හේතුඵල දහම දැකිය හැකි තැනයි.

'යෝ පටිච්ච සමුප්පාදං පස්සති
සෝ ධම්මං පස්සති
සෝ මං පස්සති
සෝ මං පස්සති.'

යමෙක් පටිච්ච සමුප්පාදය දකිනවා නම් ඔහුට ධර්මය දැකිය හැකියි. ධර්මය දකින්නා චතුරාර්ය සත්‍යය අවබෝධය ලබන කෙනෙක්. මේ කියන චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්නා කෙනායි යෝනිසෝ මනසිකාරයට පත්වෙන්නේ. ඔහු ශ්‍රැතවත් ශ්‍රාවකයෙක්.

"මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?"



'අරිය ධම්මේ සුවිනීතෝ' ආර්ය ධර්මයේ හික්මුණු කෙනෙක්. අයෝනිසෝ මනසිකාරයේ යුතු පෘථග්ජන අයට ආර්යයන් වහන්සේලා දකින හැකියාවක් නෑ. හැබැයි දැක්කා කියලා බොරුවට කියන්න පුළුවන්. ඔහුට ආර්ය ධර්මයේ දක්ෂයෙක් වෙන්න බෑ. ආර්ය ධර්මයේ හික්මෙන්නටත් බෑ.

'මනසි කරණීය ධම්මේ නප්පජානාති'. සිහි කළ යුතු ධර්මය කුමක්දැයි ඔහු දන්නේ නැහැ.

'අමනසිකරණීය ධම්මේ නප්පජානාති' සිහි නොකළ යුතු ධර්මය දන්නෙත් නැහැ. සිහි කළ යුතු වූද, සිහි නොකළ යුතු වූද ධර්මය දකින්නේ යෝනිසෝ මනසිකාරයට පත් තැනැත්තායි.

අයෝනිසෝ මනසිකාරයෙන් යුතු පෘථග්ජනයා 'සං' වලට (රාග, ද්වේශ, මෝහයට) යටත් වෙලා. ඔහු නූපන් කාමාශ්‍රව උපදිනවා. (අනුප්පන්නෝවා කාමාසවෝ උප්පජ්ජති.)

ඒ වගේම උපන් කාම ආශ්‍රව තව තවත් වැඩෙනවා. (උප්පන්නෝවා කාමාසවෝ පවඩ්ඪති.)

ඊළඟට නූපන් භව ආශ්‍රව උපදිනවා. (අනුප්පන්නෝවා භවාසවෝ උප්පජ්ජති).

උපන් භව ආශ්‍රව තව තවත් වැඩෙනවා. (උප්පන්නෝවා භවාසවෝ පවඩ්ඪති.)

නූපන් අවිද්‍යා කෙලෙස් උපදිනවා. (අනුප්පන්නෝවා අවිජ්ජාසවෝ උප්පජ්ජති.)

උපන් අවිද්‍යා ආශ්‍රව වැඩෙනවා. (උප්පන්නෝවා අවිජ්ජාසවෝ පවඩ්ඪති.)

දැන් මොහුට මොකද වෙන්නේ? සසරින් ගැළවීමක් නෑ. යෝනිසෝ මනසිකාරයට පත් ආර්ය පුද්ගලයා ගමන් කරන්නේ මෙහි ප්‍රතිවිරුද්ධ අතටයි.

දැන් පේනවා නේද 'සං' 'විසං' වල වෙනස. අවිද්‍යා ආශ්‍රව, භව ආශ්‍රව, කාම ආශ්‍රව, පංච ඉන්ද්‍රියයන් පිනවන කෙනාට හේතු ඵලය පේන්නේ නෑ. අනිත්‍ය, වර්තමානය," අනාගතය ගැන ඔහු ඉන්නේ සැකයක. අතීතය ගැන හෙතෙම දුක්වෙනවා. මගේ අතීතය මේ වගෙයි, මට අද මෙහෙම වුණේ අතීතයේ මෙහෙම සිටි නිසාය.

හෙතෙම අතීතය ගැන වගේම වර්තමානය, අනාගතය ගැනත් දුක් වෙනවා. ඔහුට අතීත, වර්තමාන, අනාගත යන කාලත්‍රය ගැනම තියෙන්නේ වේගයක්, දුකක්, තාපයක්, වේදනාවක්. හිතලා බලන්න, ඔබටත් එහෙමයි නේද? ඇයි එතනට ඔබ වැටුණේ?

නිත්‍ය, සුඛ, අත්ථ වශයෙන් සියලු දේ සැලකූ නිසා. සියල්ල නිත්‍යයි, වෙනස් නොවේ යැයි සැලකුවා. සියලු දේ (සුඛ) සැප යැයි සැලකුවා. සියල්ල (අත්ථ) මම යැයි, මගේ යැයි මමත්වයෙන් සැලකුවා.

මඤ්ඤති මාමඤ්ඤති, මම, මගේ කියලා කටයුතු කරන මමත්වයෙන් යුතු තැනැත්තා උම්මත්තකයෙක්. ඒකයි පෘථග 'ජනයෝ පිස්සෝ, උම්මත්තකයෝ වෙන්නේ.

'අත්ථ තාපන පරත්ථ තාපන' තමනුත් තැවෙනවා, අන්‍යයාත් තවනවා. තමන් ගිනි ගන්නා ගමන් අනුන්ටත් ගින්දර පත්තු කරනවා. කුමකින්ද? ඔහුගේ ගිනිකූර රාග, ද්වේශ, මෝහයි.

යෝනිසෝ මනසිකාරයේ යුතු ආර්ය උත්තමයා සියල්ල සලකන්නේ අනිත්‍ය, දුක්ඛ, අනත්ත වශයෙනුයි. එතුඔහුට නමඤ්ඤති මම කියලා කෙනෙක් නෑ. රාග, ද්වේශ, මෝහයෙන් ශූන්‍යයි. තමන් ඇවිලෙන්නෙත් නෑ, අන්‍යයාව අවුළුවන්නෙත් නෑ.

'දස්සනේන සම්පන්නයි' කෙලෙස් දැක්මෙන් ඉවත් කරනවා.

'ජානසෝ පස්සසෝ' දැනගෙන, දැනගෙන යනවා.

එවැනි උතුමකු හමුවීමෙන් අපට පුළුවන් නිවන් දොරටුව එළිය කරගන්න. නිවීමට පත්වෙන්න. 'දස්සනා පහාතබ්බා' යනුවෙන් සබ්බාසව සංවර පරියාය සූත්‍රයේ විග්‍රහ කරන කරුණු හතේ පළමු කාරණය දැන් ඔබට පැහැදිලියි නේද?

**වනවාසී සේනාපති විමලරතන හිමි**



"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."



# බුදු මුවින් වදාළ භික්ෂූහු සතු ගුණ මෙන්න

එක් දිනක් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පන්සියයක් භික්ෂූන් පිරිවරා කෝසල ජනපදයෙහි චාරිකාවෙහි හැසිරෙමින් 'ඉච්ඡානංගල' නම් බමුණු ගමට පැමිණ එහි එක්තරා වන ලැහැබක් අසල වැඩ සිටි සේක. එම බමුණු ගමෙහි 'පොක්ඛරසාති' නම් බමුණෙක් සිටියේය. ඔහුට 'අම්බට්ඨ' නම් බොහෝ දත උගත් ශිෂ්‍යයකු සිටියේය. දිනක් අම්බට්ඨ ඇමතූ පොක්ඛරසාති බමුණා ඔහුට බුදුන් හමුවට ගොස් ''තමන්ට බුදුන් හමුවීම සුදුසුදැ?'' යි දැනගෙන එන ලෙස නියෝග කළේය. එම නියෝගය පිළිගත් අම්බට්ඨ මානවකයා පොක්ඛරසාති බමුණාට වැඳ පැදකුණු කොට අසුන් යෙදූ රථයකට නැගී බොහෝ තරුණ පිරිසක්ද සමග ඉච්ඡානංගල වන ලැහැබ කරා ගියේය. එසේ ගොස් එළිමහනෙහි සක්මන් කරමින් සිටි භික්ෂූන් අමතා ''බුදුරජාණන් වහන්සේ කොහි වැඩ සිටින්නේදැ?''යි ප්‍රශ්න කළේය. එවිට එම භික්ෂූන් ''අම්බට්ඨය, අර පෙනෙන ගන්ධ කුටියෙහි වසන ලද දොර ඇත්තේය. සෙමෙන් එහි ගොස් නිය පිටින් දොරට තට්ටු කරන්න. එවිට ඔබට බුදු හිමියන් දැකිය හැක'' යනුවෙන් පැවැසූහ. ඒ අනුව අම්බට්ඨ තෙමේ බුදු හිමියන් අභියස පෙනී සිටියේය.

බොහෝ පිළිසඳර කතාවෙහි නිරත වූ මානවක තෙමේ තමාගේ උගත්කම, පාණ්ඩිත්‍යය ප්‍රදර්ශනය කරනු වස් බුදු හිමියන් සමග වාදයෙහි පැටලුණි. මෙහිදී මානවකයා බුදු හිමියන් අයත් ශාක්‍යය වංශිකයන් පිළිබඳ දැඩි විවේචනයට ලක් කළේය. එවිට බුදු හිමියන් වදාළේ ''බ්‍රාහ්මණය, ජාතිවාදය කියා හෝ ගෝත්‍රවාදය කියා හෝ මානව වාදය කියා හෝ දෙයක් නැත. අම්බට්ඨය, යම් කෙනෙක් වනාහී ජාතිවාදයෙහි සහ ගෝත්‍ර වාදයෙහි මෙන්ම මානව වාදයෙහි බැඳුණෝ වෙත්ද, ආවාහ විවාහාදියෙහි බැඳුණෝ වෙත්ද ඔව්හු අනුත්තර වූ විජ්ජාචරණ සම්පන්නයෙහි දුරු වූවාහු වෙති. අම්බට්ඨය, තථාගතයන් වහන්සේ මුල, මැද, අග යහපත් වූ, අර්ථ සහිත වූ, ව්‍යඤ්ජන සහිත වූ, සියලු ලෙසින් සම්පූර්ණ වූ බ්‍රහ්ම චරියාව ගෙනහැර දක්වති. ඒ ධර්මය යම් කිසිවෙක් අසා තථාගතයන් වහන්සේ කෙරෙහි මහත් ශ්‍රද්ධා උපදවාගෙන බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙනු පිණිස ගිහි ගෙය අතහැර ශාසනයෙහි පැවිදි බව ලබයි.

අම්බට්ඨය, එසේ පැවිදි වූ මහණ තෙමේ ප්‍රාතිමෝක්ෂයෙන් සංවර වූයේ, ආචාර ගෝචර දෙකෙන් සංවර වූයේ ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදු දිවි පැවැතුම් ඇත්තේ වෙයි. ත්‍රිවිධ සීලයෙන් යුක්ත වෙයි. ඉන්ද්‍රිය විෂයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි. භෝජනයෙහි පමණ දන්නේ වෙයි. මනා සිහියෙහි සහ සම්‍යක් ප්‍රඥාවෙන් යුක්ත වෙයි. සිව්පසය පිළිබඳ යථා ලාභ සන්තෝෂයෙන් යුක්ත වෙයි.

අම්බට්ඨය, ඒ මහණ තෙමේ කෙසේ නම් සීල සම්පන්න වෙයිද? හෙතෙම ප්‍රාණ වධය අත් හරියි. පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ වෙයි. කරුණාවෙන් යුතුව සියලු ප්‍රාණීන් කෙරෙහි හිත ඇතිව වෙසෙයි. හෙතෙම නොදුන් දෙය නොගනියි. ස්ත්‍රී පුරුෂ සංසර්ගයෙන් වැළකී බ්‍රහ්මචාරී වෙයි. සත්‍ය වචන කතා කරයි. ලෝකයා අතර විරුද්ධ කතා ඇති නොකරයි. පිසුණු බස් හෙවත් කේලාම් නොකියයි. සමගිය ඇති කිරීමට අනුබල දෙයි. පරුෂ වචනයෙන් වළකියි. කාලයට සුදුසු කතාවන් කරයි. නව ලොව්තුරු දහම ඇසුරින් කතා කරයි. අර්ථ වෙත් අභිවෘද්ධයෙන් යුතු, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කතා කරයි. තවද මානවකය, සිල්වත් මහණ තෙමේ ගස් වැල් සිඳීම් බිඳීම් ආදී විකෝපනයෙන් වැළකෙයි. රාත්‍රී භෝජනයෙන් සහ විකල් බොජුනෙන් වළකියි. නැටීම, ගී කීම, බෙර ආදිය වැයීම, විසුළු දැකීම යන මෙයින් වළකියි. මල්, ගඳ විලවුන් දැරීම, ඉන් සැරසීම, මුහුණෙහි අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් වැළකෙයි. උස් ආසන, මහාසනවලින් වැළකෙයි. රන්, රිදී, මසු කහවණු පිළිගැනීමෙන් වළකියි. ස්ත්‍රීන් සහ කුමරියන් පිළිගැනීමෙන් තොර වූයේ වෙයි. දැසි දසුන්, එළුවන්, කුකුළන්, ඌරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත් වතු යන මේවා පිළිගැනීමෙන් වැළකුණේ වෙයි. ගිහියන්ගේ දූත මෙහෙවර, ගනුදෙනු කිරීම, තුළා ආදියෙන් වංචා කිරීම, රන් සහ රන් නොවන දෑ මිශ්‍ර කොට වංචා කිරීම, වී ආදිය මැනීමෙන් වංචා කිරීම, උපායෙන් අනුන් රැවටීම, යකඩ ආදී ලෝහ රන් රිදී කියමින් වංචා කිරීම වැනි දෙයින් වැළකී කටයුතු කරති. එසේම ඇතැම් මහණුන් වහන්සේලා සැදැහැති ජනයා දෙන භෝජන වළඳා රජුන් පිළිබඳ කතාය, සොරුන් පිළිබඳ, මහ ඇමැතියන් පිළිබඳ කතා, සේනා පිළිබඳ, භය පිළිබඳ, යුද්ධ පිළිබඳ, ආහාර පාන, වස්ත්‍ර

''දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී.''


පිළිබඳ, මාලා ගන්ධ පිළිබඳ, නෑයන් පිළිබඳ, ගම් දනව් පිළිබඳ, කුමර කුමරියන් පිළිබඳ වැනි කතාවන්ගෙන් වැළකී සිටියි නම් එයද මහණුන්ගේ එක් ශීලයකි.

ඇතැම් මහණුන් සැදැහැතියන් දෙන දෙය වළඳා සාමුද්‍රිකා ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, මූසික ශාස්ත්‍රය, අංග විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, භූත විද්‍යා, විෂ විද්‍යා, ජීවන කාලය කීම ආදී තිරශ්චීන විද්‍යාවන්හි නියැලෙති. මෙයින් වැළකුණ යම් මහණෙක් වෙත් නම් එයද සිල්වත් කමකි. ඇතැම් මහණුන් අසවල් දින රජුන්ගෙන් බැහැර යාම සිදුවන්නේය. අසවල් දින ඇතුල් නුවරට එන්නේය. අසවල් රජු ජය ලබන්නේය. අසවල් රජු පරාජය වන්නේය. මෙවැනි දෑ පවසමින් කරනු ලබන මිථ්‍යා ජීවයෙන් වැළකෙන්නේ නම් එය මහණුන්ගේ සිල්වත් කමකි. එසේම ඇතැම් මහණුන් අසවල් දින චන්ද්‍ර ග්‍රහණය වන්නේය. අසවල් දින සූර්ය ග්‍රහණය වන්නේය. තාරකාවන්ගේ ගමනෙන්, චන්ද්‍ර ගහණයෙන් මෙබඳු විපාක වන්නේය. සූර්ය ග්‍රහණයෙන් මෙබඳු විපාක වන්නේය. භූමි චලනය, අහස් ගිගුරුම, තාරකාවන්ගේ නැගීම, බැසීම, උච්ච වීම නිසා මෙබඳු විපාක වන්නේය යනාදිය කියමින් මිථ්‍යා ජීවයෙන් ජීවිකාව ගෙන යති. මෙවැනි ලාමක ක්‍රියාවෙන් වැළකී කටයුතු කරයි නම් හෙතෙම සිල්වතෙකු වන්නේය.

එසේම ඇතැම් මහණුන් ආවාහ කරවීම, විවාහ කරවීම, විවාහ පොරොන්දම් බැලීම, ධනය රැස්කිරීම, වියදම් කිරීම, විවිධ හේතුන් අනුව මන්ත්‍ර ජප කිරීම, කාන්තාවන්ගේ සිරුරට දේවතාරෝපණය කිරීම, ශ්‍රියා කාන්තාව, ලක්ෂ්මී දෙවඟන කැඳවීම, මෙවැනි තිරශ්චීන විද්‍යාවන් කරති. එබඳු මිථ්‍යා ජීවයෙන් වැළකේ නම් එයද සිල්වත් කමකි. ඇතැම් මහණුන් ශාන්තිකර්ම කිරීම, නිවාස ඉදිකරන ස්ථානවල බහිරව පූජාවන් කිරීම, වමනය කරවීම, නැහැවීම, විරේක කරවීම, ඌර්ධව විරේකය, අධෝ විරේකය, සිරෝ විරේකය, නෂ්‍ය කිරීම, සැත් කටුවලින් කරන වෙදකම්, ශල්‍යකර්ම කිරීම, ළදරුවන් පිළිබඳ වෙදකම්, සිසිල් බෙහෙත් අඳුන් සෑදීම වැනි ක්‍රියාවන් මගින් ජීවිකාව ගෙන යති. එබඳු දෙයින් වළකියි නම් එම මහණුන් සිල්වතුන් වෙති.

අම්බට්ඨය, මෙසේ සීල සම්පන්න වූ යම් මහණෙක් ඇත්නම් ඔහුට කිසිදු බයක් හට නොගනියි. අසංවරය හේතු කොටගෙන හටගන්නා වූ කිසිදු බියක් ඔහුට ඇති නොවේ. ආර්ය වූ සීලයෙන් යුක්ත වූ මහණ තෙමේ ස්ව සන්තානයෙහි පිරිසිදු සැපය විඳියි. හෙතෙම කාය පරිහරණයට ප්‍රමාණවත් වූ සිවුරෙන්ද, කුස පරිහරණයට ප්‍රමාණවත් වූ පිණ්ඩපාත භෝජනයෙන්ද සතුටු වෙයි. ඒ මහණ තෙමේ යම් තැනකට යයි නම් කය පිළිබඳ දෙය පමණක් රැගෙන යයි. අම්බට්ඨය, යම් සේ පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැනක පියාඹා යයි නම් ඒ සියලු තැනකම පියාපත් බර පමණක් ඇතිව පියාඹා යයි. අම්බට්ඨය, පරිද්දෙන් මහණ තෙමේද කාය පරිහරණයට ප්‍රමාණවත් වූ සිවුරෙන්ද, කුච්ජි පරිහණයට ප්‍රමාණවත් වූ පිණ්ඩපාත භෝජනයෙන්ද, සතුටු වන්නේ වෙයි. මෙසේ මහණ තෙමේ ඉතරිතර සතුටකින් කටයුතු කරයි.

එසේම අම්බට්ඨය, මහණ තෙමේ උතුම් වූ සීල සමූහයෙන් යුක්තව, උතුම් වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවද, උතුම් වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවද, උතුම් වූ ඉතරිතර සන්තුෂ්ටියෙන් යුක්තව (ලද දෙයින් සතුටු වීම) කටයුතු කරයි. ඔහු මනුෂ්‍ය වාසයෙන් බැහැර ආරණ්‍යයෙහිද, වෘක්ෂ මූලවලද, පර්වත ප්‍රදේශවලද, කඳුරැලි ගිරි ගුහාවල හෝ මහ මගද, සොහොන්ද, ඉතා දුර බැහැර වූ වන සෙනසුන්ද, පිදුරු ගුහාද යන මෙම සෙනසුන් ඇසුරෙහි වාසය කරයි. ඒ මහණ තෙමේ පසු බත් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකෙයි. සිත සමාධි ගත කරගෙන බවුන් වඩයි. අම්බට්ඨය, මෙසේ බවුන් වඩමින් සිත එකඟ කරගත් විට සිත පිරිසිදු වෙයි. ප්‍රභාෂ්වර වෙයි. කෙලෙස් නැති වෙයි. මෘදු බවට පත් වෙයි. හෙතෙම දුකෙහි තතු එලෙසින්ම දකියි. දුක් ඉපදීමට හේතුව දැනගනියි. දුක නැති කිරීමේ තතු එලෙසින්ම දකියි. මේ දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදාව යයි දැන ගනියි. මෙසේ දක්නා ඔහුගේ සිත කාමාශ්‍රවයන්ගෙන් මිදෙයි. භවාශ්‍රයන්ගෙන් මිදෙයි. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් මිදෙයි. එසේ මිදුණ කල්හි මිදුණේ යයි සිතෙයි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචර්යය වසන ලදී. කටයුතු සියල්ල කරන ලදී. මේ ආත්ම භවයෙන් පසු අනෙක් ආත්මයක් නැතැයි දැනගනියි.''



මෙසේ දීර්ඝ වශයෙන් කරන ලද දේශනාව අසා අම්බට්ඨය මානවකයා නැවතත් පොක්ඛරසාති බමුණා වෙත ගොස් තමන් දැන උගත් කරුණු සියල්ල ඔහුට පැවැසීය. එය ඇසූ පොක්ඛරසාති බමුණා පසු දින බුදු හිමියන්ට දානය සඳහා ඇරයුම් කළේය. එම ඇරයුම පිළිගත් බුදු හිමියෝ පසුදින බමුණාගේ නිවසට වැඩම කළ සේක.


බුදුරජාණන් වහන්සේ දානය වළඳා අවසානයේ දේශනා කරන ලද ධර්මය ඇසූ පොක්ඛරසාති බමුණු තෙමේ සෝවාන් ඵලයට පත් විය. හෙතෙම තෙරුවන් සරණ ගිය උපාසකයකු බවට පත්විය. යහපත් පැවිද්දකු වීමට තිබිය යුතු ගුණාංග ඇතුළත් මෙම අම්බට්ඨ සූත්‍රය මගින් එදා භික්ෂු සමාජයට මෙන්ම වත්මන් භික්ෂු සමාජයටද වැදගත් කරුණු රැසක් දේශනා කර ඇති බව පෙනෙයි.

*(දීඝනිකායේ සීලක්ඛන්ධ වග්ගයේ අම්බට්ඨ සූත්‍රය ඇසුරිනි.)*

**පූජ්‍ය නාලන්දේ විමලවංශ හිමි**

''තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය.''

ධර්ම දේශනය




පින්වත්නි,

මජ්ඣිම නිකායේ ප්‍රථම භාගයේ එන චූළහත්ථිපදොපම සූත්‍ර දේශනාව තුළින් විශේෂයෙන් බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයේ ඇති වටිනාකම ප්‍රකාශ වෙයි. භාග්‍යවතුන් වහන්සේ ජාණුස්සෝණි බ්‍රාහ්මණයා හා පිලෝතිකා නම් පරිබ්‍රාජකයා යන දෙදෙනා අතර පැවති පිළිසඳර අරභයා දේශනා කොට වදාළේ ද, මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩමවා මිහින්තලාවේ දී දේවානම්පියතිස්ස රජතුමා ඇතුළු පිරිසට පළමුව දේශනා කොට වදාළේ ද මෙම චූළහත්ථිපදොපම සූත්‍ර දේශනාවයි.

අප මහා බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටු කරවූ ජේතවන නම් ආරාමයෙහි වැඩවාසය කරන සමයෙහි ජාණුස්සෝණි නම් බ්‍රාහ්මණයා සුදු අසුන් යෙදූ රියකින් සැවැත්නුවර පැදකුණු කරමින් පැමිණෙන විට ඔහුගේ හිත මිත්‍ර පිලෝතිකා (වාත්ස්‍යායන) පරිබ්‍රාජකයා දුරදීම දැක, පින්වත් වාත්ස්‍යායන, දැන් කොහි සිට එන්නේ ද? යනුවෙන් විමසූ විට, මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සමීපයෙහි සිට එමියි පිළිතුරු දුන්නේය. එවිට ජාණුස්සෝණි බමුණා, වාත්ස්‍යායන, ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ප්‍රඥාව හා වියත් බව කෙබඳුදැයි හඟින්නේ ද? පණ්ඩිතයෙකැයි සිතන්නේ ද? එයට පිළිතුරු දුන් වාත්ස්‍යායන, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ නුවණ හා වියත් බව දැනීමෙහි මම කවරෙක් ද? උන්වහන්සේගේ නුවණ හා වියත් බව දන්නේ නම් ඒකාන්තයෙන්ම එවැනි බුදුවරයෙක්ම වන්නේය යැයි පැවසීය. එවිට ජාණුස්සෝණි බමුණා, ඔබ ගරු ප්‍රශංසාවෙන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේට ප්‍රශංසා කරයි

# චූළහත්ථිපදොපම

# සූත්‍ර දේශනාවෙන් හෙළිවන තෙරුවන් ගුණ මහිමය



දේශකයාණෝ - මහනුවර හයගිරි විජයසුන්දරාරාම විහාරද්වයාධිපති, ඓතිහාසික බදුලු මුතියංගණ රාජමහා විහාරාධිපති, ශ්‍රී දළදා මාළිගාවේ තේවාවහාර, අතිගෞරවාර්හ
වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන
මහාවිහාරවංශික ශ්‍යාමොපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශවයේ මහානායක මාහිමිපාණන් වහන්සේ

"සෙය්‍යථාපි භො කුසලො නාගවනිකො නාගවනං පවිසෙය්‍ය, සො පස්සෙය්‍ය නාගවනෙ මහන්තං හත්ථිපදං දීඝතො ච ආයතං තිරියඤ්ච විත්ථතං. සො නිට්ඨං ගච්ඡෙය්‍ය: 'මහා වත භො නාගො'ති. එවමෙව ඛො අහං භො යතො අද්දසං සමණෙ ගොතමෙ චත්තරා පදානි, අථාහං නිට්ඨමගමං: 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො'ති."

කී විට, වාත්ස්‍යායන පිළිතුරු දෙමින්, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පැසසීමට මම කවරෙක් වෙම්ද? උන්වහන්සේ ප්‍රශස්ත ගුණයෙන් ප්‍රශස්තය. දෙව් මිනිසුන් අතර ශ්‍රේෂ්ඨය. වාත්ස්‍යායන, ඔබ කුමන කරුණක් දැක ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කෙරෙහි විශේෂයෙන් පැහැදුනේ ද? එයට පිළිතුරු දුන් වාත්ස්‍යායන, ඇතුන් වසන වනයෙහි වසන දක්ෂ පුරුෂයෙක් ඇත් වනයට ඇතුල්ව, එම ඇත් වනයෙහි දිගින් දික් වූ, පළලින් පුළුල් වූ මහ ඇත් පියසටහනක් දැක, මේ මහ ඇතෙකැයි නිශ්චයට පැමිණෙන්නේය. එසේම මම යම් තැනක පටන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ඥාණපද සතරක් දුටිම් ද, භාග්‍යවතුන් වහන්සේ සම්මා

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

සම්බුද්ධය, දේශිත ධර්මය ස්වාඤාතය, උන්වහන්සේගේ ශ්‍රාවක සංඝයා වහන්සේ සුප්‍රතිපන්න යැයි නිෂ්ටාවට පැමිණියෙමි.

ඒ ඤාණපද සතර මෙසේය. ඇතැම් ක්‍ෂත්‍රිය පඩිවරු බුදුරජාණන් වහන්සේ අසවල් ගමක හෝ නියම් ගමක වැඩියේයැයි අසා වාදාරෝපණය කරන්නෙමුයි කියා පැමිණෙති. එසේ පැමිණි කල්හි ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ඔවුන්ට දැහැමි කථාවෙන් කරුණු දක්වන සේක. සමාදන් කරවන සේක. තියුණු කරවන සේක. සතුටු කරවන සේක. එවිට වාදාරෝපණයට පැමිණි අයවලුන් ප්‍රශ්න නොවිචාරාම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙති. මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කෙරෙහි මේ පළමුවන ඤාණපදය දුටුවෙමි ද භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය, දේශිත ධර්මය ස්වාඤාතය, ශ්‍රාවක සංඝයා වහන්සේ සුප්‍රතිපන්න යැයි නිශ්චයකට පැමිණියෙමි.

ඇතැම් බමුණු පණ්ඩිතයෝ භාග්‍යවතුන් වහන්සේ සමග වාදාරෝපණයට පැමිණෙති. බුදුරජාණන් වහන්සේ ඔවුන්ට දැහැමි කථාවෙන් කරුණු දක්වයි. සමාදන් කරවයි. තියුණු කරවයි. සතුටු කරවයි. එසේ දැහැමි කථාවෙන් කරුණු දක්වනු ලැබූ, සමාදන් කරවනු ලැබූ, තියුණු කරවනු ලැබූ, සතුටු කරවනු ලැබූ ඔවුන් භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්න නොවිචාරති. ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙති. මෙම දෙවන ඤාණපදය දුටුවෙමි ද, මම භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය, දේශිත ධර්මය ස්වාඤාතය, බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා වහන්සේ සුප්‍රතිපන්න යැයි නිශ්චයකට පැමිණියෙමි.

ඇතැම් ගෘහපති පණ්ඩිතයෝ ද භාග්‍යවතුන් වහන්සේ සමග වාදාරෝපණයට පැමිණෙති. බුදුරජාණන් වහන්සේ ඔවුන්ට දැහැමි කථාවෙන් කරුණු දක්වා සමාදන් කරවයි. තෙද ගන්වයි. සතුටු කරවයි. එසේ කරුණු දක්වනු ලැබූ, සමාදන් කරවනු ලැබූ, තෙද ගන්වනු ලැබූ, සතුටු කරවනු ලැබූ ඔවුහු ප්‍රශ්න නොවිචාරති. වාදාරෝපණය නොකරති. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙති. මෙම තුන්වන ඤාණපදය දුටුවෙමි ද, භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය, දේශිත ධර්මය ස්වාඤාතය, බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා වහන්සේ සුප්‍රතිපන්න යැයි නිශ්චයකට පැමිණියෙමි.

නැවත ඇතැම් ශ්‍රමණ පණ්ඩිතයෝ ද භාග්‍යවතුන් වහන්සේ සමග වාදාරෝපණය කරන්නෙමුයි කියා පැමිණෙති. බුදුරජාණන් වහන්සේ ඔවුන්ට ද දැහැමි කථාවෙන් කරුණු දක්වති. සමාදන් කරවති. තෙද ගන්වති. සතුටු කරවති. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දැහැමි කථාවෙන් එසේ කරුණු දක්වනු ලැබූ, සමාදන් කරවනු ලැබූ, තෙද ගන්වනු ලැබූ, සතුටු කරවනු ලැබූ ඔවුහු ප්‍රශ්න නොවිචාරත්මය. වාදාරෝපණය නොකරම ගිහිගෙයින් නික්ම පැවිද්දට පැමිණීම පිණිස අවසර යදිති. බුදුරජාණන් වහන්සේ ඔවුන් මහණ කරවයි. උපසම්පන්න කරවයි. ඔවුහු කෙලෙස් තවන සිහියෙන් යුක්තව නිවන් පිණිස වන සිතින් වාසය කොට නොබෝ කලකින්ම බඹසර රැක අර්හත්වය පැමිණ වාසය කරති. යම් කලෙක බුදුරජාණන් වහන්සේ කෙරෙහි මේ සිවුවන ඤාණපදය දුටුවෙමි ද, මම භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය, දේශිත ධර්මය ස්වාඤාතය, බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා වහන්සේ සුප්‍රතිපන්න යැයි නිශ්චයකට පැමිණියෙමි.

අනතුරුව ජාණුස්සෝණි බ්‍රාහ්මණයා අස්රියෙන් බැස, උතුරු සළුව එකස් කොට, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ඇඟිලි බැඳ ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවායි තුන් විටක් උදම් ඇනීය. "අප කිසියම් දවසක ඒ භාග්‍යවතුන් වහන්සේ සමග එක්වෙමු. කථා සල්ලාපයෙහි යෙදෙමු"යි අධිෂ්ඨාන කොට පිටත්ව ගියේය.

ජාණුස්සෝණි බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ජාණුස්සෝණි බමුණා, පිලෝතිකා පරිබ්‍රාජකයා සමග කෙරුණු කථාබහ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැලකර සිටියේය. එකල්හි ඒ දෙදෙනා අතර ඇතිවූ පිළිසඳර කථාව ඇසූ බුදුරජාණන් වහන්සේ, ජාණුස්සෝණි බ්‍රාහ්මණයා බ්‍රාහ්මණයාට මෙසේ වදාළ සේක. මෙපමණකින් හත්ථිපදෝපමය විස්තර වශයෙන් සම්පූර්ණ නොවේ. එය ශ්‍රවණය කරවයි මෙසේ වදාළ සේක.

යම් සේ ඇත් වනයෙහි වාසය කරන්නෙක් ඇත් වනයට පිවිසෙන්නේ ද? ඒ ඇත් වනයෙහි දිගින් දික් වූ, පළලින් පුළුල් වූ මහත් ඇත් පියසටහනක් දැක මේ මහත් ඇත් පියසටහනක් යැයි නිෂ්ටාවට නොපැමිණෙයි. ඒ මහත් පියසටහන් ඇති වාමනිකා නම් මිටි ඇතින්නෝ ද සිටින බැවිනි. ඒ අනුව ඉදිරියට යන්නේ ඒ ඇත් වනයෙහි දිගින් දික් වූ පළලින් පුළුල් වූ මහත් ඇත් පියසටහනක් ද, ගස්වල සතට රියන් උසට පිට ඉලූ තැන් ද දකී. යම් දක්‍ෂ වූ ඇත් වනයෙහි වෙසෙන්නෙක් ඒ ඇතා ඒකාන්තයෙන්ම මහත් වූ ඇතෙකැයි නොසිතයි. ඒ ඇත් වනයෙහි මහත් පාද ඇති උස් පහත් දළ ඇති උච්චාකාළාරිකා නම් ඇතින්නෝ ද වෙති. ඔවුන්ගේ පියසටහනක් යැයි සිතීමෙනි. ඉදිරියට යන ඔහු ඒ ඇත් වනයේ තවද දිගින් දික් වූ පළලින් පුළුල් වූ පාද සටහන් ද, ගස්වල සතට රියන් පෙදෙසෙහි පිට ඉලූ තැන් හා දළින් සිඳලූ තැන් ද දකියි. යම් දක්‍ෂ ඇත් බලන්නෙක් නම් ඒ මහත් වූ ඇතෙකැයි නිශ්චයට නොපැමිණෙයි. ඒ වනයෙහි උච්චාකණේරුකා නම් මහපාද ඇති ඇතින්නක් ඇති බැවිනි. මේ ඔවුන්ගේ පාද යැයි සිතීමෙනි. නැවතත් ඉදිරියට යන්නේ, දිගින් දික් වූ, පළලින් පුළුල් වූ ඇත් පියසටහනක් දැක ගස්වල පිට ඉලූ තැන් හා දළින් සිඳලූ තැන් හා උස්තැන්හි බිඳීගිය අතු දැක ඒ වනයෙහි සිටියා වූ ඇතා ද දකියි. මේ මහඇතාම යැයි නිශ්චයට පැමිණෙති.

මෙම උපමා කතාවෙන් දක්වා ඇති පරිදි නීවරණය ප්‍රහාණය, ඇත් වනයයි. දක්‍ෂ ඇත් වන වැසියා නම් නිවන පිණිස පිළිවෙත්හි යෙදෙන යෝගාවචරයායි. මහඇතා නම් බුදුරජාණන් වහන්සේය. මහ පා සටහන් නම් ඤාණාභිඤ්ඤාවෝය. දක්‍ෂ ඇත් වන වැසියා මේ පාද සටහන් වාමනිකා, කාළාරිකා, කණේරුකා විය යුතුයි දැන නිෂ්ටාවට නොපැමිණෙන්නාක් මෙන් ධ්‍යාන අභිඤ්ඤා, වෙනත් ශාසන වලත් ඇත්තේ යැයි සිතා නිගමනයට නොපැමිණෙයි. දක්‍ෂ ඇත් වන වැසියා මේවා මහඇතාගේ පා සටහන්ය, අනෙකුගේ නොවේ යැයි නිෂ්ටාවට පැමිණීම මෙන්, ආර්ය ශ්‍රාවකයා අර්හත්වයට පැමිණ, ශීල, සමාධි, පඤ්ඤා, විමුක්ති, ඤාණදර්ශන මගින් බුදුරජාණන් වහන්සේ මේ උතුමා යැයි දැනගනියි.

මෙසේ පෙර බුදුවරයන් මෙන් ඉපිද, බුදු වී, සත්වයන් නිවන් යවා පිරිනිවන් පෑ හෙයින් තථාගත නම් වූ, කෙලෙසුන් දුරින්ම දුරු කළ හෙයින් අර්හත් නම් වූ, සියලු ධර්ම පරෝපදේශ රහිතව තමන් වහන්සේම අවබෝධ කළ හෙයින් සම්මා සම්බුද්ධ වූ, ලෝකවිදූ වූ, පුරුෂදම්මසාරථී නම් වූ, භාග්‍යවත් වූ සර්වඥයන් වහන්සේ ලොව පහළ වෙති. උන්වහන්සේ මෙලොව සියල්ල නැණින් ප්‍රත්‍යක්‍ෂ කොට ප්‍රකාශ කරන සේක. මුල, මැද, අග යහපත් වූ, අර්ථවත් වූ, පිරිසිදු වූ බ්‍රහ්මචරියාව දේශනා කරන සේක.

උන්වහන්සේගේ ධර්මය අසා ශ්‍රද්ධාවෙන් යුත් ඔහු, ගිහිගෙය විසීම සම්බාධ සහිතය. කෙලෙසුන් ඇති වීමට හේතු වේ. පැවිද්ද සම්බාධක රහිතය. ගිහිගෙයි වසන්නාට බ්‍රහ්මචරියාවෙහි විසීම දුෂ්කරය. පැවිදි වන්නේ නම් යහපතැයි සිතයි. ඔහු පසු කලෙක භව භෝග සම්පත් නෑසියන් අතහැර කෙස් රැවුල් බා, කසාවත් හැඳ ගිහිගෙන් නික්ම අනගාරික සස්නේ පැවිද්ද ලබයි. පැවිදිව පාතිමෝක්‍ෂ සම්පත්තිය අනුව ජීවත් වී, සියලු සතුන් කෙරෙහි දයානුකම්පාව දක්වා, නුදුන් දෙය ගැනීමෙන්, හොරකමින් තොර පිරිසිදු ජීවිතයක් ගත කරයි. මෛථුන ධර්මයෙන් වෙන් වී බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කරයි. සත්‍යයම කථා කරයි. කේලාම් නොකියයි. මිනිස්සුන්ගේ සමගිය දියුණුව පතන වචනම කථා කරයි. මිහිරි මනාප වචනම කථා කරයි. හිස් වචනයෙන් වෙන් වෙයි. අර්ථවත වචනම කථා කරයි. කැඩීම් බිඳීම් සිඳීම් ආදියෙන් වළකියි. විකාල භෝජනයෙන් වළකියි. නැටුම් ගැයුම් වැයුම් ආදියෙන් වළකියි. මල් ගඳ විලවුන්ගෙන් වළකියි. මත්ස්‍ය මාංශ පිළිගැනීමෙන් වළකියි. රන් රිදී කහවණු පිළිගැනීමෙන් වළකියි. සැහැසිකම් වලින් ද වළකියි. පිණ්ඩපාතයෙන් සතුටු වේ. ශීලයෙන් යුක්තව ආධ්‍යාත්මික නිරවද්‍ය සැපය අනුභව කරයි. හැම ඉරියව්වක්ම සිහියෙන් යුක්තව කරයි. පංචනීවරණයන් දුරු කරයි.

හත්ථිපදෝපම සූත්‍ර දේශනාව ඇසූ ජාණුස්සෝණි බ්‍රාහ්මණයා, ඔබවහන්සේගේ ධර්ම දේශනාව ඉතාම යහපත්ය. යටිකුරු කර තැබූ භාජනයන් උඩුකුරු කරන්නාක් මෙන්, නිධානයක් විවෘත කරන්නාක් මෙන්, මුළාවූවෙකුට මග කියන්නාක් මෙන් නොයෙක් කරුණු වලින් භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කොට වදාරණ සේක. ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද, ධර්මය ද, භික්‍ෂු සංඝයා ද සරණ කොට යමි. අද පටන් මා දිවි කෙළවර කොට තෙරුවන් සරණ ගිය උපාසකයෙකැයි සිත්හිලා දරාගන්නා සේක්වා.

ක්‍ෂත්‍රිය පඩිවරු, බ්‍රාහ්මණ පඩිවරු, ගෘහපති පඩිවරු, ශ්‍රමණ පඩිවරු බුදුරජාණන් වහන්සේගේ බණ අසා උන්වහන්සේගේ ශ්‍රාවකයන් බවට පත් වූහ. ශ්‍රමණ පඩිවරු බණ අසා බුද්ධ ශාසනයේ පැවිදිව නිවන් පසක් කළහ. ශාසනයේ මුල නම් ශීලයයි. මැද නම් සමාධියයි. අග නම් ප්‍රඥාවයි. තවත් ආකාරයකින් කියතොත් ශාසනයේ මුල නම් ශීල, සමාධි, විපස්සනාවයි, මැද නම් මධ්‍යම ප්‍රතිපදාව නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි, අවසානය නම් අර්හත් ඵලය හා නිර්වාණයයි. චූළහත්ථිපදෝපම සූත්‍ර දේශනාවෙන් ප්‍රකට වන අයුරින් උතුම් ත්‍රිවිධ රත්නයේ ගුණ සිහිපත් කොට අකුසලයෙන් වැළකී, කුසල් මගට යොමු වී නිවන් සුව අත්පත් කර ගැනීමට අපි ද වෑයම් කරමු.

තෙරුවන් සරණයි

"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."

ඡ-අනුස්සති භාවනා අතර පළමුවෙන් විස්තර වන භාවනාව වන්නේ බුද්ධානුස්සතියයි. බුද්ධානුස්සතිය යනුවෙන් හැඳින්වෙන්නේ බුදුරජාණන් වහන්සේ උතුම් බුදු ගුණ විෂයෙහි ඇතිකර ගන්නා සතිමත් භාවයයි. මෙය කෙලෙස් සන්සිඳුවමින් චිත්ත සමාධිය ලබාගැනීමට මෙන්ම බුදුරජාණන් වහන්සේ පිළිබඳ අචල ශ්‍රද්ධාව දියුණු කරගැනීමටත් උපකාරී වේ. බුද්ධානුස්සති භාවනාව වඩන ආකාරය පිළිබඳ දීර්ඝ විස්තරයක් විසුද්ධි මාර්ගයේ ඡ-අනුස්සති නිර්දේශයේදී දැකිය හැකිය.


සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් අන් කිසිවක් නොවදාරමින් කල්පයක් පුරා බුදු ගුණ පමණක් වදාළත් බුදු ගුණ කියා අවසන් නොවේ. බුදු ගුණ එතරම්ම අචින්ත්‍යය, අප්‍රමාණය. අචින්ත්‍ය සූත්‍රයේදීද බුද්ධ විෂය අචින්ත්‍ය බව පෙන්වා තිබේ. එසේ වුවත් අචින්ත්‍ය වූ, අප්‍රමාණ වූ බුදු ගුණ යමෙක් මෙනෙහි කරයි නම්, ඒ ගැන සිහිය පිහිටුවයි නම් අප්‍රමාණ වූ පුණ්‍ය විපාක ලද හැකිය. බුදු ගුණ සිහි කිරීමෙන් ඇතිවන්නා වූ බිය, තැති ගැනීම්, ලොමු දැහැ ගැනීම්ද දුරුකර ගත හැකි බව ධජග්ග සූත්‍රයෙන් පෙනේ.

බුදුරජාණන් වහන්සේ පිළිබඳවත්, ධර්මය පිළිබඳවත් වඩ වඩාත් ශ්‍රද්ධාව ඇතිවන්නේ බුදු ගුණ, බුදු බණ විමසා බලන තරමටය. "චූල්ල හත්ථි පදෝපම" ආදී සූත්‍ර දේශනාවලට අනුව පෙනී යන්නේ බුදුරජාණන් වහන්සේ අරහං ආදී බුදු ගුණයන්ගෙන් සමන්වාගත යැයි යමෙක් ප්‍රත්‍යක්ෂ වශයෙන් නිශ්චයට පැමිණෙන්නේ අරිහත්වය සාක්ෂාත් කරනු ලැබීමෙන් පසුව බවය. එමගින් පෙනෙන්නේ බුදු ගුණ පිළිබඳව දත හැක්කේ බුදුන් වදාළ ධර්ම මාර්ගයේ හැසිරුණු ප්‍රමාණයට බවය.


වර්තමාන අපේ බෞද්ධයන් අතර ඇතමුනට නව අරහාදී බුදු ගුණ අර්ථ සහිතව කියනු තබා බුදු ගුණ නවය වෙන් වෙන්ව කියා ගැනීමටද නුපුළුවන් වී තිබේ. එසේ පවතිද්දී ඔවුන් කෙසේ නම් ශ්‍රද්ධාවට පැමිණේවිද? සාමාන්‍ය ලෝකයාට අනන්ත වූ බුදු ගුණස්කන්ධය පිළිබඳ යම් පමණකට හෝ

# බුද්ධානුස්සති

## භාවනාව වඩනවා නම් ඔබට මේ දේ ලැබෙනවාමයි



"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."



වටහා ගනු පිණිස බුදුරජාණන් වහන්සේ බුදු ගුණ නව කොටසකට බෙදා පද නවයකට සකල බුදු ගුණස්කන්ධයම ඇතුළත් කොට බුදු ගුණ පාඨයක් දේශනා කොට තිබේ. එමගින් ඉදිරිපත්ව ඇත්තේ හුදෙක් බුදු ගුණ නවයක් නොව බුදු ගුණ කඳු නවයකි. මක්නිසාද යත් ඒ එක් එක් ගුණයෙන් තවත් බොහෝ බුදු ගුණ මතුවන හෙයිනි. පාලි ත්‍රිපිටකයේ සූත්‍ර රාශියක එන ඉතිපි සෝ භගවා අරහං... යන බුදු ගුණ පාඨයේ සඳහන් බුදු ගුණ නවය මෙසේය.

1. අරහං 2. සම්මා සම්බුද්ධො 3. විජ්ජාචරණ සම්පන්නො 4. සුගතො 5. ලෝකවිදූ 6. අනුත්තරො පුරිසදම්ම සාරථී 7. සත්ථා දෙවමනුස්සාං 8. බුද්ධො 9. භගවා වශයෙනි.

මෙම බුදු ගුණ පිළිබඳව එකින් එක අර්ථ සහිතව මෙසේ මේ කරුණින් ඒ භාග්‍යවතුන් වහන්සේ අරහං නම් වන සේක. සම්මා සම්බුද්ධස්ස නම් වන සේක ආදී ලෙස බුදු ගුණ මෙනෙහි කරමින් භාවනා කරන යෝගාවචරයාගේ සිත රාග, ද්වේෂ, මෝහ ක්ලේෂයන්ගෙන් නොකිළිටි වේ. ඔහුගේ සිත තථාගතයන් වහන්සේ කෙරෙහි ඍජුව එකඟ වෙයි. එලෙස කෙලෙස්වලින් තෙත් නොවූ වියළී ගිය නීවරණ ඇති කර්මස්ථානයට අභිමුඛ වූ හෙයින් ඍජුව පවත්නා සිත් ඇති ඒ යෝගාවචරයා හට බුදු ගුණයන්ට නැඹුරු වූ විතක්ක විචාර පවත්නේය. බුදු ගුණයන්ට අනුව විතක්කනය, විචාරණය කරන ඔහුට ප්‍රීතිය උපදින්නේය. ප්‍රීතියෙන් යුතු සිත් ඇති ඔහුට පස්සද්ධිය උපදින්යේ. ඒ හේතුවෙන් කාය, චිත්ත පීඩාවෝ සංසිඳෙති. සංසිඳුණු සිත් ඇති ඔහුට සුවය උපදින්නේය. සුවයෙන් සැනසී ගිය ඔහුගේ සිත බුදු ගුණයන් වෙතට නැඹුරු වී සමාධිගත වන්නේය. මෙසේ අනු මයෙන් ධ්‍යානාංග උපදින්නේය.

බුදු ගුණයෙහි ගැඹුරු බව හේතු කොටගෙන නොයෙක් ආකාරයේ ගුණයන් සිහි කිරීමට යොමුවීම හේතුවෙන් අපර්ණාවට නොපැමිණි හුදෙක් උපචාරයටම පැමිණි ධ්‍යාන උපදී මේ ධ්‍යානය බුදු ගුණ සිහි කිරීම හේතුවෙන් උපන් හෙයින් බුද්ධානුස්සති ධ්‍යාන යැයි කියනු ලැබේ.

## බුදු ගුණ භාවනාවේ අනුසස්

- බුදු ගුණ භාවනාවේ යෙදුණු යෝගාවචරයා බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගරු සරු ඇත්තේ වෙයි.
- ශ්‍රද්ධාවෙන්ද, සතියෙන්ද, ප්‍රඥාවෙන්ද, පුණ්‍යයෙන්ද මහත්වයට පැමිණේ.
- නිරන්තරයෙන් ප්‍රීති ප්‍රමෝදයෙන් වාසය කරයි.
- කුඩා වූද, මහත් වූද බිය දරා සිටිනු හැකිවෙයි.
- බුදුරජාණන් වහන්සේ සමග එක්ව වාසය කරමියි යන අදහස ඇතිවේ.
- පාපයක් කරමියි සිතෙත්ම බුදුරජාණන් වහන්සේ තමා ඉදිරියේ වැඩ සිටින සේ පෙනී යන බැවින් පව් කිරීමෙහි ලජ්ජා, භය ඇත්තේ වෙයි.
- මේ භවයේදීම මාර්ග ඵල ලද නොහැකි මරණින් මතු සුගතිගාමී වේ.
- බුද්ධානුස්සතිය දරා සිටින ඔහුගේ ශරීරය පවා චෛතියඝරයක් මෙන් පූජාර්හ වේ. (පිදිය යුතු බවට පැමිණේ.) ඔහුගේ සිත බුද්ධ භූමිය වෙත නැමුණේ වෙයි.

එහෙයින් මෙවැනි මහත් වූ, මහානුභාව සම්පන්න වූ බුද්ධානුස්සති භාවනාව නුවණැත්තෝ සමකල්හි අප්‍රමාදව වඩන්නාහුය.

**පූජ්‍ය හෙම්මාතගම පියදස්සි හිමි**

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහ් හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."



# ඉපිද මැරේ යළි ඉපදේ නොතිර සසර සාගරේ

## සසර ගමන නවතන නිවන් මගට පිවිසෙමු

මරණය කියන්නේ අපි හැමෝටම පොදු දෙයක්. එයින් ගැලවිය හැකි කෙනෙක් මේ ලොව තුළ නැහැ. අපේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් සම ත්‍රිංසත් පාරමී ධර්ම පුරා බලාපොරොත්තු වූයේද මරණයේ නියම ස්වභාවය වටහා ගැනීමටයි. එය සතර සත්‍යයේ පළමුවැන්න වූ, දුක්ඛ සත්‍යයෙන් පැහැදිලි කොට උන්වහන්සේ වදාරා සිටියා.

ප්‍රධාන වශයෙන් දුක කොටස් කීපයකට බෙදා උන්වහන්සේ පෙන්වා දී තිබෙනවා. දුක නම් කිසියම් අයකුගේ සිතේ ඇතිවන නොසතුටයි. ඉපදීම දුකකි. දිරීම දුකකි. මරණය දුකකි. මෙම ප්‍රධාන දුක් කීපය මොහොතක් සිතා බලමු. සත්වයකුගේ හටගැනීමේ අවස්ථාවේ සිට මව් කුසින් බිහිවීම දක්වා ඇතිවන වේදනාවන් ගැන සිතා බැලිය යුතුයි. එසේ නුවණින් කල්පනා කළ යුතුයි.

ජරාව නම් දිරීමයි. මනුෂ්‍ය ශරීරයේ පමණක් නොව ගස් වැල් පවා එක්තරා කාලසීමාවක් තුළ වැඩෙනවා. ඉන්පසු දිරීමට පටන් ගන්නවා. මේ සියල්ලෙන්ම බුදුරජුන් අපට පෙන්වා දුන්නේ සංස්කාර ධර්ම ස්වභාවයයි.

මඛාදේව රජතුමා තමාගේ හිසේ පැසුණු නර කෙසක් දැක රජ සැප අතහැර දමා පැවිදි වෙස් ගැනීමට ගිය බව බෞද්ධ සාහිත්‍යයෙන් පෙනෙනවා. නමුත් අද සමාජයේ ඇතැම් අයගේ මේ ලක්ෂණ පහළ වී ඇතත්, ඒවා ගැන සිතා බලන බවක් පෙනෙන්නට නැහැ. එම වෙනස්වීම නිසා ඇතිවී තිබෙන අවහිරතාවන් මොනවාද කියාවත් වැටහීමක් නැහැ.

තුන්වන දුක හැටියට පෙන්වා ඇත්තේ මරණයයි. මෙය නනා ක්‍රම යටතේ පහදා තිබෙනවා. නමුත් මෙහි නියම තේරුම වටහා ගත හැකිවී ඇත්තේ ස්වල්ප දෙනකුට පමණයි. මේ පිළිබඳව දක්වා ඇති විවිධ ඉගැන්වීම් අතර ඉතාම පැහැදිලි විස්තරයක් කර ඇත්තේ අපේ ශාන්තිනායක බුදුරජාණන් වහන්සේ විසිනුයි. උන්වහන්සේට කළ හැකි වූයේ තමන් ලත් අත්දැකීම් යටතේයි.

"එකභව පරියා පන්නස්ස ජීවිතිදිස්ස, උපච්දෝමරණං."

මේ බුදු දහමේ මරණය කෙටියෙන් පහදා ඇති ආකාරයයි. එක ජීවිතයකට සීමාවූ ආයුෂ ප්‍රමාණයක ගෙවීයාම මරණයයි. මරණ සිහියට ගෙන බලන විට මෙහි නියම ස්වභාවය වටහා ගත හැකිවනු නොඅනුමානයි.

කිසිම භේදයක් නොමැතිව ළදරු මරණ, මහලු මරණ, ධනවත්, දුප්පත්, උගත්, නූගත් හැම කෙනෙක්ම අප කිසිවක් නොසිතූ අයුරු මරණයට පත්වූ අවස්ථා දැක තිබෙනවා. යම් යම් අයගෙන් තම දූ දරුවන්ට, සමාජයට, රටට ඉටුකළ යුතු වැඩ කටයුතු ඉතිරි වී තිබෙනවා, එම නිසා මේ මොහොතේ එවැනි ඉරණමකට පා තැබිය නොහැකිය කියා කල් දමා ගැනීමේ හැකියාවක් අප කා හටවත් ලැබී නැහැ. තමා සිතන අනාගත බලාපොරොත්තු බොහෝ විය හැකියි. සියලුම වැඩසටහන් වහා වෙනස් කරන ශක්තියක් මරණයට තිබෙනවා.



ශාන්තිනායක අප බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළේ අපේ ශරීරය පෙණ පිඬක්, මිරිඟුවක් බවයි. අපේ පස් ඉඳුරන් රැවටීම සඳහා අරමුණු පහක් සෑදී ඇති බවත් ඒවා රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යනුවෙන් හැඳින්වෙන බවත් උන්වහන්සේ දේශනා කළා.

අතීතයේ අප බුදුරජාණන් වහන්සේ දවස වැඩ සිටි භික්ෂූන් වහන්සේ නමක් සසර දුකින් මිදීමේ අදහසින් බුදුරජාණන් වහන්සේ වෙතින් කමටහන් ලබාගෙන භාවනා කිරීමේ අදහසින් වන සෙනසුනක් කරා වැඩියා. එසේ වැඩ දිවා රාත්‍රී දෙකෙහි බොහෝ මහන්සියෙන් භාවනා කළත් ප්‍රතිඵලයක් ලැබුණේ නැති නිසා පෙරලා බුදුන් වහන්සේ දකින්න යන්නට පිටත් වුණා. එදා තදින් හිරු රැස් වැටී තිබූ බැවින් පීඩාවට පත් උන්වහන්සේ විඩා සංසිඳුවා ගන්නා අදහසින් ඒ අසල තිබූ අචිරවතී ගංගාව සමීපයට පැමිණියා. එසේ පැමිණ ගඟ දිය රැලි බිඳී බිඳී විනාශ වී යන ආකාරය මෙහිදී උන්වහන්සේට භාවනාවට අරමුණු වශයෙන් පෙනුණා. පෙණ පිඬුව හෙවත් දිය බුබුල අරමුණු කොට ගත් උන්වහන්සේ ජීවිතය පිළිබඳව නියම තත්ත්වයද ඒ අනුසාරයෙන් දැනගත්තා. මේ අවස්ථාව නුවණින් දුටු බුදුරජාණන් වහන්සේ ජීවිතය දිය බුබුලකටත්, පෙණ පිඬකටත් උපමා කොට එම භික්ෂුවට ඇසෙන සේ ධර්මය දේශනා කළා. දේශනාව අවසානයේදී විදර්ශනා වැඩූ භික්ෂූන් වහන්සේ සතර මාර්ගය වූ උතුම් රහත් භාවය ලබාගත්තා.


එමනිසා අප හැම දෙනාම මෙලොව දියුණුවත්, පරලොව නිවන් සුවයත් ලබාගන්න නිරතුරු උත්සාහ කළ යුතුයි.

කේ. බී. කඩිගමුව

''වෛරී මිනිසුන් මැද අවෛරීව ජීවත් වන්න.''

# ඔබගේ ජීවිතයේ තීරකයා

## අන් කිසිවකු නොව ඔබමය



මෙලොව වසන ඕනෑම අයකුට ජීවිතයේ විවිධ අවස්ථාවලදී විවිධාකාරයේ ප්‍රශ්න, ගැටලු, පීඩා, වේදනාවලට මුහුණ දීමට සිදුවේ. එසේ නොවන අයකු සිටී යයි පවසන්නේ නම් එය අසත්‍යයකි. මේවා දෙස විවිධ අය බලනුයේ විවිධ කෝණයන් හරහාය.

ඇතැම්හු මේවා කාටත් පැමිණෙන දේවල් ලෙසත්, ප්‍රශ්න නොමැති අය නොසිටින බවත් සිතා ඒවාට මුහුණ දෙති. තවත් අය පවසනුයේ තමන්ටම එවැනි තත්ත්වයක් ඇති වූයේ ඇයිද යන්නය. එමෙන්ම එම ගැටලුකාරී තත්ත්වයන්ට හේතුව බාහිර පුද්ගලයන් බව පවසමින්, ඒ අයට දෙස් දෙවොල් තබමින් ශාප කරන්නෝද වෙති. ඒ අතර තම ප්‍රශ්නවලට හේතුව බාහිර බලවේග යැයි සිතමින් (ග්‍රහ අපල, භූමියේ දෝෂ, මියගිය අයගේ බලෑම්, සූනියම්) මිදීම පිණිස මුදල්ද වැය කරමින් විවිධ මිථ්‍යා විශ්වාස පිටුපස යන අයද අප අතර සිටිති. එවැනි අදහස් ඇති පුද්ගලයන්ව මුලා කරගෙන තම මඩිය තර කරගැනීමට මාන බලන අය මේ සමාජයේ කොතෙකුත් සිටී.

තමන්ට ඇති කරදර, ප්‍රශ්න, පීඩාවන් පිළිබඳව නිතරම කතා කරන විට සිදුවන්නේ අන් කිසිවක් නොවේ. තම ජීවිතයේ වටිනාකම තමන් විසින්ම නැතිකර ගැනීමය.

ඇත්තෙන්ම මුදල් වියදම් කරමින් විවිධ කටයුතු කරන්නේද අන් කිසිවකට නොවේ. එම නැතිවූ වටිනාකම නැවත ජීවිතයට ළඟා කර ගැනීමටය.

නමුත් ජීවිතයේ වටිනාකම බාහිර බලවේගයකට හෝ තවත් අයකුට ලබාදිය හැකි නොවේ. එය ළඟා කර ගැනීම තමන් සතු කාර්යභාරයකි.

දූවිලි හෝ මඩ තැවරුණ මැණික් ගලක් පිළිබඳව සිතන්න. දූවිලි හෝ මඩ තැවරුණද එහි වටිනාකම නැතිවී යන්නේ නැත. සිදුවන්නේ දීප්තිය නැතිවීම පමණි. නැවත දීප්තිය ලබාගැනීමට නම් එහි තැවරී ඇති දූවිලි හෝ මඩ ඉවත් කළ යුතුයි. අප ජීවිතද ඒ ආකාරයේම වේ.

ඇත්තෙන්ම කරදර, ප්‍රශ්න යනු කෙනකුට ජීවිතය නිවැරදිව, ලස්සනට හැඩගස්වා ගැනීමට පොළඹවාලන දේවල්ය. ජීවිතය ලස්සන කරගැනීම, නැතහොත් ජීවිතයේ වටිනාකමට හානි සිදු නොවීමට නම් කළ යුතු වන්නේ එවැනි අවස්ථාවලදී නිවැරදිව, බුද්ධිමත්ව කටයුතු කිරීමය. එසේ නොකළහොත් සිදුවනුයේ කලකිරීම, අසහනය, වේදනාව යනාදිය ජීවිතයට ළඟා වීමය.

බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද්දේ කෙනකුගේ පිරිසිදු බවට (ලස්සනට මෙන්ම) අපිරිසිදු බවට (අවලස්සනට) වගකිව යුතු වන්නේ වෙන කවුරුවත් නොව එම පුද්ගලයාම බවය.

ග්‍රහ අපල හෝ වෙනත් නොපෙනෙන බලවේගවලට පෙර කර්මයකට හෝ වෙනත් දෙයකට ජීවිතය තීරණය කිරීමට ඉඩ සැපයීම තුළින් සිදුවන්නේ ජීවිතය වටිනාකම යටපත් වීමයි.

එමනිසා ජීවිතය ජය ගැනීමට නම් ඔබ විශ්වාස කරගත යුතු වන්නේ වෙන කවරකුවත් නොව ඔබවමයි.

ඔබගේ ජීවිතයේ සතුට, දියුණුව, නැතහොත් ජීවිතය ජයගැනීම සඳහා ක්‍රියාවට නැගිය හැකි කරුණු කිහිපයක් පහත දැක්වේ.

- ඔබ සෑමවිටම උත්සාහවන්ත අයකු වන්න.
- ඔබ ඔබ කරන්නට ඇති කටයුතු පිළිබඳව සිහි කල්පනාවෙන් කටයුතු කරන්න.
- ඔබ හැමවිටම ඔබගේ චරිතයට අපකීර්තියක්, අයහපතක් ගෙන දෙන වැරදි ක්‍රියා කිරීමෙන් වළකින්න.
- ඔබ නිතරම තමන් කළ කී දේ හා කරන කියන දේ පිළිබඳව විමසිලිමත් වන්න.
- ඔබ සෑමවිටම සංවරශීලී හා ක්‍රියාශීලී අයකු වන්න.
- ඔබ නිතරම වැරදි අඩු අයකු වන්න. තවත් අයකුට ඔබගේ වැරදි දකින්නට ඉඩ නොතබන්න.
- ඔබ සෑමවිටම ඔබගේ දෛනික කටයුතු කල් නොදමා කළ යුතු දේ ඒ මොහොතේම සිදු කරන්න.

මෙම කරුණු හොඳින් මතක තබාගෙන ජීවත්වීම තුළ ඔබගේ ජීවිතයේ තීරකයා අන් කවුරකුත් නොව ඔබම බව අවබෝධ කරගැනීමට අපහසු වන්නේ නැත.

**ධර්ම ගවේෂී**

''ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත.''




**සිතන්නට යමක්**

# ජීවිතය ජයගන්න අභියෝගවලට මුහුණ දෙන්න

හුඟාක් අය ජීවිතය කියන්නේ මහගිරිදඹේ නගින තරමේ සටනක් කියලා හිතන්නේ නෑ. හැම සිතකම අපේක්ෂාවක් තියෙනවා. ඒ අපේක්ෂාවන් සඳහා අපි අඩියෙන් අඩිය තියලා ඉහළට නගින්න ඕනේ. ඇතැම් වෙලාවට සමහර අය හිතනවා ෂෝට් කට්වලින් මහගිරිදඹය නගින්න පුළුවන් කියලා. අන්න එහෙම අය තමයි විවිධ සමාජ අපචාර මාර්ග තෝරාගෙන තමන්ගේ අපේක්ෂාවන් කරා යන්නේ.

නමුත් ඒ ගමන තුළ තිබෙන්නේ මහාම මහා ඛේදවාචකයක්. සඳළුතල හදන්න හීන මවන අය මේ අපචාර මාර්ග ඔස්සේ ගිය හින්දා තමයි වැලිකඩ, බෝගම්බර වගේ සිපිරි ගෙවල්වල තාප්පවලට කොටුවෙලා හිරවී ඉන්නේ. තවත් කොටසක් ඉන්නවා හැමදාමත් "අපිට දුකයි, අපිට මේ ගමන යන්න බෑ" වැනි සෘණාත්මක ආකල්පවලින් හදවත පුරෝගෙන දිවියෙන් හති වැටී. ජීවිතයට සුන්දර අපේක්ෂාවන් නෙළාගන්න පුළුවන් වෙන්නේ දහඩිය, කඳුළු හෙලුවොත් පමණයි. මේ ලෝකේ කිසිම මිනිහෙකුට, කිසිම ගැහැනියකට ජීවිතයේ එල නෙළා ගන්න මල්වලින් බරවූ මාවත් තිබුණේ නෑ.




ඒ අය ගමන් කළේ කටු කොහොල් පිරුණු මාවත් ඔස්සේ. වල, ගොඩැලි, කඳු, වැටි හැම දෙයක්ම තරණය කරලා තමයි ජීවිතය මිනිස්සු ජයගෙන තියෙන්නේ. හැම කෙනෙක්ම ජීවිතයේ අභියෝගවලට මුහුණ දිය යුතුයි. අභියෝග හමුවේ තැති ගන්න එපා. අභියෝග හමුවේ හඬා වැටෙන්න එපා. අභියෝග හමුවේ පිස්සන් මෙන් කටයුතු කරන්න එපා. හදවත ශක්තිමත් කරගන්න අභියෝගවලට මුහුණ දෙන්න. අපි දැකලා තියෙනවා සමහර අය ජීවිතයේ ප්‍රශ්න දකින කොට පැත්තකට වෙනවා. "අනේ මට නම් ඕවට මුහුණ දෙන්න බැහැ" කියනවා. එහෙම වෙන්න එපා. කොටින්ම කියතොත් ජීවිතය කියන්නේ ප්‍රශ්න පත්තරයක්. ඒකෙදි ඉරි ගහන්න තියෙන පහසු ප්‍රශ්න විතරක් නෙමෙයි දීර්ඝව ලියන්න තියෙන ප්‍රශ්නත් එනවා. විභාගයක් ලියන කොට ඇස් පියාගෙන ඉරි ගහන ප්‍රශ්නවලට එහෙම කනාපල්ලම් උත්තර ගහන්න බෑ. අපේ අය හුඟාක් වෙලාවට වරද්ද ගන්නේ මෙන්න මේ සිද්ධියයි. අභියෝග හරි සැහැල්ලුවෙන් තකනවා.

විභාගය එනකම් අපේ සමහරු හිතාගෙන ඉන්නවා "අපෝ අපිට ඒක හරි කිරි කජු" කියලා. "තව කල් තියෙනවා" කියනවා. ඔය විදියට දින, මාස ගෙවිලා අවසානයේ විභාගය කට ළඟට එනවා. උත්තර ලියන්න ගියාම කලන්තේ දාලා වැටෙනවා. ඒකට හේතුව මොකක්ද? අභියෝග තකන්නේ නැතිකමයි. අභියෝග සැහැල්ලුවට තැකීමයි. අපේ රටේ හුඟාක් දෙනෙක් අභියෝග හරි සැහැල්ලුවෙන් තකනවා වගේම අපිට ඕවා වැඩක් නෙමෙයි කියලා හිතනවා. මෙන්න මේ නිසා ජීවිතයම කළුවර කරගන්නවා. නොපෙනෙන අගාධවලට වැටෙනවා.

ඔබට එන්නා වූ ඕනෑම අභියෝගයක් හිත පිරිසිදුවෙන් බාරගන්න. ඇතැම් වෙලාවට මිනිස්සු ඔබව වට්ටන්න ඔබට නොයෙකුත් දේ පවසාවි. ඒ කිසිවකටවත් නොසැලෙන්න. ජීවිතය ඔබට ජයගත හැකිය යන සිතිවිල්ලේම රැඳී සිටින්න.

**පූජ්‍ය පදලංගල ධම්මදේව හිමි**

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකි



# බෞද්ධ කොඩිය උපත ලැබූවේ මෙහෙමයි

ශ්‍රී ලංකාද්වීපය නම් ධර්මද්වීපය බ්‍රිතාන්‍යයට යටත්ව පැවැති යුගයේ බෞද්ධ ජනතාවට විවිධ හිරිහැරවලට මුහුණ පෑමට සිදුවිය. ආගම ඇදහීමටවත් නිදහසක් නොතිබුණි. පෙරහරක් පැවැත්වීමද තහනම් විය. මෙවැනි අවස්ථාවක ඉදිරිපත් වූ බෞද්ධ ජන නායකයන් බෞද්ධාරක්ෂක කමිටුවක් පිහිටුවා ගත්හ.

මෙම කමිටුවේ නිලධාරීන් ලෙස හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගේ උපදෙස් මත සභාපති ධුරය ධර්ම ගුණවර්ධන මුහන්දිරම් මහතාද, උප සභාපති, භාණ්ඩාගාරික, ලේකම් යන තනතුරු සඳහා දොන් කරෝලිස්, එච්. ජ්. ප්‍රනාන්දු හා සී. ජී. ගුණවර්ධන යන මහත්වරු ඇතුළු කාරක සභාවත් පත්කර ගත්හ.

මෙම කමිටුවේ යෝජනා වාර්තා ගතකොට සංදේශ මගින් ඕල්කට්තුමා විසින් එංගලන්තයේ යටත්විජිත භාර මහ ලේකම්වරයාට ඉදිරිපත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ අපි භුක්ති විඳින නිදහස ලබාගැනීමට හැකිවී තිබේ.

බෞද්ධ කොඩියක අවශ්‍යතාව තදින්ම දැනුණු බෞද්ධාරක්ෂක කමිටුවේ සාමාජිකයෝ විවිධ සැලසුම් ඉදිරිපත් කළද සී. පී. ගුණවර්ධන ශූරීන් විසින් ඉදිරිපත් කරන ලද ෂඩ් වර්ණ බෞද්ධ රශ්මිය දක්වෙන කොඩියේ සැලසුම වඩා සුදුසු යැයි එහි සාමාජිකයන්ගේ අදහස විය. ඒ අනුව බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සංකේතවත් කරන සලකුණ ලෙස උන්වහන්සේට ගෞරවයක් ලෙසද බුදුරැස්හි තිබෙන වර්ණ 6 දිස්වන කොඩියක් එසවීමට සම්මත කළහ. බෞද්ධ කොඩියේ විස්තරය ප්‍රථමයෙන් ජනතාව



අතරට ගෙන ගියේ 1885 අප්‍රේල් මස 17 වැනි දින නිකුත් වූ 'සඳරැස' පත්‍රය මගින් ''බෞද්ධයන් විසින් ඔසවන්නට ව්‍යවස්ථා කරගෙන තිබෙන කොඩියක්'' යන ශීර්ෂ පාඨය යටතේ එම පුවත්පතේ පළවිය.

## බෞද්ධ කොඩියේ ෂඩ් වර්ණ

බෝසතාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසුව හතරවැනි සතිය ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට වයඹ දිගින් පිහිටි රතනසාර නමැති විහාරයේ වැඩ වසමින් පට්ඨාන ධර්මය මෙනෙහි කරමින් සිටින විට සිය ශරීරයෙන් සවනක් රශ්මි මාලාවක් නික්මුණි. තේෂාධිනීල ස්ථානවලින් නීල (නිල්) රශ්මියද, ඡවි (සම) ආදී ස්ථානවලින් පීත (කහ) රශ්මියද, මස්, ලේ ආදියෙන් ලෝහිත (රතු) රශ්මියද, අස්ථි හා දත්වලින් ඕදාත (සුදු) රශ්මියද නිකුත් වූ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. බුදුරදුන්ගේ ශරීරයෙන් සවනක් රැස් විහිදුවේ සෘද්ධි බලයෙන් නොව පට්ඨාන ධර්මය මෙනෙහි කිරීමෙන් ලේ හා හෘදය ප්‍රසන්න වීමෙන් බව බුද්ධිමතුන්ගේ අදහස වේ.

ඕල්කට්තුමාගේ මතය වූයේ සම්මත ජාතික කොඩියේ ප්‍රමාණයට හා හැඩයට ගැළපෙන පරිදි බෞද්ධ කොඩියද සකස් විය යුතු බවයි. එම අදහසට අනුව 1886 දී ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය සකස් කළේය.

බෞද්ධ කොඩියේ නිර්මාතෘවරයා ලෙස ගෞරවය හිමිවූයේ හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාට වුවද එය තමාගේ නිර්මාණයක් නොවන බව එතුමා පවසා ඇත. ඒ අනුව බෞද්ධ කොඩියේ නිර්මාතෘවරයා බෞද්ධාරක්ෂක කමිටුවේ සිටිය සී. පී. ගුණවර්ධන මැතිතුමා බව පිළිගැනීමට සිදුවිය.

මෙම ධර්මද්වීපයේ ප්‍රථම වරට බෞද්ධ කොඩිය ඔසවන ලද්දේ 1885 අප්‍රේල් 28 වැනි දිනට යෙදුණු වෙසක් පුර පසළොස්වක පොහොය දිනයේදීය. මෙදින මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ ප්‍රධානත්වයෙන් කොටහේන දීපදුත්තාරාමයේදීද, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ගේ ප්‍රධානත්වයෙන් මාලිගාකන්ද විද්‍යොදය පිරිවෙන් විහාරයේදීද, කැලණිය විහාරස්ථානය ඇතුළු ලංකාව පුරා තිබූ විහාරස්ථානවලද, සියලු බෞද්ධයෝ සිය නිවෙස්වලද, බෞද්ධ ආයතනවලද බෞද්ධ ධජය එසවූහ.

දෙස් විදෙස් බුදු දහම ප්‍රචාරය කළ අනගාරික ධර්මපාලතුමා සේම ඕල්කට්තුමා වැනි ජාතික වීරයෝ බෞද්ධ කොඩියද විවිධ රටවල ව්‍යාප්ත කිරීමට පියවර ගත්හ. මුලින්ම ජපානයේ හා බුරුමයේ රාජ්‍ය නායකයන් මුණ ගැසී සාකච්ඡා කොට බෞද්ධයන් සංකේතවත් කිරීමට ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය භාවිත කරන මෙන් ඉල්ලා සිටියහ. ඒ රටවල පාලකයෝ එම ඉල්ලීම පිළිගත්හ. මේ ආකාරයට තවත් බොහෝ රටවල බෞද්ධ කොඩිය ව්‍යාප්ත විය.

1950 මැයි 28 දින රටවල් 25 ක නියෝජිතයන් 148 දෙනකුගේ සහභාගිත්වයෙන් මහනුවර පැවැති ලෝක බෞද්ධ සම්මේලනයේදී මහාචාර්ය ජී. පී. මලලසේකර මහතාගේ ඉල්ලීමක් වූයේ අපේ රටේ බෞද්ධ කොඩිය ලෝකයේම බෞද්ධ කොඩිය බවට පිළිගන්නා ලෙසයි. ඒ සඳහා සියලු දෙනාගේ කැමැත්ත ලැබුණි. 1951 වසරේ සිට ශ්‍රී ලංකාවේ බෞද්ධ කොඩිය ලොව සියලුම බෞද්ධ ජනතාවගේ ආගමික කොඩිය බවට පත්විය.

**පූජ්‍ය ඇරංගල මංගල හිමි**



''යකඩයෙන් නැගුණ මලකඩ ඒම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි.''

# දළදා වරුණ

ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව



මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk


## සදහම් දිවයින යළි ගොඩ නගමු

සදහම් ආලෝකය රැගෙන අනුබුදු මිහිඳු හිමි සිරිලකට වැඩි පොසොන් පුර පසළොස්වක පොහෝ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවට අති උතුම් දිනයකි. මිහිඳු හිමියන්ගේ ශ්‍රී ලංකාගමනයත් සමග මෙරට ඇතිවූ ආගමික හා සංස්කෘතික ප්‍රබෝදය අතිවිශාලය. එදා බුදු දහමේ සදහම් පණිවුඩය සිරිලක පුරා විසිරී ගියේ බෞද්ධ ජනතාවගේ සිත් සතන් තුළ අපමණ ශ්‍රද්ධා භක්තියක් දනවමිනි. ශ්‍රී ලංකාවට "සදහම් දිවයින" එසේ නැතහොත් "ධර්මද්වීපය" යන කීර්ති නාමයන් පටබැඳුණේ මහින්දාගමනයේ සාධනීය ප්‍රතිඵලයක් වශයෙනි. එහෙත් අද රට තුළ සිදුවන විවිධ අපරාධ, මිනීමැරුම්, මංකොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර දෙස සිත යොමු කරන විට බෞද්ධයන් වූ අපට කටපුරා ශ්‍රී ලංකාව "සදහම් දිවයිනක්" ලෙසට හැඳින්විය හැකිද යන ප්‍රශ්නය මතුවීම වැළැක්විය නොහැකිය. දිනෙන් දින ඉහළ යන මේ දූෂිත වාතාවරණය ගැන තොරතුරු ඇසෙන විට හා දකින විට අප තුළ ඇතිවන සංවේගය හා කම්පනය අති විශාලය.

අද අපි ජීවත් වන්නේ ආර්ථික, සමාජයීය, දේශපාලනික හා සංස්කෘතික වශයෙන් ඉතා සංකීර්ණ වූ සමාජ පරිසරයක බව අමුතුවෙන් කිව යුතු නැත. කෙතරම් බණ කීවත්, කෙතරම් බණ ඇසුවත් රට දහම් දිවයිනක තත්ත්වයට පත්වන බවක් අපට නොපෙනේ. රට තුළ ව්‍යාප්ත වන පරිසර තත්ත්වයන්ට සාපේක්ෂව අපගේ ජීවන රටාවන්ද බෙහෙවින් සංකීර්ණ වී තිබේ. අපරාධ හා අසංවර ක්‍රියාවන්ට නැඹුරු වී සිටින අයගේ චිත්ත සන්තානයන් ක්‍රියාත්මක වන්නේද මෙකී සංකීර්ණ හා ව්‍යාකූල මනෝභාවයන්ට අනුවය. ඔවුන්ට හොඳ නරක අවබෝධ කරගන්න තරම් බුද්ධියක් නොමැත. බුදු දහමේ ආලෝකය හා සිසිලස අවශ්‍ය වන්නේ මෙබඳු දූෂිත හා අවුල් සහගත මනස් ඇති කරගෙන සිත් සතන් සුවපත් කරනු පිණිසය.


අද දවසේ අප කාගේත් අරමුණ හා වගකීම විය යුත්තේ දැහැමින් පිරිපුන් ජීවිතයක් ගත කරන්නට පෙළ ගැසීමය. පංචශීල ප්‍රතිපත්තියේ පිහිටා ජීවත් විය හැකි නම් අපට මෙහිදී මේ මාතෘභූමිය සදහම් දිවයිනක් කරගැනීමට බැරිකමක් නැත. මේ උතුම් පොසොන් පොහෝ දින අප සැමගේ එකම අදිටන විය යුත්තේ බුදුන් වහන්සේ දෙසා වදාළ බුදු බණ ඔස්සේ ගමන් කිරීමය. ජීවිතයේ විමුක්ති මාර්ගය පසක් කරගන්නට බුදුරදුන් හැරුණු කොට වෙනත් විකල්පයක්ද නැත. ■

අනුරාධපුර අටමස්ථාන ශ්‍රී ලංකාවාසී බෞද්ධ ජනතාවගේ මෙන්ම සමස්ත ලෝකවාසී බොදුනුවන්ගේ ද ඉමහත් ගෞරවාදරයට මෙන්ම නිරතුරුව වැඳුම් පිදුම් ලබන ස්ථාන අටයි. වර්තමානයේ අටමස්ථාන ලෙස සඳහන්වන පූජාභූමි මේවාය.

| | |
|---|---|
| 1. ශ්‍රී මහා බෝධිය | 2. ලෝවාමහාපාය |
| 3. රුවන්වැලි සෑය | 4. අභයගිරිය |
| 5. ථූපාරාමය | 6. ජේතවනාරාමය |
| 7. ලංකාරාමය | 8. මිරිසවැටිය |

වර්තමානයේ මෙසේ අටමස්ථාන හැඳින්වුවද ඓතිහාසික වංශකතා ආදී විස්තරවලට අනුව ඒවා කාලානුරූපීව වරින්වර වෙනස් වී ඇති බව පෙනී යයි. අපේ පැරණි වංශකථාවන මහාවංශය, දීපවංශය, සිංහල බෝධි වංශය ආදියෙහි අටමස්ථාන ලෙස පොදු වශයෙන් හැඳින්වූයේ නොමැති වුවද බෞද්ධයින් විසින් එවකට උතුම් කොට සලකන ලද ස්ථාන මේවාය.

1. මහාමේඝවන සංඝාරාමය හෙවත් තිස්සාරාමය.
2. සංඝයාගේ විනය කර්ම සඳහා වූ කර්ම මාලක සීමාව.
3. ජන්තාඝර පොකුණ
4. මහා බෝධිය පිහිටුවන ස්ථානය
5. සංඝයාගේ පොහෝ ගෙය.
6. සංඝයාට උපන් ලාභ බෙදන ස්ථානය
7. චතුශ්ශාලාව.
8. රත්නමාලී චෛත්‍ය භූමිය.




මෙම ස්ථාන කකුසඳ, ...
කාශ්‍යප, ගෞතම යන සිව් ...
වහන්සේලාගේ පාදශ්පර්ශ...
ස්ථාන සහ බුදුරජාණන් වහ...
සුවයෙන් වැඩ සිටි පාරිශුද්ධ...
කීපයක් ඇතුළු ස්ථාන අටක...
යොදාගෙන තිබේ. මහනුවර...
අටමස්ථාන ලෙස පැරණි ම...
පූජා ස්ථාන පමණක් නොව ...
ජේතවන විහාරය ද පිළිගැනි...
තිබේ.


වර්තමානයේ භාවිතා ...
අටමස්ථාන පළමුවරට නම් ...
ඉංග්‍රීසි පාලන සමයේදී ය.




ජයශ්‍රී මහා බෝධිය



රුවන්වැලි සෑය



ථූපාරාමය



ජේතවනාරාමය


ඔවුන් විසින් අටමස්...
අයිතිය අටමස්ථානාධි...
පවරා දෙන ලදී. එහි ...
ලෙස දැක්වෙනුයේ ප...
ස්ථානයන්ය.


1. ජේතවනාරාමය 2...
3. ථූපාරාමය 4. අභය...
5. ලෝවාමහාපාය
6. ජය ශ්‍රී මහා බෝධි...
7. මිරිසවැටිය (දා ගැ...
8. රුවන්වැලි මහා සෑය (දා ගැබ, මළුව හා ප...

"අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙ...


# මිහින්තලෙන් නැගලා අටමස්ථානෙන් වැඳලා

## අනුරපුරේ රවුමක් යමු සාදුකාර දීලා




මිරිසවැටිය


ලංකාරාමය


අභයගිරිය


ලෝවාමහාපාය

ක්‍රි.ව. 1908 දී අලුතින් අටමස්ථාන කොමිටි සභාවක් පත් කරන ලදී. එහිදී පැවති සාකච්ඡා සම්බන්ධයෙන් තීරණයකට එළඹීමට නොහැකි වූයෙන් ක්‍රි.ව. 1909 ජනවාරි 16 දින සර්. එච්.ඒ.මැකලම් ආණ්ඩුකාරවරයා විසින් අටමස්ථාන කොමිටිය සමග සාකච්ඡා කළේය. එහිදී අටමස්ථානයේ ලේකම්වරයා විසින් වර්තමානයේ සඳහන් වන අටමස්ථාන අනුපිළිවෙලට ප්‍රකාශයට පත් කරන ලදී.

**වර්තමානයේ පවතින අටමස්ථාන මෙසේය.**

1. ශ්‍රී මහා බෝධිය
2. ලෝවාමහාපාය
3. රුවන්වැලි සෑය
4. අභයගිරිය
5. ථූපාරාමය
6. ජේතවනාරාමය
7. ලංකාරාමය
8. මිරිසවැටිය

යන ස්ථානයන්ය.

අනුරාධපුර අටමස්ථානයෙහි ඇති විශේෂත්වය වනුයේ වෙන් වෙන්ව ඇති විහාර 8 ක් එකම විහාරයක් ලෙස සැලකීමයි.

**අනුරාධපුර පූජා නගරයේ ඉතිහාසය**

අනුරාධපුරය, ලංකාවේ ඉතාම වැදගත් නගරයකි. මෙය ලංකාවේ පැරණිම ඓතිහාසික නගරය වීම පමණක් නොව පළමුවරට ලංකාවේ බුදු සසුන පිහිටුවන ලද්දේ ද අනුරාධපුරයේ බැවින්, බොදුනුවන්ගේ ප්‍රධාන පූජනීය නගරය ද වේ. ක්‍රි.පූ. 4 වෙනි සියවස පටන් ක්‍රි.ව. 11 වෙනි සියවස දක්වා ලංකාවේ ප්‍රධාන රාජධානිය වූයේ අනුරාධපුරයයි.

අනුරාධපුර නගරයේ ආරම්භය ක්‍රි.පූ. 4 වැනි සියවස දක්වා දිවයන අතර ලංකාවේ පළමු රජු ලෙස සඳහන්වෙන විජය රජුගේ ඇමතිවරයෙකු වූ 'අනුරාධ' නම් කුමරු සිය නාමය මුල් කොට කොළොම්හෝය ඉවුරෙහි (වත්මන් මල්වතු ඔය) අනුරාධ ග්‍රාමය ඉදිකරවන ලද බව වංශකතාවල දැක්වේ. පඬුවස්දෙව් රජුගේ මෙහෙසියක වූ භද්දකච්චායනා දේවියගේ සොහොයුරෙකු වූ අනුරාධ නම් කුමරු මෙහි වැවක් බඳින ලද අරි, දකුණෙන් මාළිගාවක් තනවන ලද බව සඳහන් වේ.

තවත් සමහරු දක්වන පරිදි ජ්‍යෝතිශ්ශාස්ත්‍රයේ එන 'අනුරාධ' නම් නැකතින් මෙම නගරය පිහිටුවීම නිසා අනුරාධපුර යන නමින් ප්‍රකට වූ බවද සඳහන් වේ. පඬුවස් දෙව් රජුගේ මුනුබුරු වූ පණ්ඩුකාභය කුමරු තම මයිලනුවන් මරා ලංකා රාජ්‍යය පිහිටුවාගත් පසු තම රාජධානිය සඳහා පළමුවරට තෝරා ගන්නා ලද්දේ අනුරාධපුරයයි.

මහාවංශයේ දැක්වෙන පරිදි පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය නිර්මාණය කළ ආකාරය දැක්වෙන අතර, ඒ අනුව පළමු වරට නගරාංගයන්ගෙන් යුතු ස්ථානයක් නිර්මාණය කරන ලද්දේ මොහුය. පණ්ඩුකාභය රාජ්‍ය සමයේ අභයවාපී, ගාමිණීවාපී, ජයවාපී යන වැව් තුනක් ඉදිකරවන ලදී. පණ්ඩුකාභය රජු විසින් අනුරාධපුර නගරය විවිධ කොටස්වලට බෙදා සකස් කරන ලද අතරනගර වාසීන්ගේ අවශ්‍යතාවයට සරිලන පරිදි වැවක්, සුසාන භූමියක් හා ආගමික ස්ථාන ද තැනූ බව මහාවංශයේ සඳහන් වේ.

අනුරාධපුර අග නගරය කර ගත් ශ්‍රේෂ්ඨ රජවරුන් රාශියක්ම සිය නම සිංහල රාජාවලියට එක්කොට තිබේ. පණ්ඩුකාභය රජුගෙන් පසු ඔහුගේ මුනුබුරු වූ මුටසීව රජු විසින් ලංකාවේ පළමු රාජකීය උද්‍යානය වූ මහමෙව්නා උයන පිහිටුවන ලදී. පසුව දේවානම්පියතිස්ස (ක්‍රි.පූ. 250 - 210) රජු විසින් මහා විහාරය පිහිටුවන ලද්දේ මෙම භූමියේ ය.

දේවානම්පියතිස්ස රජු විසින් මිහිඳු හිමියන් මෙරටට වැඩම කොට පළමුවරට බුදු සසුන පිහිටුවීමෙන් පසු බුදුන්වහන්සේගේ දකුණු අකු ධාතුව නිධන් කොට ථූපාරාම චෛත්‍යය ඉදිකරවන ලදී. මෙම සමයේදී දඹදිව බුද්ධගයාවේ ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාවක් ගෙනවිත් මහාමේඝ උද්‍යානයෙහි රෝපණය කරවන ලදී. වෙස්සගිරිය, ඉසුරුමුණි විහාරය, හත්ථාල්හක මෙහෙණවර යනාදී විහාරද මෙම රජු විසින් කරවන ලදී. තිසාවැවද මෙම රජුගේ නිර්මාණයකි. මෙම රජුගේ කාලයේදී චෛත්‍යය, සංඝවාස ආදියෙන් යුතු ශුද්ධ නගරයක් බවට අනුරාධපුරය පත් විය.

රණශූරයෙකු පමණක් නොව ජාතික වීරයෙකු බවට පත් වූ දුටුගැමුණු රජු අනුරාධපුර නගරය තම රාජධානිය බවට පත් කොට ගත්තා සේම රුවන්වැලි මහා සෑය, මිරිසවැටිය ආදී විශාල දාගැබ් මෙන්ම ලෝවාමහාපාය නම් විශාල ප්‍රාසාදයක් ඉදිකරවන ලදී.

දුටුගැමුණු රජුගේ සොහොයුරු සද්ධාතිස්ස රජු (ක්‍රි.පූ. 137 - 119) රුවන්වැලි මහා සෑයේ නොනිමි කර්මාන්ත නිම කරවන අතර ගින්නෙන් විනාශ වූ ලෝවාමහාපාය සත්මහල් කොට නැවත සාදවන ලදී. සද්ධාතිස්ස රජුගේ බාලපුත් වට්ට ගාමිණී අභය රජු (වළගම්බා ක්‍රි.පූ. 103 - 102) අනුරාධපුර නගරයට උතුරු පැත්තේ අභයගිරි විහාරය සාදවා පූජා කරන ලදී.

පූජ්‍ය නාරවිල විජිතවංශ හිමි

ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.'' - (ධම්ම පදයේ 3 වන ගාථාව)



# ධර්මය සහ අධර්මය

## හඳුනාගන්නා හැටි බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ මේ විදියටයි

'චත්තාරෝ මේ භික්ඛවේ, මහා පදේසේ දේසිස්සාමි' යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑමට ආසන්න සමයේදී භෝග නම් නගරයේදී ආනන්ද තෙරුන් වහන්සේ ඇතුළු මහත් වූ භික්ෂු සංඝයා පිරිවරාගෙන ''මහණෙනි, මේ මහා පදේස හතරක් දේශනා කරන්නෙමි. එය අසන්න, මනාව මෙනෙහි කරන්න'' යැයි මහාපදේස හතරක් වදාළහ. පිරිනිවන් පෑමට ආසන්න සමයේදී භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව සිදුකොට වදාළේ තමන් වහන්සේගේ පිරිනිවීමෙන් පසුව ශ්‍රාවකයන්ට ධර්මය, අධර්මය නිවැරදිව තේරුම් ගැනීමෙහිලා වන නිර්ණායක වශයෙනි.

1. සම්මුඛා මේතං ආවුසෝ, භගවතෝ සුතං, සම්මුඛා පටිග්ගහීතං, අයං ධම්මෝ අයං විනයෝ, ඉදං සත්ථු සාසනංති.

ඇවැත්නි, මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේගෙන්ම අසන ලදී. උන්වහන්සේ ඉදිරියේදීම පිළිගන්නා ලදී. එහෙයින් මා කියන දේ ධර්මයය, විනයය. මෙය බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීමයි.

යනුවෙන් යමෙක් කියතොත් ඒ කීම එක්විටම පිළිගැනීමටද සුදුසු නැත. ප්‍රතික්ෂේප කිරීමටද සුදුසු නැත. ඒ කියන දේ භාග්‍යවතුන් වහන්සේගේ සූත්‍ර දේශනාවන්ට ගැළපේදැයි විමසා බැලිය යුතුය. එසේ විමසීමේදී සූත්‍රයෙහි ගැළපේ නම්, විනයෙහි ගැළපේ නම් එය ඒකාන්තයෙන්ම භාග්‍යවතුන් වහන්සේගේ ධර්මයකැයි තේරුම් ගත යුතුය.

2. අමුකස්මිං නාම ආවාසේ සංඝෝ විහරති සථෙරෝ සපාමොක්ඛෝ තස්ස මේ සංඝස්ස සම්මුඛා සුතං, සම්මුඛා පටිග්ගහීතං, අයං ධම්මෝ, අයං විනයෝ, ඉදං සත්ථු සාසනන්ති.

"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"

එනම් අසවල් ආවාසයෙහි ප්‍රධානත්වයට පත් තෙරුන් සහිත වූ සංඝයාගෙන් අසන ලදී. ඒ සංඝයා ඉදිරියේදී පිළිගන්නා ලදී යැයි යමෙක් පැවැසුවද පෙර කී පරිදිම එක්විටම පිළිගැනීමට සුදුසු නැත. ප්‍රතික්ෂේප කිරීමද සුදුසු නැත. සූත්‍රයෙහි බහා, විනයෙහි බහා ඊට ගැළපේ නම් පමණක් පිළිගත යුතුය.

3. අමුකස්මිං නාම ආවාසේ සම්බහුලාථේරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධර විනයධර මාතිකාධරා, තේසං මේ ථේරානං සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහීතං අයං ධම්මො, අයං විනයෝ, ඉදං සත්ථු සාසනන්ති.

එනම් අසවල් ආවාසයේ බහුශ්‍රැත වූ ත්‍රිපිටකයෙහි ඇසූ පිරූ තැන් ඇති ධර්මධර වූ, විනයධර වූ, මාතිකාධර වූ බොහෝ ස්ථවිර භික්ෂූහු වෙසෙති. ඒ සංඝයාගෙන් මෙය අසන ලදී. ඒ සංඝයා ඉදිරියේදී පිළිගන්නා ලදී යනුවෙන් යමෙක් පැවැසුවද එක්විටම පිළිගැනීමද, ප්‍රතික්ෂේප කිරීමද සුදුසු නැත. සූත්‍රයෙහි බහා, විනයෙහි බහා ඊට ගැළපේ නම් පමණක් පිළිගත යුතුය.

4. අමුකස්මිං නාම ආවාසේ ඒකෝ ථේරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතා ගමා, ධම්මධාර විනයධරා, තස්ස මේ ථෙරස්ස සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහීතං, අයං ධම්මෝ, අයං විනයෝ, ඉදං සත්ථු සාසනන්ති.

යනුවෙන් අසවල් ආවාසයෙහි බහුශ්‍රැත වූ ත්‍රිපිටකයෙහි ඇසූ පිරූ තැන් ඇති ධර්මධර විනයධර මාතිකාධර වූ එක් ස්ථවිර භික්ෂුවක් වෙසෙයි. මා විසින් මෙය ඒ තෙරුන්ගෙන් අසන ලදී. ඒ තෙරුන් ඉදිරියේදීම පිළිගන්නා ලදී යනුවෙන් යමෙක් පැවැසුවද එය එක්විටම පිළිගැනීමද, ප්‍රතික්ෂේප කිරීමද නොකළ යුතුය. සූත්‍රයෙහි විනයෙහි බහා බලා ඊට ගැළපේ නම් පමණක් පිළිගත යුතුය.

භාග්‍යවතුන් වහන්සේ මහා පරිනිබ්බාණ සූත්‍රයේදී දේශනා කළ මේ සතර මහාපදේස එදාටත් වඩා වර්තමානයේදී අපට ධර්මය, අධර්මය කුමක්ද යන්න තේරුම් ගැනීමට ඉතා වැදගත් උපදේශ සතරක් වී තිබේ.

වර්තමානයේ ඇතැම් දෙනා බුදු දහමද අනුගමනය කරන්නට උත්සුක වන්නේ එක්තරා රැල්ලකට අනුව බව පෙනේ. ඇතැම් දෙනා එක් හිමිනමක් කේන්ද්‍ර කරගෙන උන්වහන්සේගේ දේශනාවම බුද්ධ වචනය යැයි ගමන් කරන බව පෙනේ. ඇතැම් දෙනා විශාල පිරිසක් ඒ වටා ඒකරාශීව සිටින නිසා ඒ තැන්වල ධර්මය ඇතැයි ගමන් කරන බවක් පෙනේ. මේ නිසා වර්තමානයේ දැකිය හැකි ප්‍රවණතාවක් වී ඇත්තේ සුන්දර, නිසංසල ගමේ පන්සල් පොහෝ දිනයන්හි පවා ජනයාගෙන් හිස්වීමය. බොහෝ දෙනා බොහෝ පිරිස් රැස්වන ප්‍රසිද්ධ විහාරාරාම සොය සොයා යාමට පුරුදු වී තිබේ.

බුදුරජාණන් වහන්සේ වදාළ සතර මහාපදේසවලට අනුව අප ධර්මය, අධර්මය තේරුම් ගත යුත්තේ සූත්‍රයෙහි, විනයෙහ් ගැළපේ නම් පමණි. බොහෝ උගත්කම් ලබා තිබූ




පමණින්, බොහෝ පිරිස් රැස්වූ පමණින්, බොහෝ පිරිසකට ගුරු වූ පමණින් එතැන ධර්මය ඇතැයි තීරණය කිරීම බුදුන් වහන්සේ අනුදත් ක්‍රමය නොවේ. ත්‍රිපිටක බුද්ධ භාෂිතය නිර්මලව පවත්නා මෙකලදී ඒ බුද්ධ වචනය හා ගළපමින් අපට ඇසෙන දේශනා තම තමා විසින්ම විමසා තේරුම් ගැනීමට උත්සාහවත් විය යුතුය.

එසේම කාලාම සූත්‍රයේදී දේශිත පරිදි යම් දේශනාවක් තුළින් තම සිතේ අලෝභ, ද්වේෂ, අමෝහ යන කුසල මූල වැඩෙයිද එය ධර්මය බවත් යම් දේශනාවකින් තම සිතේ ලෝභ, ද්වේෂ, මෝහ අකුසල මූල වැඩෙයිද එය අධර්ම දේශනාවක් බවත් තේරුම් ගත යුතුය.

**පූජ්‍ය හෙම්මාතගම පියදස්සි හිමි**

"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - විනීල ජාතකය"



# මිහිඳු හිමි සමග ආ පිරිවර ගැන ඔබ දන්නේ මොනවාද?

ධර්මාශෝක රජු කල දඹදිවදී මොග්ගලීපුත්තතිස්ස හිමි ප්‍රධානව තුන්වෙනි සංඝායනාව සිදුවිය. එහිදී ශාසනයට විරුද්ධ මතධාරී දුසිල් භික්ෂූන් ඉවත් කර ථෙරවාදී බුදු දහම පවිත්‍ර කරන ලදී. මෙම සංඝායනාවේ මූලිකත්වය ගත් මොග්ගලීපුත්තතිස්ස හිමිගේ ශාරීරික ධාතු සාංචි දාගැබේ ධාතු කරඬුවල එතුමාගේ නම සහිතව ලියා තිබී හමුවූ බව රීස් ඩේවිස් ''බෞද්ධ ඉන්දියාව'' ග්‍රන්ථයේදී පෙන්වා දෙයි. පවිත්‍ර වූ බුදු දහම දඹදිව වයඹදිග, මැද, උතුර, ශ්‍රී ලංකාව ඇතුළු ප්‍රදේශ හා රටවල් නවයකට යැවූ බව වංශ කතා කියයි. මහා වංශයට වඩා පැරණි ''සමන්ත ප්‍රාසාදිකා'' හා ''දීපවංශයේ'' ද මේ තොරතුරු එයි.

ඉන් ප්‍රදේශ නවයකට යවා ඇත්තේ එක් රහත් හිමිනමක් ප්‍රධාන දූත පිරිස්ය. එක් රහත් නමක් බැගින් වැඩි ප්‍රදේශ මෙසේය. කාශ්මීර-ගන්ධාර, මහීෂ මණ්ඩල, වනවාසී දේශ, අපරන්තන, මහාරාෂ්ට්‍ර, යවන දේශ, හිමවන්තා ප්‍රදේශ, මේ ස්ථාන දඹදිව තුළම විවිධ ස්ථාන තුළ පැතිර තිබුණි.

ස්වර්ණභූමි අද මියන්මාරය බව පෙනෙයි. සෝත-උත්තර යන දෙනම එහි වැඩ ඇත. දෙනමක් වැඩි එකම ප්‍රදේශය ස්වර්ණභූමියයි.

දූත පිරිස් හතකට ඇතුළත් වූයේ එක් රහත් හිමිනමක බැගිනි. ස්වර්ණභූමියට දෙනමකි.

මහාවංශ දොළොස් වන පරිච්ඡේදයේ අටවන ගාථාවේ සිට ලංකාවට වැඩි ධර්මදූත පිරිස විස්තර වෙයි. මේ ධර්ම ප්‍රචාර කටයුතු ඇරඹෙන විට ලංකාවේ රජ කළේ මැදි වයස පසු කළ මුටසීව රජුය. කොඩ්රින්ටන් ''ලංකා ඉතිහාසය'' අනුව මුටසීව රජුගේ රාජ්‍ය කාලය ක්‍රි.පූ. 367-307 අතර වෙයි. මේ මහළු රජුගෙන් ශාසනයට ලැබිය හැකි ප්‍රයෝජන අඩු බැවින් පෑතිස් කුමරු රජ වනතුරු ලාංකික දූත පිරිස් මධ්‍ය ඉන්දියාවට වැඩ මිහිඳු හිමිගේ මෑණියන් වූ දේවි බිසව ළඟ විසූ කාලය මේ ධර්මදූතයන් ලංකාවට වැඩීමට පෙර එදා ලාංකික ප්‍රකෘත භාෂාව හැදෑරීමට උනන්දු වූ බව පෙනෙයි. ඉන් සාමාන්‍ය ජනතාවට වැටහෙන පරිදි ධර්මය දේශනා කිරීමට පහසුකමක් මතු විය.

වංශ කතාවල පළමුව ලංකාවට වැඩි ධර්මදූත පිරිස පස්නමක් ලෙස දක්වෙයි. මහා මහින්ද, ඉට්ඨිය, උත්තිය, සම්භල, භද්දසාල, ලංකාවට වැඩි පස් නම වංශ කතාවල මුලින් සඳහන්ය. වෙනත් දූත පිරිස්වලට ඇතුළත් වූයේ එක් නමකි. එක් දූත පිරිසකට දෙනමක් ඇතුළත් විය. එහෙත් ලංකාවට පස් නමක් වැඩි බව මුල් තොරතුරුවල එයි. මේ පස් නමගේ නම් අනුරාධපුර අග කාලයට අයත් මිහින්තලා ශිලා ලිපියේ සඳහන් වෙයි. මේ දූත පිරිසේ නායකත්වය ගත්තේ අශෝක රජු හා දේවී කුමරිය ලද පුතා වූ මිහිඳු හිමිය. ලංකාවට වැඩි ධර්මදූත පිරිස ප්‍රමාණයෙන් වැඩි වූවා මෙන්ම අශෝක රජ පවුලට තිබූ නෑදෑකමද ප්‍රබල විය. ඒ අනුව ලංකාවට අශෝක රජු දක්වූ උනන්දුව ඉතා වැඩිව තිබූ බව පෙනී යයි. ලාංකික උපසම්පදාව ඇතිකර ලාංකික භික්ෂු පරපුරක් බිහිකිරීම ධර්මාශෝක රජුගේ අරමුණ විය.

මුටසීව රජු ඇවෑමෙන් පෑතිස්

"උත්සාහවන්තයා සියල්ල ජයගනී - වණ්ණුපථ ජාතකය"

කුමරු රජ විය. (ක්‍රි.පූ. 250-210) අලුත් රජුගෙන් ධර්මය පැතිරවීමට ඇති උනන්දුව වැඩි බව දූත පිරිස දැන සිට ඇත. මේ ධර්මදූත පිරිසට වංශ කතාවල පසුකාලීන වාර්තා තවත් නම් දෙකක් එකතු කරයි. ඒ සුමන සාමණේර හා භණ්ඩුක උපාසකයි. සුමන සාමණේර යනු සංඝමිත්‍රා කුමරිය පැවිදි වීමට අග්ගිදත්ත කුමරු හා විවාහව ගිහි කල ලද පුතාය. ඒ අනුව සුමන සාමණේර හිමි අශෝක රජුගේ මුණුබුරාය. භණ්ඩුක උපාසක මිහිඳු හිමිගේ මව වූ වේදිස දේවියගේ කිට්ටු නෑයෙකි.

මෙම දෙදෙනා මුල් ධර්මදූත කණ්ඩායමට පසුව පැමිණ එකතු වූ බව සිතිය හැක. ඒ අනුව මුළු ධර්මදූත පිරිස හත්නමක් විය.

මිහිඳු හිමි හා පිරිස සෘද්ධියෙන් වැඩි බව වංශකතා කියයි. ගල්ඔය රජගල ලෙන් ලිපියක ''ඉදිය අගතන'' (සෘද්ධියෙන් පැමිණි) යන යෙදුමද ඒ පිරිස සෘද්ධියෙන් වැඩි බවට සාධකයකි. එහෙත් මහාචාර්ය පරණවිතාන ඉදිය අගතන > ලංකාවේ සෞභාග්‍යය සඳහා වැඩි > යන අර්ථය එයට දෙයි. පොල්වත්තේ බුද්ධදත්ත හිමි හා මහාචාර්ය පරණවිතාන අනුව මේ ධර්මදූත පිරිස වෙළෙඳ නැව් මගින් ලංකාවට වැඩි බවට අනුමාන කරති.

මහාවංශයේ පැතිස් රජු හතළිස් දහසක් පිරිවර පිරිවරා මිහින්තලාවට මුව දඩයමේ ගිය බව කියයි. එතරම් පිරිවර දඩයමට නොව මිහිඳු හිමි හා පිරිස කලින් සැලසුම් කළ පරිදි මිහින්තලයට වඩින බව කලින් දැන පිළිගැනීමට ගිය ගමනක් බව පෙනී යයි. ලංකාවේදී මිහිඳු හිමි රජුට මුලින්ම දේශනා කළේ ධර්මය අසා රජු හා ඇමැතිවරු බුදු දහම වැළඳ ගත්හ. ඉන්පසු අපවත්වීම දක්වා මේ ධර්මදූත පිරිස් ලංකාවේම රැඳී සිට ඇත. අපවත් වූයේද ලංකාවේදීය.

පැතිස් රජුගේ සියලු ආගමික කටයුතුවල උපදේශක වූයේ මිහිඳු හිමිය. වෙස්සගිරිය, ථූපාරාමය, ජය ශ්‍රී මහා බෝධිය පිහිටුවීම, මහායාන දාන ශාලාව ඇතුළු සියලු කටයුතු ධර්මදූතයන්ගේ උපදෙස් අනුව සිදුවිය. රජගල ලෙන් ලිපියේ ලංකාවට වැඩි ඉට්ඨිය, මහින්ද යන හිමිවරුන්ගේ ධාතු තැන්පත් කළ දාගැබක් ගැන කියයි. මිහිඳු හිමි ප්‍රධානියා වුවද දූත පිරිසේ වැඩිමහල් හිමි නම ඉට්ඨිය හිමි බව රජගල ලෙන් ලිපියෙන් පෙනී යයි.


අභයගිරි හිමිනමක් සංස්කෘතයෙන් ලියූ දැනට අවුරුදු විස්සකට පමණ පෙර ''රිවිරැස'' පත්‍රයේ කොටස් ලෙස පළවූ ''ශ්‍රමන දූත'' සංස්කෘත සන්දේශ කාව්‍ය සොයා ගත් කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය මිල්ටන් කුමාරනායක පරිදි අශෝක ධර්මය පවා මිහිඳු හිමි ලංකාවට ගෙනවුත් ඇත. මග දෙපස ගස් සිටුවීම, සතුන් පෝෂණය කිරීම ඒ අතර විය.

මහායාන මූලාශ්‍ර අනුව මිහිඳු හිමි අශෝක හිමිගේ බාල සහෝදරයකු බව කියවෙයි. මිහිඳු හිමි වැඩියේ පැතිස්ට පසු රජ වූ උත්තිය රජු කල (ක්‍රි.පූ. 267-257) බව පෙනෙයි.

මිහිඳු හිමි හා පිරිස ලංකාව පුරාම බුදු දහම පතුරුවා ලාංකික උපසම්පදාවක් ස්ථිරව ඇති කළේය. පාලි අටුවා සිංහලට පරිවර්තනය කරවීය. ඒවා ''හෙට්ඨුවා'' නමින් ප්‍රකට විය.

''සමන්ත ප්‍රාසාදිකාව'' අනුව මිහිඳු හිමි ප්‍රධානව ථූපාරාමයේදී විනය සංඝායනාවක් පවත්වා ඇත. මේ තොරතුරු වෙන කිසිම වංශ කතාවක නැත.

මිහිඳු හිමිගේ උපදෙස් පිට පැතිස් රජු දඹදිවට දූතයන් යවා තම නැගණිය වූ සංඝමිත්‍රා තෙරණිය ඇතුළු දොළොස් නමක් ජය ශ්‍රී මහා දක්ෂිණ ශාඛාව සමග ලංකාවට වැඩමවා මෙහෙණි සස්න ඇති කළේය. ඇගේ ලංකාගමනය දඹදිව සාංචි තොරණේ කැටයම් කර ඇති බව රීස් ඩේවිස් පෙන්වා දෙයි. ඇයට පැතිස් රජු මෙහෙණි අසපු දොළහක් කරවීය. ජය ශ්‍රී මහා බෝධිය අදත් වැඩ සිටියි.




මිහිඳු හිමි උපදෙස් පරිදි සුමන සාමණේර හිමි දඹදිව යවා බුද්ධ ධාතු පුරවාගෙන බුදු හිමිගේ පාත්‍ර ධාතුව ලංකාවට වැඩමවීය. සෙන්කඩගල මුල් කල දක්වා පාත්‍රා ධාතුව ලංකාවේ වැදගත් විය.

මිහිඳු හිමි උත්තිය රජු කල වයස අසූව පිරී ලංකාවේදී අපවත් විය. ඉන්පසු සංඝමිත්‍රා තෙරණිය අපවත් වූවාය. මේ සුමන සාමණේර හිමි අපවත් වූ කාලය සොයාගැනීම දුෂ්කරය.

**එස්. කේ. ජයවර්ධන**

''අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති - අපණ්ණක ජාතකය''



# 1 ඔබේ දහම් දැනුම

## ඔබම පිරික්සා ගන්න

අදින් ඇරඹෙන අලුත්ම විශේෂාංගය

- නිවැරදි හෝ වඩාත් ගැළපෙන වරණය තෝරා ඊට අදාළ අංකය සහිත කොටුවේ (x) සලකුණ යොදන්න. ඔබ සලකුණු අංකය නිවැරදි යැයි බලන්න මෙහි 24 වැනි පිටුවට ඇස යොමු කරන්න. මෙය ඔබේ දැනුම ඔබටම තීරණය කළ හැකි දහම් පැන අභ්‍යාසයකි.

(1). කාලාම සූත්‍රය පුරා දිවෙන අර්ථය නම්,

1. සියලු දේ ගැන සැක කළ යුතු බවයි.
2. අන් අයගේ අදහස් හා එකඟ විය යුතු බවයි.
3. ධර්මානුකූල බව හා ප්‍රඥාව අවදි කොට කටයුතු කළ යුතු බවයි.
4. පාරම්පරික අදහස් පිළිගත යුතු බවයි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

(2). විෂම සමාජයක් තුළ ජීවත් වන අපට වරදෙහි නොබැඳී දුසිරිතෙහි නොගැලී සිටීමට ආදර්ශ ලබාගත හැක්කේ බුදුරජාණන් වහන්සේගේ,

1. මහා කරුණාවෙනි.
2. පද්මාකාර ජීවිතයෙනි.
3. මහා ප්‍රඥාවෙනි.
4. තාදි ගුණයෙනි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

(3). මිනිස්සු රාගයෙන් රාගයටම යති, ද්වේශයෙන් ද්වේශයටම යති, මෝහයෙන් මෝහයටම යති. මේ ලක්ෂණය බුදු දහමේ හැඳින්වෙන්නේ,

1. අනුසෝතගාමී යනුවෙනි.
2. පටිසෝතගාමී යනුවෙනි.
3. මෝහාධික යනුවෙනි.
4. රාගාධික යනුවෙනි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

(4). "ස්වාමීන් වහන්ස, බොහෝ මහණ බමුණෝ කේසපුත්තයට එති. ඔවුහු තමන්ගේ ආගමික මතයම පවසති, අනුන්ගේ මතයට ගරහති...." මෙසේ ප්‍රකාශ කරන ලද්දේ,

1. කාලාමයන් විසිනි.
2. වජ්ජීන් විසිනි.
3. මල්ලවයන් විසිනි.
4. ශාක්‍යයන් විසිනි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

(5). බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ පද්මාකාර ජීවිතය පිළිබඳව පැහැදිලි කළේ,

1. උපාලි ගෘහපතියාටය.
2. උපක ආජීවකයාටය.
3. ද්‍රෝණ බමුණාටය.
4. භාරද්වාජ බමුණාටය.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

(6). කාලාම වැසියන්ගේ සිතීමේ හා විමසීමේ නිදහස අවදි කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කළ කරුණක් වන්නේ,

1. මතුපිට ස්වරූපය අනුව යමක් නොපිළිගත යුතුය යන්නයි.
2. තමාට අනවශ්‍ය නිසා නොපිළිගත යුතුය යන්නයි.
3. කියන්නා නොහඳුනන නිසා නොපිළිගත යුතුය යන්නයි.
4. වෙනත් කෙනෙක් කියන නිසා නොපිළිගත යුතුය යන්නයි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

(7). වෛර කරන්නවුන් අතර අපි වෛර නොකර සුවසේ වෙසෙමු. ඒ බව අවධාරණය කරමින් දේශනා කළ ගාථාවේ මුල් පදය වන්නේ,

1. "අක්කොච්ඡි මං අවධිමං" ය.
2. "සුසුඛං වත ජීවාම" ය.
3. "අසාරේ සාර මතිනො" ය.
4. "සබ්බේ තසන්ති දණ්ඩස්ස" ය.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

(8). තමා උපමා කොට වරදින් වැළකී සිටීමේ ක්‍රමය බුදු දහමේ හැඳින්වෙන්නේ

1. අත්තාධිපතෙය්‍ය නමිනි.
2. සල්ලේඛ ප්‍රතිපදාව නමිනි.
3. අත්තූපනායික ධර්මපර්යාය නමිනි.
4. මධ්‍යම ප්‍රතිපදාව නමිනි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

(9). බුදුරජුන් ව්‍යග්ඝපජ්ජ සූත්‍රය දේශනා කළේ කා හටද?

1. උපාලි ගෘහපතිට.
2. ද්‍රෝණ බමුණාට.
3. උපක ආජීවකයාට.
4. භාරද්වාජ බමුණාට.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

(10). ලෝවැඩ සඟරාව රචනා කළේ කවුරුන් විසින්ද?

1. තොටගමුවේ රාහුල.
2. වීදාගම මෛත්‍රී හිමි.
3. අලගියවන්න මුකවෙටි.
4. මයුරපාද හිමි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|

නිවැරදි පිළිතුරු 32 පිටුවේ



## වීර්යය වැඩීමේ අනුහස් ගැන කියැවෙන

# මහාශීලව ජාතකය

සණරාමර වූ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි එක්තරා පසුබට වීර්යය ඇති භික්ෂු කෙනෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය දේශනා කොට වදාළ සේක. බුදුරජාණන් වහන්සේ එම භික්ෂුව අමතා, සැබෑද මහණ, ඔබ පසුබට වීර්යය ඇත්තේදැයි විචාළ සේක. ස්වාමීනි එසේය කී විට, මහණ, ඔබ කවර කාරණයක් නිසා මෙවැනි නෛර්‍යාණික ශාසනයෙහි මහණ වී වීර්යය හැරලූයේ ද? පෙර නුවණැත්තෝ රාජ්‍යයෙන් පිරිහී ගියත්, තමන්ගේ වීර්යය නැසී ගියත්, යාසස ඉපදවූයේ වේදැයි වදාරා මෙම අතීත කථාව ගෙනහැර දැක්වූ සේක.

බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකුන් රාජ්‍ය කරන කාලයෙහි අප මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන්ගේ කුස පිළිසිඳ ගත්තේය. ඒ බෝධිසත්වයන්ට 'ශීලව' කුමාරයෝ යැයි නම් තැබූහ. සොළොස් හැවිරිදි වියේ දී සියලු ශිල්පයන්හි කෙළපැමිණ, සිය පියාණන්ගේ ඇවෑමෙන් 'මහාශීලව' රජ්ජුරුවෝ යන නමින් ප්‍රකට විය. ඒ රජු ධාර්මිෂ්ඨය, ධර්මයෙන් රාජ්‍යය කෙරෙයි. නුවර සතර වාසල් දොර සමීපයෙහි දන්හල් කරවා දුගී, මගී යාචකාදීන්ට දන් දුන්හ. නිරන්තරයෙන් පන්සිල් රැක්කේය. පොහොය පෙහෙවස් සමාදන් විය. ක්‍ෂාන්ති, මෛත්‍රී, කරුණාවෙන් යුක්තව සියලු සත්වයන් සතුටු කරවමින් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කළහ.


"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්ද්‍රගුත්ත ජාතකය"

මේ රජ්ජුරුවන්ගේ එක් ඇමතියෙක් අන්තඃපුරයට වැදතමා කළ කාර්යයත් ප්‍රසිද්ධියට පත් කළේය. මේ බව දත් සෙසු අමාත්‍යයෝ රජ්ජුරුවන්ට එපවත් දැන්වූහ. රජ්ජුරුවෝ තමාම පරීක්‍ෂා කොට එය සත්‍ය බව දැන, ඒ අමාත්‍යයා කැඳවා, නුවණැති තා විසින් නොකළ යුතු දෙයක් කර ඇත. එහෙයින් නුඹ මගේ විජිතයේ වසන්නට නුසුදුසුය. ඔබ ඔබේ වස්තුවත්, අඹුදරුවනුත් රැගෙන වෙනත් තැනකට පළායන්නැයි රටින් නෙරපූහ. ඒ අමාත්‍යයාත් කසී රටින් නික්ම කොසොල් රජුගේ රාජ්‍යයට ගොස් රජ්ජුරුවන්ට සේවය කරමින් ක්‍රමයෙන් රජ්ජුරුවන්ට විශ්වාසවන්තව, එක් දවසක් කොසොල් රජු අමතා, රජ්ජුරුවන් වහන්ස, බරණැස් නුවර රාජ්‍යය මීවදයක් හා සමානය. ඉතා මොළොක්ය. ස්වල්ප වූ සේනාවකින් රාජ්‍යය පැහැර ගන්නට පුළුවන් වේයැයි කීවේය. රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා, බරණැස් නුවර රාජය්‍ය නම් විශාලය. මොහු ස්වල්ප වූ බල වාහනයකින් රාජ්‍යය ගන්නට පුළුවනැයි පැවසීය. මේ ඒ රජ්ජුරුවන්ගේ චර පුරුෂයෙකුදැයි සිතා, තෝ චර පුරුෂයෙකුදැයි විමසීය. මම චර පුරුෂයෙක් නොවෙමි. ඇත්තම කියමි. මගේ බස් නොඅදහන්නේ නම් මනුෂ්‍යයන් යවා පසල් දනව්වෙන් ගමක් නසනු මැනවි.


මොහු ඉතා නිර්භීතව කියන මෙම කරුණු පරීක්‍ෂා කරමියි සිතා තම රාජ පුරුෂයන් යවා පසල් දනව්වෙන් ගමක මිනී මරා කොල්ලකෑවෝය. ප්‍රත්‍යන්ත ජනපදයේ මනුෂ්‍යයෝ දරුවනි, කවර කාරණයක් නිසා ගම පැහැරලූවේදැයි විචාළහ. එවිට ජීවත් විය නොහැකි නිසා ගම කොල්ලකෑ බව කී කල්හි, මෙතෙක් කල් මා සමීපයට නොආවේ ඇයි ද? මෙයින් පසු මෙවැන්නක් නොකරන්නැයි කියා ඔවුන්ට සම්පත් දී යැවූහ. ඒ මනුෂ්‍යයෝ කොසොල් රජ්ජුරුවන්ට එපවත් දැන්වූ කල්හි නැවත මධ්‍ය ජනපදයක් පැහැරලූහ. ඒ සොරුන් ද බරණැස් රජ්ජුරුවෝ පළමු පරිද්දෙන්ම සම්පත් දී යැවූහ. කොසොල් රජ්ජුරුවෝ නැවතත් පුරුෂයන් යවා වීදි මැද මිනී මරා කොල්ලකෑවූහ. රජ්ජුරුවෝ ඒ සොරුන්ටත් සම්පත් දී යැවූහ. එකල්හි කොසොල් රජු, බරණැස් රජු ඉතා ධාර්මිෂ්ඨ රජ්ජුරු කෙනෙකැයි දැන, බරණැස් නුවර පැහැර ගනිමියි සේනා වාහන ගෙන එහි නික්මුණහ.

බරණැස් රජුගේ මහා යෝධයෝ කොසොල් රජු යුද්ධයට එන බව බරණැස් රජු වෙත දන්වා, කොසොල් රජු පළවා හරිමුයි පැවසූහ. එවිට බරණැස් රජතුමා මේ රාජ්‍යය කැමති කෙනෙක් ගනිත්වා. ඔබ හැමදෙනා යුද්ධයට නොයන්නැයි කීහ. ඇමතියෝ නැවතත් රජතුමාට යුද්ධයට යමුයි කී කල්හි පළමු පරිද්දෙන්ම වළකාලූහ. මේ අතර කොසොල් රජ්ජුරුවෝ නුවරින් පිටත නතර වී සිට රාජ්‍යය දෙන ලෙස හෝ යුද්ධයට එන ලෙස බරණැස් රජුට දන්වා යැවූහ. එවිට බරණැස් රජ්ජුරුවෝ, මා යුද්ධ කරන්නේ නැත. රාජ්‍යය ගන්නැයි දන්වා යැවූහ. එවිට ඇමතියෝ නැවතත් අපි රාජ්‍යය නොදෙන්නෙමු. කොසොල් රජු හා යුද්ධ කොට ඔහු අල්ලාගනිමුයි කී විට, බරණැස් රජු පළමු පරිද්දෙන්ම එය වළකා අමාත්‍යයන් දහසක් දෙනා සමග ප්‍රාසාදයේ මතු මහල් තලයෙහි සිංහාසන මස්තකයෙහි උන්නාහ. කොසොල් රජ්ජුරුවෝ මහත් වූ සේනා වාහන සමග බරණැස් නුවරට පැමිණි කල්හි, තමන් හා යුද්ධ කිරීමට එකම බටයෙකුදු නොසිටි නු දැක, ඇර තිබූ වාසල් දොර මතින් මහල් තලයට නැග, අමාත්‍යයන් දහසක් දෙනා සමග රජ්ජුරුවන් අල්ලා පිටිතල හයා බැඳ, අමුසොහොනකට ගෙන ගොස් වළක් හාරා, කරවටක් පස් දමා වළලා අමුසොහොනෙහි සිවල්ලු ඇවිත් මොවුන් කතැයි සිතා හැරදා ගියහ. රජු සමග අමාත්‍යයන් දහසක් දෙනා කොසොල් රජු කෙරෙහි ක්‍රෝධ නොකොට, මෛත්‍රී කර නිහඬව සිටියහ.

රාත්‍රියේ එහි පැමිණි කැණහිලු රජු ඇතුළු පිරිස දැක පලා ගොස් නැවත වරක් පැමිණි විට පෙර පරිද්දෙන්ම අඬගැසූහ. මෙසේ තුන් වාරයක් පෙරළා පැමිණි පිරිසෙන් එක් කැණහිලෙකුටවත් පීඩාවක් නොසිදු වූ බැවින් නායක කැණහිලා රජ්ජුරුවන් කරා ගියේය. අනෙක් අය සෙසු අමාත්‍යයන් සමීපයට ගියහ. ඇතුන්ගේ බලය ඇති රජ්ජුරුවෝ තමන් සමීපයට එන කැණහිලාට තමන් ඩැහැගන්නට අවසර දෙන්නාක් මෙන් කර ඔසවා, ඔහුගේ යට උගුර තදින් අල්ලා ගත්තේය. නිකටින් ඇදගෙන තර කොට මිරිකා ගත්තේය. කැණහිලුන් විසිර ගිය විට වළෙන් ගොඩනැගුණු රජ්ජුරුවෝ අනෙක් අමාත්‍යයන් අස්වසා ගොඩගත්හ.



රජ්ජුරුවෝ හා අමාත්‍යයන් අමුසොහොනෙහි සිටින විට, සොහොනට මිනියක් දැමීමට පැමිණි මනුෂ්‍යලෙ ා් ඒ මිනිය යක්ෂයන් දෙදෙනෙකුගේ සීමාවට දැමූහ. ඒ යක්ෂයෝ දෙදෙනා මිනිය බෙදාගත නොහැකිව, 'ශී ලව' රජු ධර්මිෂ්ඨය, උන්වහන්සේ අපට බෙදා දෙන සේ ක. රජු සමීපයට මළමිනිය ගෙන ගොස් රජ්ජුරුවන් වහ ාන්ස, අපට මේ මිනිය බෙදා දෙන්නැයි කීහ. එවිට බෙ ෝසත්තුමා, යක්ෂයනි, මම තොපට මෙම මිනිය බෙදා ෙ ාදමි. මම දැනට පිරිසිදු නොවෙමි. එබැවින් පළමු කොට : නාමියි කීවේය. යක්ෂයෝ සතුරු රජුගේ සුවඳකැවූ පැ: න් තමන්ගේ ආනුභාවයෙන් ගෙනැවිත් රජ්ජුරුවන්ට නානු පිණිස දුන්නාහ. ස්නානය කළ කල්හි



සතු රු රජ්ජුරුවන්ගේ සළු ගෙනැවිත් දුන්හ.. මේ සළු ඇඳ ගෙන සිටි රජ්ජුරුවන්ට කරඬුවක් ගෙනැවිත් දුන්හ. සුව ඳ විළවුන් ගල්වාගත් රජුට මැණික්, තල්වැට, නොයක් මල ් ගෙනැවිත් දුන්හ. මල් පැලඳූ රජතුමාගෙන් වෙනත් අ ාශ්‍ය කුමක්දැයි විමසූහ. රජු තමන්ට කුසගිනි ඇති නි යාව ඇඟවූහ. යක්ෂයෝ ගොස් සතුරු රජ්ජුරුවන්ගේ නායෙක් අග්‍ර රසයෙන් යුක්ත වූ භෝජන ගෙනැවිත් දු ත්හ. රජතුමා සඳුන් පැණින් නා, සැරසී, රසයෙන් යුක්ත ද ු භෝජන අනුභව කළහ. පැන් බී මුඛය සෝදා, අත සෝදා, තව කුමක් කරන්නදැයි විමසූ විට, සතුරු රජුගේ හිස අභියස තිබූ මඟුල් කඩුව ගෙනෙන්නැයි කී විට එය ද ගෙනාවාහුය. රජු කඩුවෙන් ගසා මිනිය දෙපළු කොට යක්ෂයන් දෙදෙනාට සමානව බෙදා දුන්හ. ඒ කඩුව සෝදා එල්ලාගෙන, උරයේ බැඳගත්හ.

ඉක්බිති ඒ යක්ෂයෝ සතුටු සිත් ඇතිව, රජතුමනි ඔබට වෙනත් කළ යුත්තේ කුමක්දැයි විමසූහ. එසේනම් තොපගේ ආනුභාවයෙන් මම සතුරු රජුගේ ශ්‍රීයහන අසළට රැගෙන යන්නැයි කියා, එසේ ගිය විට සතුරු රජු නින්දට වැටී සිටිනු දැක්කේය. එකල්හි බියට පත්වූ කොසොල් රජු, ප්‍රදීපාලෝකයෙන් ශීලව මහරජු දැක, හැඳින, ධෛර්යය උපදවාගෙන මෙසේ කීහ. ඔබ කුමක් නිසා රැකවල් ලා තිබියදී යහන මත්තට ආවේදැයි විමසීය. එවිට ශීලව රජ්ජුරුවෝ තමන් ආ සැටි විස්තර කොට කීවේය. එවිට සතුරු රජ්ජුරුවෝ, කළකිරුණු සිත් ඇති මහරජතුමනි, මම මනුෂ්‍යයෙක්ව සිටියත් ඔබේ ගුණ නොදත්තෙමි. චණ්ඩ, පරුෂ යක්ෂයන් ඔබේ ගුණ දක්නා ලදී. මෙබඳු ශීල ගුණයෙන් යුක්ත වූ ඔබ කෙරෙහි ද්‍රෝහිකමක් නොකරමි. කඩුව ගෙන සපථ කොට, රජ්ජුරුවන් ක්ෂමා කරවාගෙන මහයහනෙහි සතපවා, තමන් සුළු යහනක සැතපී, ඉර නැගී පහන් වූ කල්හි, බෙර හඬ ලවා සියලු සේනාව හා අමාත්‍යන්, ගෘහපතීන් රැස්කරවා ඒ පිරිස හමුවේ නැවත ක්ෂමා කරවාගෙන රාජ්‍යය පාවා දී, මින් පසු ඔබවහන්සේට සතුරු උපද්‍රවයක් ඇත්නම් මට දන්වන්නැයි කියා, සේනා වාහන සමග තම රාජ්‍යයට ගියේය.

ශීලව රජ්ජුරුවෝ සර්වාභරණයෙන් සැරසී ධවල ඡත්‍රය යට, සිංහාසනයෙහි හිඳ තම සම්පත්තිය බලා, අමාත්‍යයන් දහසක් දෙනාගේ ජීවිත ප්‍රතිලාභයත්, මගේ ජීවිත ප්‍රතිලාභයත්, වීර්යය නොකළා නම් කිසිවක් සිද්ධ නොවන්නෙය. වීර්යය බලයෙන් මම නැතිවූ යසස ලබා ගතිමි. අමාත්‍යයන් දහසක් දෙනාට ජීවිතය ලබා දුන්නෙමි. ඒකාන්තයෙන් ප්‍රාර්ථනා කළ වස්තුවෙහි ආලය නොකර වීර්යය කළ යුතුය. වීර්යය ඇති සත්වයාට මෙබඳු සමෘද්ධීන් ඇති වන්නේය. මහබෝසතාණෝ, පින්වත්නි, සිල්වතුන්ගේ වීර්යය බලයෙහි ඵල නම් මෙසේ සමෘද්ධ වන්නේයැයි පවසා දිවි පමණින් කුසල් කොට කර්මානුරූපීව මිය පරලොව ගියේය.

එම අතීත කතාව ගෙනහැර දක්වා, ධර්ම දේශනා කර භාග්‍යවතුන් වහන්සේ චතුස්සත්‍යය දේශනා කළ සේක. චතුස්සත්‍ය දේශනාවෙහි කෙළවර පසුබට වීර්යය ඇති භික්ෂුව රහත් ඵලයෙහි පිහිටියහ. එකල දුෂ්ට වූ අමාත්‍යයා නම් දෙව්දත් තෙරණුවෝය. දහසක් අමාත්‍යයෝ නම් දැන් බුදු පිරිසය. මහාශීලව රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේමය. මහාශීලව ජාතකයෙන් හෙළිවන පරිදි වීර්යයෙහි බලය දැන හඳුනාගෙන වීර්යවන්තව කුසල් පුරා, මෙම සසර සයුරෙන් එතෙර වීමට අප ද උත්සුක වෙමු.

**කේ. මීගහකුඹුර**

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක.

# රජතුමනි... ඔබ මේ රටේ භාරකරු මිස අයිතිකරු නොවේ..!



## මිහිඳු හිමි එසේ කීවේ ඇයි?

'රජතුමනි, ඔබ මෙම භූමියේ භාරකරු මිස අයිතිකරු නොවේ' යැයි මිහිඳු මාහිමියන් විසින් දේවානම්පියතිස්ස රජු හට ප්‍රකාශ කරන ලදී.

මින් අදහස් කළේ රටක පාලකයකු විසින් ඔහුගේ හිතුමතයට භූමිය හා එහි සම්පත්, ගහකොළ හා ජීවීන්ද පරිහරණය නොකළ යුතු බව පමණක් නොව භූමියේ භාරකරු වශයෙන් රජතුමා විසින් එයට අයත් සියලු දෑ සංරක්ෂණය කළ යුතු බවය.

පරිසර සංරක්ෂණය පිළිබඳ නවීන සංකල්පය මෙයට බොහෝ දුරට නෑකම් කියන්නකි. එනම් පරිසරය සම්බන්ධයෙන් ඔබගේ ප්‍රධාන වගකීම වන්නේ රජ අන් අය වෙනුවෙන් සංරක්ෂණය කළ යුතුය යන පණිවුඩයයි.

ඒ අනුව අද මිනිස් සමාජයේ පැවැත්මට හා ආරක්ෂාවට බලවත්ම සාධකයක් බවට පත්ව ඇති මෙම "පරිසර සංරක්ෂණය" පිළිබඳ සංකල්පය බොහෝ අය සිතා සිටින පරිදි බටහිර ලෝකයෙහි ඇතිවී ව්‍යාප්ත වූවක් නොව, මෙයට අවුරුදු දෙදහස් පන්සිය ගණනකට ඉහත ලක්දිව අනුරාධපුරයට නුදුරු මිස්සක පව්ව මුදුනෙන් බිහිවූවකි. මිහිඳු මාහිමියන් විසින් ගෙන ආ දහම් පණිවුඩයේ ඇතුළත් ප්‍රධාන කරුණක් වන "අවිහිංසාව" හුදු වන සතුන්ට පමණක් නොව ගහ කොළටද සාධාරණ වූ බව පෙනෙයි.

මහින්දාගමනයට පෙර සිටම දේවානම්පියතිස්ස රජු හා අශෝක අධිරාජ්‍යයා අතර යම් යම් සබඳතා පැවැති බවත්, ඒ අනුව ඔවුන් දෙදෙනා අතර යම් හිතවත්කමක් ගොඩ නැගී තිබුණු බවත් පැහැදිලිය. ඒ අනුව මිහිඳු මාහිමියන් හට තම දහම් පණිවුඩය දීම සඳහා දේවානම්පියතිස්ස රජතුමා එතුමාගෙන් මාලිග යේදී හමුවිය හැකිව තිබුණි. එසේ නොකොට රජතුමා දඩයමේ යෙදී සිටියදී හමුවීමට මිහිඳු මාහිමියන් ඇතුළු පිරිස තීරණය කළේ තමන් දීමට බලාපොරොත්තු වන "අවිහිංසාව" පිළිබඳ පණිවුඩය ලබාදීමට එය වඩාත් සුදුසු හා ප්‍රායෝගික අවස්ථාවක් මෙන්ම පරිසරයක්ද වූ හෙයින් විය හැකිය.

බුදුන් වහන්සේ මෙන්ම පසු කාලයක භික්ෂූන් වහන්සේද වැඩ සිටි පරිසරය විස්තර කිරීමේදී සාහිත්‍යකරුවා විසින් මෙවැනි සිත්කලු, රුචිර, දකුම්කළු, රමණීය, හුදෙකලා වැනි වචන යොදා ගැනීම සාමාන්‍ය දෙයක් බවට පත්විය. මින් ගම්‍ය වන්නේ බුදු දහම විසින් සංරක්ෂණය වූ රමණීය පරිසරය මිනිස් සමාජයේ අනිවාර්ය අංගයක් බවට සැලකූ බවය. මිහිඳු මාහිමියන්ගේ ගුරත්වය ශාස්තෘවරයාණන් වූ ගෞතම බුදුන් වහන්සේගේ ජීවිතය මෙන්ම උන්වහන්සේ දෙසූ දහමද ස්වභාව ධර්මයට බෙහෙවින් සමීප වූ බව උන්වහන්සේගේ උපත සල් ගසක් යටද, බුද්ධත්වය ඇසතු ගසක් යටද, පිරිනිවන් පෑම සල් ගස් දෙකක් මැදිකොටද සිදුවීමෙන් පෙනේ. ඒ අනුව බෞද්ධ ශිෂ්ටාචාරයේ උපත, ස්වභාව සෞන්දර්යයෙන් ඔපවත් වූ ශාන්ත නිසල පරිසරය සිදුවූ බවට සාක්ෂි එමටය. මිහිඳු හිමියන් තම ජීවිත කාලයෙන් වැඩි කොටසක් ගත කළේ මිහින්තලාව පසුබිම් කොටගෙනය. උන්වහන්සේ පිරිනිවන් පෑවේද එහිමය. ඉන් අනතුරුව උදාවූ කාල පරිච්ඡේදය තුළ රාජ ලෙන කන්ද, කළුදිය පොකුණ වැනි දකුම්කළු ස්වභාවික නිර්මාණයන්ගෙන් යුත් මෙම මිහින්තලා පරිසරය නොයෙකුත් විපර්යාසයන්ට භාජනය විය. ඒ අනුව ජීවත් වෙන සංඝයා වහන්සේ සංඛ්‍යාව මෙන්ම උන්වහන්සේ සඳහා ඉදිවූ වෙහෙර විහාර, ස්ථූප, බෝධි හා පොහොය ගෙවල් ශත වර්ෂයෙන් ශත වර්ෂයට සංඛ්‍යාවෙන් වැඩි වුව එවැන්නක් සිදුවූයේ පරිසරයට කිසියම් හෝ හානියක් සිදු නොවන පරිදිමය. නැතහොත් අවම වන පරිදිය.

මෙසේ පරිසර සංරක්ෂණය පිළිබඳ මිහිඳු මාහිමියන් විසින් දෙන ලද ප්‍රායෝගික පණිවුඩය ඒ අයුරින්ම ක්‍රියාත්මක වූයේ රටේ පාලකයා විසින් භූමියේ අයිතිකරු වෙනුවට එහි භාරකරු වශයෙන් ක්‍රියා කළ යුතු බවට උන්වහන්සේ විසින් කරන ලද ප්‍රකාශය පසුකාලීන රජවරුන් විසින් ඒ අයුරින්ම ක්‍රියාත්මක කිරීම හේතුකොටගෙනය. හතරවැනි මිහිඳු රජු විසින් තම මිහින්තලා සෙල් ලිපියෙහි "ගහ කොළ නොකැපිය යුතුය" යනුවෙන් ව්‍යවස්ථාවක් පනවා ඇත්තේ ඒ අනුවය. ඇළ දොළ, ගංගා, කඳුවැටි හා මිටියාවත්වලින් යුත්, හරිත වනාන්තරවලින් යුත් ශාන්ත, නිසංසල පරිසරයක් තුළ බුදුන් වහන්සේගේ පන්සාළිස් වසක ජීවිතයෙන් වැඩි කොටසක් ගෙවී ගියේය. "ආරණ්‍ය සේනාසනය රමණීයයි" යනුවෙන් සැරියුත් මහ තෙරුන් වහන්සේ විසින් ථෙර හා ථෙරි ගාථාවල එන උදාන වාක්‍යයන්ගෙන් ප්‍රකාශ වීමෙන් බවුන් වැඩීම සඳහා ආරණ්‍ය ජීවිතය අනුදැන වදාළ බවද පැහැදිලිය. බුදුන් වහන්සේ විසින් තම ශ්‍රාවකයන් හට සුදුසු වාසස්ථාන අතරින් එකක් ලෙස අනුදැන වදාළේ ගලින් නිම වූ ගුහාවය. භික්ෂූන් සඳහා සෙනසුන් ඉදිවූයේද වනාන්තර ගංගා අසබඩ නිම්න හා ගිරි කඳු අසබඩය. මෙම බෞද්ධ සංකල්පය අනුව භාවනානුයෝගී භික්ෂූන්ට කදිම පරිසරයක් මැවූ මිහින්තලා කඳු ගැටය මිහිඳු හිමියන්ට සිත් ගන්ට ඇත. මෙසේ වන සතුන්ට පමණක් නොව, ගහ කොළටද පොදුවූ අවිහිංසාව පදනම් කොටගත් බෞද්ධ ශිෂ්ටාචාරය රාජකීය අනුග්‍රහයද ඇතිව පසුකලෙක මුළු ලක්දිවම පැතිර ගියේය.

**මහාචාර්ය සරත් කොටගම**

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."

## උඩරට අමරපුර නිකායේ ශාසන ජෝතිකා කාරක සංඝ සභාවේ උපසම්පදාව ජූනි 23-24 දිනවල

**උඩරට** අමරපුර නිකායේ මධ්‍යම පළාත ශාසන ජෝතිකා කාරක සංඝ සභාවේ උපසම්පදා පුණ්‍යෝත්සවය ජූනි මස 23-24 දිනයන්හි පේරාදෙණිය ගන්නෝරුව සිරිමාවෝ සීමා මාලකයේදී පැවැත්වේ. උපසම්පදා අපේක්ෂක සාමණේරයන් වහන්සේලා වෙනුවෙන් ධර්ම පරීක්ෂණය ජූනි මස 23 වැනි දින පේරාදෙණිය සුබෝධාරාමයේදී පැවැත්වෙන බවත් උපසම්පදා විනය කර්ම කටයුතු උඩරට අමරපුර නිකායේ මධ්‍යම පළාත ශාසන ජෝතිකා කාරක සංඝ සභාවේ අනුනායක රාජකීය පණ්ඩිත සාහිත්‍යාචාර්ය අන්තරගම වජිරජෝති නාහිමි ප්‍රධානත්වයෙන් සිදුකෙරෙන බවත් කාරක සභික, අධිකරණ සංඝනායක මාතලේ විද්‍යානන්ද පරිවෙනාධිපති, ශාස්ත්‍රවේදී බටුගොඩ සංකිච්චායන නාහිමි සඳහන් කරති.

## දෙහිදෙණියේ රතනසාර නාහිමි ගුණ සමරු පින්කම ජූනි 17 වැනිදා

**අපවත්** වී වදාළ මල්වතු මහා විහාර පාර්ශ්වයේ කාරක සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික මැණික්දිවෙල ගනේමළුව පුරාණ විහාරාධිපති දෙහිදෙණියේ ශ්‍රී සිද්ධාර්ථ රතනසාරාභිධාන ඓතිහාසික වල්ගම්පාය රජමහා විහාරාධිපතීන් වහන්සේගේ වර්ෂ පූර්ණ ගුණ සමරු පින්කම ජූනි මස 17 වැනි දින මැණික්දිවෙල රජමහා විහාරයේදී පැවැත්වේ. මෙදින මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක හිමිවරු ප්‍රධාන මහා සංඝයා වහන්සේලා තිස්නමක් විෂයෙහි සපිරිකර සංඝගත දක්ෂිණාවක්ද පිරිනැමේ.

## මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතියේ සහ පුෂ්පදාන කාන්තා සමිතියේ නව නිලධාරීන්


**මහනුවර** ශ්‍රී පුෂ්පදාන සමිතියේ 2017-2018 වර්ෂය සඳහා පත්වූ නව නිලධාරී මණ්ඩලය මෙසේය:

ප්‍රධාන සභාපති - වෝල්ටර් රණසිංහ, ප්‍රධාන ලේකම් - වෝල්ටර් බණ්ඩාර, භාණ්ඩාගාරික - ටී. ගාමිණී සිල්වා, උප සභාපතිවරු - ගාමිණී ඒ. සිරිසේන, කේ. ඩබ්. පී. බී. කරඳවල, සරත් යටවර, උප ලේකම් - එම්. ආර්. ඒ. සිරිසේන, පුස්තකාලයාධිපති - එච්. ඒ. ඩබ්ලියු. හේවාවසම්. 16 දෙනකුගෙන් යුත් විධායක සභාවක්ද පත්විය.

පුෂ්පදාන කාන්තා සමිතියේ නව නිලධාරී මණ්ඩලය:

ප්‍රධාන සභාපතිනි - මයුරි බණ්ඩාර, ප්‍රධාන ලේකම් - හේමා නවරත්න, භාණ්ඩාගාරික - චන්ද්‍රවතී මැණිකේ, උප සභාපතිවරියන් - සී. බී. ඩබ්ලියු. ගුණතිලක, කාංචනමාලා නවරත්න, රමණී කරුණාතිලක, උප ලේකම් - සුනේත්‍රා ගීතානි. හත් දෙනකුගෙන් යුත් කාරක සභාවක්ද පත් කෙරුණි. සන්ධ්‍යා පෙරේරා, නන්දා හේමලතා, ඉන්ද්‍රා අමුණුගම, ශීලා රැද්‍රිගෝ, මංජුලා කුළුපන, ඉන්ද්‍රා නන්දනී, පද්මා කොඩිකාර.

## ඇතිපොල සද්ධර්ම කීර්ති ශ්‍රී ධර්මරක්ෂිත හිමිට කාරක සංඝ සභා පදවියක්



**අම්පිටිය** දළුක්ගොල්ල රජමහා විහාරය, උඩුනුවර කැලියැල්පිටිය පුරාණ විහාරද්වයාධිපති, මහනුවර මල්වතු මහා විහාරවාසී, උඩුනුවර සහ උඩපළාත ප්‍රධාන සංඝනායක ඇතිපොල සද්ධර්ම කීර්ති ශ්‍රී ධර්මරක්ෂිත බුද්ධරක්ඛිතාභිධාන හිමි මල්වතු මහා විහාර පාර්ශ්වයේ විංශත් වර්ගික කාරක මහා සංඝ සභාවේ කාරක පදවියට මල්වතු පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක ගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මාහිමිපාණන් විසින් පත්කර ඇත.

අම්පිටිය දළුක්ගොල්ල රජමහා විහාරාධිපතිව සිට අපවත් වී වදාළ පණ්ඩිත රඹුක්වැල්ලේ ධර්මරක්ෂිත නාහිමිගේ සහ අලුත්ම සීලරතන ලොකු හාමුදුරුවන්ගේ ආචාර්යත්වයෙන් 1984 පෙබරවාරි 26 වැනි දින පැවිදි බිමට ඇතුළත්ව වර්ෂ 1984 ජූනි 10 වෙනි දින ඓතිහාසික මල්වතු මහා විහාරයේ මංගල උපෝෂථාගාරයේදී උපසම්පදා ශීලයෙහි පිහිටුවනු ලැබූ ඇතිපොල බුද්ධරක්ඛිත හිමි දළුක්ගොල්ල රජමහා විහාරයේ ශ්‍රී ධර්මරක්ෂිත දහම් පාසලේ සහ කැලියැල්පිටිය පුරාණ විහාරයේ ශ්‍රී සෝභිත යන දහම් පාසල්වල ප්‍රධානාචාර්ය වශයෙන්ද, මාම්පිටිය ග්‍රාමෝදය මණ්ඩලයේ සභාපති වශයෙන්ද, ප්‍රදේශයේ දරු දැරියන්ගේ ධර්ම ඥානය දියුණු කිරීම් වස් කැපවීමෙන් කටයුතු කරන ධර්මධර, විනයධර, සුපේශල ශික්ෂාකාමී තෙර නමකි.


## වැලිවිට සරණංකර සාමණේරයෝ වාහලනාග නාමයෙන් උපසම්පදා ලබති



**අපවත්** වී වදාළ මල්වතු මහා විහාරවාසී, මල්වතු මහා විහාර කාරක මහා සංඝ සභාවේ කාරක සභික, ගඩලාදෙණිය ශ්‍රී සද්ධම්මතිලක රජමහා විහාරය, අල්ගම ශ්‍රී සංඝරාජ රජමහා විහාරය, වතුකන ශ්‍රී ශෛලගිරි රජමහා විහාරය, වැලිවිට ශ්‍රී සංඝරාජ පුරාණ විහාරය, කැලණිය බොල්ලෑගල මානෙල්වතු විහාරය යන විහාරයන්හි විහාරාධිපතිව වැඩ විසූ පණ්ඩිත, සාලියපුර ධර්මකීර්ති ශ්‍රී සරණංකර විපස්සි නායක හිමිපාණන්ගේ සහ කැලණිය බොල්ලෑගල මානෙල්වතු විහාරවාසී අල්ගම ශ්‍රී සංඝරාජ රජමහා විහාරාධිපති, ශාස්ත්‍රපති විල්ගමුවේ නන්දරතන හිමිගේ ශිෂ්‍ය, මහනුවර ශ්‍රී සංඝරාජ පිරිවෙනේ ධර්ම ශාස්ත්‍රය හදාරණ වැලිවිට සරණංකර සාමණේරයන් වෙසක් පුර පසළොස්වක පෝය දින මහනුවර මල්වතු මහා විහාරයේ ඓතිහාසික මංගල උපෝසථාගාරයේදී මල්වතු මහා විහාර පාර්ශ්වයේ ගෞරවාර්ය මහානායක තිබ්බටුවේ ශ්‍රී සුමංගල මාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යත්වයෙන් සහ ජ්‍යෙෂ්ඨ කාරක සභික නැහැණිවල ශ්‍රී පියදස්සි, කාරක සභික අඹන්වැල්ලේ ශ්‍රී සුමංගල යන හිමිවරුන්ගේ කර්මාචාර්යත්වයෙන් වාහලනාග නාමයෙන් උපසම්පදා ශීලයෙහි පිහිටුවනු ලැබීය. වැලිවිට සරණංකර හිමි, සුනිල් තිලකසිරි, බණ්ඩාර යාපාරත්න, කුසුමාවතී කුමාරිහාමි යන දම්පති යුවලගේ පුත්‍ර රත්නයකි.

**කේ. බණ්ඩාරනායක**

## හද්‍රානි මෙහෙණින් වහන්සේ වැඩ වසන ආරාමයට ඉඩමක්



**මහනුවර,** අම්පිටිය, තලපියන්නාව ශ්‍රී ගෞතරාමාධිපතිනි, ශාස්ත්‍රවේදී කහතුඩුවේ හද්‍රානි මෙහෙණින් වහන්සේ වැඩ සිටින ආරාමයට ඉඩමක් පූජා කිරීමේ ආගමික වැඩසටහනක් මහනුවර ශ්‍රී පුෂ්පදාන කාන්තා සමිතියේ හතරවැනි සංවත්සර උත්සවයට සමගාමීව ශ්‍රී පුෂ්පදාන සමිති ශාලාවේදී පැවැත්විණ. ආරාමයට ඉඩම පූජා කළ ශ්‍රී පුෂ්පදාන සමිතියේ භාණ්ඩාගාරික සහ මහනුවර බෞද්ධ සමිති කිහිපයකම නිලතල දරණ ගාමිණී සිල්වා මහතා විසින් ඉඩමේ ඔප්පුව සිල් මැණියන් වෙත පිරිනැමූ අවස්ථාව ඡායාරූපයේ දැක්වේ. ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී කේ. බණ්ඩාරනායක මහතා සහ එම මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම උත්සවයේදී පුෂ්පදාන සමිතියේ සභාපති වෝල්ටර් රණසිංහ මහතා සහ සභාපතිනි, වෛද්‍යචාරිනී මයුරි බණ්ඩාර, ඉන්ද්‍රාණි අමුණුගම යන මහත්මීන්ද කතා කළහ. ආරාධිත විශේෂ දේශනය විශ්‍රාමලත් පාඨශාලාචාරිනී කුමාරි බණ්ඩාරනායක මහත්මිය විසින් පවත්වන ලදී.

"යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදි පුබුදිත්."

# සදහම් ප්‍රහේලිකා අංක - 105

**ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773**

### උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ලිපිනය - සදහම් ප්‍රහේළිකාව (94), 112, දයාවංශ ජයකොඩි පොත් සමාගම, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදාන.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය ජූලි මස 08 වෙනිද බව සලකන්න.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේළිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | ද් | 2 | ■ | 3 | | 4 | ය |
| ■ | ■ | ර | ■ | ■ | ■ | | ■ |
| ■ | 5 | | 6 | ■ | 7 | | |
| ■ | | ■ | | ■ | 8 | රු | ■ |
| ■ | දෝ | ■ | 9 | 10 | 11 | ■ | 12 |
| ■ | 13 | | ■ | 14 | මා | 15 | |
| 16 | | ■ | 17 | | ■ | | |

### ► හරහට

1. සිදුහත් වහන්සේ තමාට ඉතාමත් සුදුසු යැයි සැලකූ නම.
3. අනුබුදු මිහිඳු හිමියන් සමග මිහින්තලාවට වැඩම කළ දූත පිරිසට අයත් කෙනෙකි.
5. සමනල අඩවියට අධිපති දෙවියන්.
7. ගොවි උපකරණයකි.
8. සොළොස් මහා ජනපදවලින් එකකි.
9. ද්‍රවිඩ ජාතිකයන් මේ නමින්ද හඳුන්වති.
13. රාශි දොළහින් එකකි.
14. ඉන්දියාවේ පිහිටි උසම කන්ද.
16. බිහිරි බව ඇතිවන ඉන්ද්‍රිය.
17. කන්ද උඩ රාජධානියට මේවා මහත් අලංකාරයක් ගෙන දෙයි.

### ▼ පහළට

2. මෙය උතුම්ම දානය ලෙසට සැලකේ.
4. බුදුන් වහන්සේව මේ නමින්ද හැඳින්වේ.
5. සිදුහත් කුමරුගේ පිය රජු.
6. අසූමහා ශ්‍රාවක මහා ස්ථවිරයන්ගෙන් කෙනෙකි.
7. විශ්වාස කටයුතු උපාසිකාවන් අතුරින් අග තනතුර ඉසිලූ මැණියන්.
10. ශ්‍රී ලක්දිව බුදු දහමේ උතුම් පණිවුඩය රැගෙන ආ හිමිපාණෝ.
11. අප කාගේත් ජීවිතවල මිහිරිම කාලය.
12. බුදු දහමේ අසාරම දෙය ලෙසට මෙය සැලකේ.
15. පුරාණ කාලයේ මිනිසුන් හඳ මත මේවා ඇතැයි විශ්වාස කළහ.

● **පසුගිය ප්‍රහේළිකා අංක 104 ජයග්‍රාහකයින්ගේ නම් ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න** - සංස්කාරක

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර දොළහකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සැම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

● අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න
www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# දළදා මාලිගයෙන් පණිවුඩයක්

● **මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න**

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඳ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

# ඌවට පෑයූ සඳමඬල වන් පූජ්‍ය ඇත්තලපිටියේ චන්ද්‍රවිමල නායක හාමුදුරුවෝ



ශ්‍රී ලංකා ද්වීපයෙහි පිහිටා තිබෙන පළාත් වශයෙන් ගත් විට එම පළාත් වලට ඈත අතීතයේ පටන් විවිධ වටිනාකම් ඇතුළත් වී තිබේ. ඒ අතරින් ඌවට හිමිවන්නේ අද්විතීය සුවිශේෂී ස්ථානයකි. අපේ ආදි කාලීන මුතුන් මිත්තන් මේ රට ආරක්ෂා කර ගැනීමේ දී පරිත්‍යාගයෙන් කටයුතු කළහ. ඒ අතරින් ඌව වෙල්ලස්ස ජනතාව සදානුස්මරණීයයි.

ඌව බණ්ඩාරවෙල ජන්ම ලාභය ලැබූ රත්නාක මුදියන්සේලාගේ සිරිබද්ධන තිළමේතුමාට හා රත්නායක මුදියන්සේලාගේ මද්දුම මැණිකා කුමාරිහාමි යන දම්පතීන්ට සුජාත අප කථානායකයන් වන පූජ්‍ය ඇත්තලපිටියේ චන්ද්‍රවිමල නායක හාමුදුරුවෝ ක්‍රි.ව. 1941 මැයි මස 11 වන දින ජන්ම ලාභය ලැබූහ. එතැන් පටන් වසර 14 ක් පමණ දෙමාපිය සෙවණේ ගත කරමින් පාසල් අධ්‍යාපනය ඉතා දක්ෂ ලෙස හැදෑරීය. බණ්ඩාරවෙල ඇත්තලපිටිය ශ්‍රී සුදර්ශන බෙත්තාරාම විහාරස්ථානය කේන්ද්‍ර කරගෙන දහම් අධ්‍යාපනය ඉතා විචක්ෂණව ගැඹුරින් අධ්‍යයනය කරමින් එවකට වැඩ වාසය කළ ඌව සබරගමුව දෙපළාතේ උප ප්‍රධාන සංඝනායක ගොරඩියකුඹුරේ විමලසාරනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පා සෙවණෙහි දහම් අධ්‍යාපනය ලැබුවේය.

තෙරුවන් කෙරෙහි අසීමිත සද්ධාමාමකත්වය ඇතිව කාලය ගත කරමින් සිටින අතරතුර පුරාකෘත පුණ්‍යබල මහිමය නිසා පැවිදි වීමට ඉතා ඕනෑකමක් ඇති විය. දෙමාපියන්ගේ අවසරය ඇතිව ඒ සඳහා විමලසාර නායක හාමුදුරුවන්ගේ ආචාර්‍යත්වය ඇතිව 1955 ඔක්තෝම්බර් මස 03 වන දින උතුම් වූ පැවිදි දිවියට පත්වූහ. එතැන් පටන් පැවිදි දිවියේ දී ධර්මඥානය අවබෝධ කර ගැනීම සඳහා පැවිදි ආචාර්යයන් වහන්සේලා යටතේ වාද්දුව, මොල්ලිගොඩ ප්‍රවචණෝදය පිරිවෙනින් මූලික අධ්‍යාපනය ලබා උසස් අධ්‍යාපනය සඳහා 1964 වර්ෂයේ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට ඇතුල්තව එහිදී ගෞරව උපාධිය ලබමින් ප්‍රාචීන විභාගයන්ගෙන් ද උත්තීරණව කටයුතු කරමින් සිටින අතරතුර සම්බුද්ධ ශාසනයේ ඉතා වැදගත් අවස්ථාවක් වන අධිශීල ශික්ෂා සංඛ්‍යාත උපසම්පදාවෙහි මහනුවර ශ්‍රී හයගිරි විජයසුන්දරාරාම මංගල උපෝසථාගාරයේ දී 1968 මැයි මස 19 දින පිහිටවූහ.

තමන් වහන්සේ ලැබූ ධර්මඥානය ලෝකයට බෙදා දීමේ අටියෙන් බණ්ඩාරවෙල දඹවින්න සුධර්මෝදය පිරිවෙනින් ආරම්භ කළ ධර්මශාස්ත්‍රීය සේවාව නාවෙල නමුණුකුල විද්‍යාලය, කිතල්ඇල්ලේ විද්‍යාලය, බණ්ඩාරවෙල ධර්මපාල විද්‍යාලය, ඇත්තලපිටිය මහ විද්‍යාලය, වටගමුව විද්‍යාලය යන විද්‍යාලවල දහස් සංඛ්‍යාත ගිහිපැවිදි ශිෂ්‍ය දරුවන්ගේ නැණ පහන් ආලෝකමත් කළහ. රටට, ජාතියට හා ආගමට වැඩදායී භික්ෂු ආකල්ප වලින් හෙබි ධර්මධර, විනයධර ප්‍රතිබල සම්පන්න භික්ෂු පිරිසක් ද ඇති දැඩි කලහ. උන්වහන්සේගේ සේවාවන් ඇගයීම වස් අස්ගිරි මහා විහාරයේ එවකට වැඩසිටි අතිගෞරවාර්හ ශ්‍රීමත් මහානායක මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන සානුනායක කාරක සංඝසභාව විසින් ඌව වෙල්ලස්ස දෙදිසාවේ උප ප්‍රධාන සංඝනායක පදවිය ද පිරිනැමූහ. 1996 වර්ෂයේ දී ගුරු සේවාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව නව විහාරස්ථාන ඉදිකරමින් ධර්මශාස්ත්‍රීය සේවාවෙහි යෙදෙමින් කාගේත් සිත් ඇදගන්නා ආකාරයට ජීවිත ස්වභාවය පිළිබඳව පොත් රාශියක් රචනා කර තිබේ.

ජීවිතයේ සැඳෑ සමය ගත කරන බණ්ඩාරවෙල ඇත්තලපිටිය ශ්‍රී සුදර්ශන බෙත්තාරාම, වටගමුව ශ්‍රී විමලගිරි විහාරය යන විහාරද්වයාධිපති ගෞරව ශාස්ත්‍රවේදී පූජ්‍ය ඇත්තලපිටියේ ධර්මකීර්ති ශ්‍රී විමලසාර චන්ද්‍රවිමලාභිධාන ඌව වෙල්ලස්ස දෙදිසාවේ උප ප්‍රධාන සංඝ නායක ස්වාමීන් වහන්සේ,

"යෝවවන්ත කසාවස්ස සීලේසු සුසමාහිතෝ
උපේතෝ දම සච්චේන සවේකාසාව මරහති"

(යම් කිසි ආර්ය ශ්‍රාවකයෙක් වමාරා දැමූ කෙලෙස් කසට ඇත්තේ වේ ද, සීලයෙහි මනාව පිහිටියේ වේ ද, ඉන්‍ද්‍රිය දමනයෙන් හා සත්‍ය වචනයෙක් යුක්ත ද, එබඳු කෙනෙකු ඒකාන්තයෙන් කසාවතට සුදුසු වේ.)

වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සීල වෘද්ධ, ගුණෝ වෘද්ධ, තපෝ වෘද්ධ, ඥාන වෘද්ධ, වයෝ වෘද්ධ ගුණයන්ගෙන් හෙබි, හිරි ඔතප් ඇති භික්ෂු ආකල්ප වලින් යුක්ත නායක හාමුදුරුවන් වහන්සේට ආශිර්වාද පතා මෙම මස 23 වන දින සිට පිංකම් මාලාවක් විහාරස්ථානයේ දී සිදු කෙරේ. උන්වහන්සේට දළදා වහන්සේගේ ආශිර්වාදයෙන් උතුම් වූ ලෝක ශාසනික සේවාවක් තවදුරටත් සිදු කිරීමට ශක්තිය, ධෛර්යය ලැබී, ශතවර්ෂාධික කාලයක් චිරජීවිනය ලැබේවායි ආශිර්වාද කරමු.

මල්වතු මහාවිහාරීය ශ්‍රී සංඝරාජ
මහපිරිවෙනේ නියෝජ්‍ය පරිවේණාධිපති
**පූජ්‍ය වේඩරුවේ ආනන්ද මූර්ති හිමි**

# පොසොන් සඳ පායලා

පුර සඳ සේ දිදුල නිලඹර තරු අතරේ
පෙර දා වැඩම කොට මිස්සක වන පවුරේ
ඉර සේ පසු වැ එළි කොට හල තිබූ අඳුරේ
සුර පුර මැවූ අනුබුදු හිමි ගුණ සැමරේ

තිස් සය යන නමින් අමතා හෙළ නිරිඳු
දිස් වුණු අඹ තලෙහි අනුබුදු හිමි සමිඳු
ඇස් ඇදහිය නොහැකි දසුනින් සිත් පැහැදූ
විස් මිත දෙයක් නොවැ කළෙ ජාතිය පිබිදූ

මුව පොව්වෙකු නසන්නට දුණු හී අමුණා
පව කට මුල පුරන්නට සිටි රජු දකිනා
නව රට සසුන් මැද මෙහි විත් මහ මෙවුනා
නව යුගයකට බිහි දොර හෙළි කර දුන්නා

අඩ සඳ කිරණ මැද පුන් පෝ දකින තුරු
දඩ කෙළියෙහි ඇවිද අපමණ සතුන් මැරූ
කුඩ ඔප් අතැර සේසත් රජ මැදුරෙ දුරූ
අඩ බැලු සැණින් අවි ගිලිහුණි පෙරුම් පිරූ

සුලු ඇත් පද සුතුර දෙසූ අඹ තලාවේ
සුලු මොහොතකින් රජු තිසරණ ගියාවේ
මුලු දීපයම සිරිලක බැබ ලුනාවේ
ගැලූ දම් දම් නදියෙ සත් දන කිමි දුනාවේ

රිසි සේ උසින් දාගැබ් පෙති පිළිම සැදූ
නිසි සේ කලා සාහිත රස විඳින මදූ
පවසේ සිටි දනට දම් දිය නිබඳ බෙදූ
අහසේ පොසොන් දා යළි පායලා සඳු

*රාජ්‍ය කලාභූෂණ, කිවිපති,*
*කවිධජ කාව්‍ය ශ්‍රී ස්වර්ණජෝති*
*ඩබ්ලිව්. කේ. සරත් විමලසිරි*



24 පිළිතුරු

## දහම් දැනුම - නිවැරදි පිළිතුරු

1. 1 - සියලු දේ ගැන සැක කළ යුතු බවයි.
2. 3 - මහා ප්‍රඥාවෙනි.
3. 2 - පටිසෝතගාමී.
4. 3 - මල්ලවයන්.
5. 3 - උපක ආජීවකයා
6. 2 - තමාට අනවශ්‍ය නිසා නොපිළිගන්නා බවයි.
7. 4 - "සබ්බේ තසන්ති දණ්ඩස්ස".
8. 1 - අත්තායි පතෙය්‍ය - නමිනි.
9. 2 - ද්‍රෝණ බමුණාට.
10. 2 - වීදාගම මෛත්‍රී.

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."

කිංසූකෝපම සූත්‍රය ඇසුරිනි

# නිවන් මග ඇත්තේ කොහේද?

ධර්මය අවබෝධ කර නොගත් එක්තරා භික්ෂුවක්, රහතන් වහන්සේලා සතර නමක් වෙත පිවිස, "මහණහුගේ දර්ශනය කෙතෙකින් සුවිශුද්ධ වේද? " යන ප්‍රශ්නය විමසූ කල්හී දුන් පරස්පර පිළිතුරු කෙරෙහි සතුටු නොවූ හෙයින්, භාග්‍යවතුන් වහන්සේ වෙත පිවිස, එම කාරණය සැලකරන ලදී. එවිට සර්වඥයන් වහන්සේ කැල ගසක් (එරබදු ගසක්) උපමා කොට, එම රහතන් වහන්සේලා දුන් පිළිතුරු නිවැදි බව සනාත කළ දේශනය කිංසූකෝපම සූත්‍රයේ (සං.නි.-බු.ජ. 4-368) සඳහන්ව ඇත.


කැල ගසක් (ඉන්දියාවේ ඇති එරබදු විශේෂයකි) නොදුටු පුද්ගලයෙක්, කැල ගස දක ඇති පුද්ගලයන් සිව් දෙනකුගෙන් කැල ගස කෙසේද? කියා විමසූ විට තමන් කැල ගස දක ඇති ආකාරය විස්තර කරයි. කැල ගස කලින් කලට වෙනස් ස්වරූපයන් ගනී. එසේ හෙයින් පළමු පුද්ගලයා කැල ගස දාගිය කණුවක් මෙන් කලුය ලෙස විස්තර කරයි. සමහර කාලවලදී කොළ හැලී පිළිස්සුණ කළු පාට දණ්ඩක්මෙන් කැල ගස දිස් වේ. දෙවන පුද්ගලයා 'කැල ගස මස් වැදල්ලක් මෙන් ලේ පාටය' ලෙස විස්තර කරයි. රතු පාට මලින් පිරී ගිය කාලවලදී කැල ගස ලේ පාට වන්නේය. තෙවන පුද්ගලයා 'කැල ගස මහරී ගසක් මෙන් පැලුණු කරල් ඇත්තේය, ගැලවුණු පොතු ඇත්තේය' ලෙස විස්තර කරයි. සමහර කාලවලදී කැල ගස අසිපත්වල කොපු මෙන් පැලුණු කරල් සහ පොතු ගැලී පවතී. සිව්වන පුද්ගලයා 'කැල ගස නුග රුකක් මෙන් ගන සෙවණ ඇත්තේය' ලෙස විස්තර කරයි. සමහර කාලවලදී කැල ගස කොළවලින් පිරී පවතින බැවින් නුග රුකක් වැනිය.

එසේ ඒ ඒ මොහොතේ කැල ගස දුටු පුද්ගලයා විස්තර කරනුයේ ඒ අවස්ථාවේ දුටු අයුරිනි. නමුත් පිළිතුරු වැරදි නැත. මන්ද? ඒ ඒ පුද්ගලයා කැල ගස දකින අවස්ථාවේ පැවති ස්වභාවයම ඔහු විස්තර කර ඇති බැවිනි. මෙලෙස ධර්මය අවබෝධ කරගත් රහතන් වහන්සේලා තම තමන්ගේ අවබෝධය විවිධ ආකාරයෙන් ප්‍රකාශ කර ඇත.

සිත පිරිසිදු කිරීමට නම් සියල්ල අවබෝධ කළ යුතුය. සර්වඥතා ඥානයෙන් අවබෝධ වන සියල්ල රහතන් වහන්සේ නමකට අවබෝධ කළ නොහැක. නමුත් අවිද්‍යාව සහ තණ්හාව දුරු කිරීමට අවශ්‍ය සියල්ල අවබෝධ



"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැගී යන්නෙකු වැනිය"



කළ යුතුය. මෙසේ පෙර කී රහතන් වහන්සේලා තම තමන්ගේ අවබෝධය පිළිවෙළින් මෙසේ වදාරණ ලදී.

භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති - පිරිසිදු වීමට නම් යම් භික්ෂුවක් ස්පර්ශ ආයතන සයෙහි සමුදය - අස්තඞ්ගමය කමටහන වඩා සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන මාර්ග ඵලවලට පත්වූ බැවින් තමන් පිරිසිදු වූ ක්‍රමය දේශනා කර ඇත. කන, නාසය, දිව, කය සහ මන ආධ්‍යාත්මික ෂඩායතනයි. මේවා ඇතිවී (සමුදය) ඇත්තේ වර්ණ, ශබ්ද, ගන්ධ ආදී බාහිර අරමුණු ගෙන විඳීමට ඇති කැමැත්ත හෙවත් තෘෂ්ණාව නිසාත්, ඇස ආදී ආයතන ජරා-මරණ කරා යන බව නොදන්නා අවිද්‍යාව නිසාත්ය. වර්තමානයේ නැවත එසේ තෘෂ්ණාවත්, අවිද්‍යාවත් ඇතිකර නොගත්තා නම්, නැවත සළායතන හට නොගනී. එනම් අස්තඞ්ගමය හෙවත් නිරෝධය සිදුවේ.

දෙවන රහතන් වහන්සේ රූප, වේදනා, සංඥා, සංඛාර සහ විඤ්ඤාණය යන පංච උපාදානස්කන්ධයාගේ ඇතිවීම සහ නැතිවීම හෙවත් උදය-ව්‍යය දැකීමෙන් නිවනට පත්වූ උත්තමයෙකි. එනම් රූපයේ ඇතිවීම අවිද්‍යාව, තෘෂ්ණාව, කර්මය, ආහාර, උත්පාද ලක්ෂණය ලෙස ප්‍රත්‍ය පස් ආකාරයකින්, වේදනා, සංඥා, සංඛාරවල ඇතිවීම අවිද්‍යාව, තෘෂ්ණාව, කර්මය, උත්පාද ලක්ෂණය, ස්පර්ශය ලෙස ප්‍රත්‍ය ආකාර පහ බැගින් සහ විඤ්ඤාණයේ ඇතිවීමට අවිද්‍යාව, තෘෂ්ණාව, කර්මය, නාමරූප, උත්පාද ලක්ෂණය ලෙස පස් ආකාර බැගින් පංච උපාදානස්කන්ධයේ ඇතිවීමේ ප්‍රත්‍ය විසිපහක අවබෝධයෙන් සහ ඉහත ඇතිවීමේ ප්‍රත්‍ය විසිපස් ආකාරය නිරෝධයෙන් වන පනස් ආකාරයක උදය-ව්‍යය අවබෝධ කරගෙන නිවන සාක්ෂාත් කළ බව දක්වේ.

තුන්වන රහතන් වහන්සේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන භූත රූපයන් සතරේ ඇතිවීම-නැතිවීම අවබෝධයෙන් නිවන සාක්ෂාත් කළ බව දක්වේ. මෙම ස්වභාව ධර්මයේ පවතින ශක්තීන් සතර වේගයෙන් වෙනස් වේ. එකිනෙක අතර ඇති සංකලනය සෑම මොහොතකදීම වෙනස් වේ. එබැවින් මේවායින් සෑදී ඇති සියලුම රූප වෙනස් වේ. එනම් රූප එක් ස්වභාවයක සිට තව ස්වභාවයකට පත්වන බැවින් එනම් විපරිණාමයට පත්වන බැවින්, තමන්ගේ යැයි ගැනීමට යෝග්‍ය නොවේ. එනම් සියලුම රූප අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව අවබෝධයෙන් විශුද්ධිය ලැබිය හැකි බව දක්වේ.

සිව්වන රහතන් වහන්සේ සියලු ධර්මයන් හේතු-ප්‍රත්‍ය නිසා හටගන්නා බවත් හේතු-ප්‍රත්‍ය නිරුද්ධවීම නිසා නැසීම සිදුවන බවත් යථාභූතව අවබෝධ කරගෙන නිර්වාණය සාක්ෂාත් කළ උත්තමයෙකි. එනම් පටිච්චසමුප්පාදය අවබෝධයෙන් උන්වහන්සේ යථාර්ථය අවබෝධ කරගෙන ඇත. පෙර අවිද්‍යාව නිසා සකස් කළ සංස්කාරය ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ, නාම-රූප, සළායතන, ඵස්ස, වේදනා යන ඵලය හෙවත් විපාකය ඇතිවී ඇති බවත්, එම බලය නැවත දූන් අවිද්‍යාවෙන් ප්‍රත්‍යක්ෂ නොකර ගතහොත් නැවත ඵලයක් (විපාකයක්) ඇති නොවන බවත්, අවබෝධයෙන් ඇතිවන තැනම නැතිවන බව දන්නා යථාභූත ඥානය ඇති වී නිවන වන බව දක්වේ.

භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්න අසන භික්ෂුවට තවදුරටත් ධර්මය අවබෝධ වන පරිදි උපමා උපමේය ඇසුරින් ධර්මය දේශනා කළ සේක. අවසානයේ භික්ෂුව සෝතාපන්න විය.

භාග්‍යවතුන් වහන්සේගේ අවවාදය වන්නේ නිවන් අවබෝධ කරන ලෙසයි. නමුත් අප ශරීරය නමැති නුවර පංච නීවරණයන් නමැති පාප මිත්‍රයන් සිටින නිසා, සිතේ යථාභූත ඥානය ඇති නොවේ. එබැවින් සමථය වඩා නීවරණ පහ කරමින් පළමු, දෙවන, තෙවන, සිව්වන ආදී ධ්‍යාන ඇති කරගෙන, ඒ තුලින් විදර්ශනාව වඩවා යථාර්ථය අවබෝධ කළ යුතුය. මේ සඳහා සිහිය පැවැතිය යුතු අතර, ආර්ය අෂ්ටාංගික මාර්ගයම භාවිත කළ යුතු වේ. නිවන අවබෝධයේදී සමථයත්, විදර්ශනාවත් දෙකම අත හැරේ. අවබෝධයෙන්ම අත හැරේ.

මේ අනුව බුදුපියාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය අවබෝධ කරගැනීමේ ක්‍රම බොහොමයක් ඇත. ඒ අනුව ගමන් කරමින් නිර්වාණයම සාක්ෂාත් කරගැනීමට වීර්ය වඩමු.

**පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි**